ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 ජූලි 12 වන බදාදා
3 කාණ්ඩය 32 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක්
## නොමිලේ

නැකැත් බලා
එල්ලුම් ගස් ගිය
කඩුගන්නාවේ
තැපැල්
බෝම්බකරුගේ
කතාව

කාලි
මෑණියන්ගේ
හැඩ රුවින්
යුතු
රූමතියක්
නිකවැරටියේ

නිවසේදීම
අත්බෙහෙත්
හදාගන්න
ක්‍රම සමඟින්
හොරිවිල
වෙද මහත්තයා
මේ සතියේ සිට
ධරණී පිටු අතරට

පිරිමි
වැඩිපුර
කැමති
ගෙම්බියන්
වැනි
ගැහැණුන්ටලු

ව්‍යවසායිකා
නදීශා
මධුෂානි
ඡායාරූපය - ක්‍රිෂාන් කාරියවසම්

# අපේ චමරි ලෝකෙන්ම එකට




පසුගියදා ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමට ක්‍රිකට් පිටියේ ඓතිහාසික ජයග්‍රහණයකට උරුමකම් කියන්නට හැකි විය. ඒ ඉතිහාසයේ පළමුවරට නවසීලන්තයට එරෙහිව එක්දින තරගාවලි ජයක් ලබමිනි. තරග තුනකින් සමන්විත වූ එම එක්දින ක්‍රිකට් තරගාවලිය ශ්‍රී ලංකා කණ්ඩායම ජයග්‍රහණය කළේ තරග 2-1 ක් ලෙසිනි. බැලූ බැල්මට එම ජයග්‍රහණයට හේතුවූයේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නායිකා චමරි අතපත්තුගේ සුපිරි පිතිහරඹයයි. ඇය තරගාවලිය පුරාවටම ලකුණු 248ක් ලබාගත්තේ ශතක දෙකක්ද සමඟිනි. ඒ දක්ෂතාවය හේතුවෙන් එක්දින පිතිකරු ශ්‍රේණිගතකිරීම්වලට අනුව ලෝකයේ අංක එකේ පිතිකාරිනිය වෙන්නට චමරි අතපත්තු සමත්විය. එය සැළකෙන්නේ මෙරට ක්‍රීඩිකාවක් එලෙසින් ප්‍රථම ස්ථානයට පත්වූ පළමු අවස්ථාව ලෙසිනි.

"ඇත්තටම ලෝකයෙන්ම අංක එක වෙන්න පුළුවන් වුණු එක ගැන මට ගොඩාක් සතුටුයි. මං හිතන්නේ ඒක මගේ තනි උත්සාහයක් නෙමෙයි. ඒ පිටිපස්සේ ගොඩාක් අය ඉන්නවා. ඒක නිසා මේ අරගත්ත ජයග්‍රහණය අපේ රටේ හැමෝටම අයිති එකක් කිව්වොත් හරියටම හරි."

ඒ චමරි අතපත්තු ඇය ලබාගත් ජයග්‍රහණය වචන කළ හැටිය. මේ දක්වා ශ්‍රී ලංකා කණ්ඩායම ජයග්‍රහණ කර ඇති තරග දෙස බැලුවොත් ඒකී ජයග්‍රහණය බොහෝමයක් පිටුපස ඇත්තේ චමරිගේ පිත්තය. ඇතැම් ක්‍රිකට් විචාරකයින් ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් සහ චමරි අතපත්තු යනු දෙකක් නොව එකක් කියන්නේ ඒකය.

"මට මේ ජයග්‍රහණයට ගොඩාක් අයගේ සහාය ලැබුණා. ඒ අතරින් අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, පුහුණුකරුවන්, මගේ කණ්ඩායමේ සමාජිකාවන්, දෙමව්පියෝ වගේම යාළුවෝ මතක් කරනවා. ඒත් එක්කම ලංකාවේ ක්‍රිකට් ප්‍රේක්ෂකයෝ ආදරෙන් මතක් කරන්න ඕනේ. මොකද මං ක්‍රිකට් පිටියේ සාර්ථක වුණු අසාර්ථක වුණු හැම මොහොතකම ඔවුන් මගෙත් එක්ක හිටියා. ඒකයි මං මුලින් කිව්වේ මේ ජයග්‍රහණය මට විතරක් අයිති එකක් නෙවෙයි කියලා."

වමත් පිතිකාරිනියක් මෙන්ම දකුණත් දඟපන්දු යවන්නියක් ලෙසින් චමරි තුන් ඉරියව් දක්ෂතාවලින් හෙබි ක්‍රීඩිකාවකි. 2010 අප්‍රේල් 10 වැනිදා බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමට එරෙහිව ජාත්‍යන්තර ක්‍රිකට් වරම් ලබාගත් ඇය ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් මේ ගෙවා දමන්නේ 13 වැනි වසරය. මෙම වසර 13 පුරාවට චමරි එක්දින තරග 95ක් ක්‍රීඩා කර ඇති අතර එහිදී ලකුණු 3199ක් ලබාගෙන තිබේ. ඊට ශතක 8ක් සහ අර්ධ ශතක 15ක් ඇතුළත් අතර ලෝක එක්දින ක්‍රිකට් පිටියේ සිව්වැනි වැඩිම ශතකලාභිනිය වන්නේද ඇයයි. ඒ අතර 2017දී ඕස්ට්‍රේලියාවට එරෙහිව නොදැවී ලබාගත් ලකුණු 178 චමරිගේ හොඳම ඉනිම වේ.




"ක්‍රීඩකයෙක් ක්‍රීඩිකාවක් ගත්තම ඒ අයට හැමදාම ක්‍රීඩා කරන්න බෑ. කවදහරි අයින්වෙන්න වෙනවා. මටත් ඒක පොදුයි. ඒත් මට ඕනේ මං අයින්වෙන්න කලින් අපිට හොඳ කණ්ඩායමක් හදලා අයින් වෙන්න."

ඒ තාමත් ක්‍රිකට් පිටියේ හයිරංපාන චමරිගේ බලාපොරොත්තුවයි. ඉතින් ලෝක ක්‍රිකට් පිටියේ අංක එකේ එක්දින පිතිකාරිනිය වූ චමරි අතපත්තුට 'ධරණී' අපිත් හදවතින්ම සුබ පතමු.

■ රුවන් එස්.සෙනවිරත්න

අලි කතා



තොරතුරු
**රණවීර ගමගේ ගුණසිරි**
(සෙවණගල)

# ගැහැනු ගෙට කර හොරකමේ යන අලි ඉලන්දාරියෝ

අලි ඇතුන් විනයගරුක ලෙස හැසිරෙන්නේ පෙරහරේ යද්දී පමණක්ම නොවේ. සොරකමේ යද්දීද ඔවුන්ට විනයක් ඇත. එමෙන්ම එහිදී අනුගමනය කරන රීති පද්ධතියක්ද ඇත. සොරකමට සම්බන්ධ වන්නේ පිරිමි අලි පමණි. අලි ගැහැනු සහ අලි ළමෝ එම දුරාචාරයට සහභාගි නොවෙති.

කැලෑ අලි ඇතුන් පිළිබඳ අප්‍රමාණ අත්දැකීම් ඇති සෙවණගල ගුණසිරිටද කැලයෙන් පිටතදී වැඩිපුරම හමුවී ඇත්තේ වැඩුණු පිරිමි සතුන්ය. අලි වැට බලමින් එහෙට මෙහෙට යන ඔහුට වගාවට කඩා වැදුණු අලියෙක් කැලයට යැවීම ඒ හැටි අමාරු දෙයක් නොවේ. දින කිහිපයක් ඔහු තරමක් වෙනස් අත්දැකීමකට මුහුණ දුන්නේය. එකම තැනකින් වැට කඩා උක් වගාවට පනින දැවැන්තයෙක් ඔහුට හමුවිය. කොපමණ කළත් උන්දෑගේ පැමිණීම වැළැක්වීමට නොහැකිය. සති දෙකක පමණ කාලයක් මේ සෙල්ලම ක්‍රියාත්මක විය. ඒ සෑම දිනකම ගුණසිරි අලියා පන්නා වැට පිළිසකර කළේය. වැට පැනීම ගැන අලියාට මෙන්ම වැටේ එකම තැන සෑදීම ගැන ගුණසිරිටද ප්‍රවීණත්වය ලැබූ සෙයකි. දෙදෙනාගේම ක්‍රියාව නිමක් නැත. ගුණසිරිද මේ කාරණයට හොඳටම හුරුව සිටියේය.

සුපුරුදු පරිදි තවත් දිනක් අලියා වැට පැන්නේය. හිතුවක්කාරයා පලවා යැවීමට ඉන්නා තැන සොයාගත යුතුය. ගුණසිරි හොඳින් ඇහුම්කන් දුන්නේය. සද්දය ඇසෙන්නේ එක තැනකින් නොවේ. වමෙන්ද දකුණින්ද ඉදිරියෙන්ද පිටුපසින්ද වගා හොරුන්ගේ සද්ද ඇසෙයි. ගුණසිරිට කිසිවක් සිතාගැනීමට නොහැකි විය. තමන්ගේ දේපළක පල නෙළාගැනීමට පැමිණි අය මෙන් සමූහයක් රාජකාරි අරඹා ඇති බව ගුණසිරිට පෙනී ගියේය. සති දෙකක් පමණ ඔත්තු බැලීමෙන් පසු අලියා සිය සනුහරේ තවත් සගයින් කැඳවාගෙන පැමිණ ඇත. විදුලි පන්දමත් අතට ගත් ගුණසිරි ට්‍රැක්ටරයේ වහලට නැඟී ඔවුන්ව නිරීක්ෂණය කළේය. පසුව අලි වෙඩි කිහිපයක්ද එල්ල කළේ රෑනම පලවා හරින අරමුණෙනි. එහෙත් කිසිවකු පසු බසින පාටක් නැත. එදින මධුවිතෙන්ද මදක් සප්පායම්ව සිටි ගුණසිරි ඕනෑ එකක් කියා අලි වෙඩි දෙකක්ද රැගෙන ට්‍රැක්ටරයෙන් බැස උක් වගාවට ඇතුළු විය. ටික දුරක් ගමන් කර නැවතුණු ගුණසිරි යළි හඬ විමසා බැලීය. ඔහුගේ ගමන අළු ගොඩට පිඹීමක් වැනි අනුවණකමකි. දෙපසින්ද ඉදිරියෙන්ද අලි තිදෙනෙකි. ඔවුන් සහ තමා අතර පරතරය මීටර පහ හයකට වැඩි නොවේ. කරන්නට දෙයක් සිතාගත නොහැකි වූ ගුණසිරි අලි වෙඩිල්ල පත්තු කර උඩට විසි කර දිව්වේය. උක් දඬු සහ පත් අතරින් දිවීම දඬුවමක් වැනිය. අත් පා කැපෙද්දී දිව ගොස් ට්‍රැක්ටරයට ගොඩ වූ ඔහු අලි යන මඟ දෙස බලා සිටියේය. කලින් වෙඩිවලට කලබල නොවූවද මෙවර පිරිස කලබල වී ඇත. සියල්ලන් දුවනු ඇසේ. ට්‍රැක්ටරයේ විදුලි ලාම්පු එළියෙන් ගුණසිරි අලි දිවිල්ල නැරඹීය. ඒ රැහේ වයස අවුරුදු දෙකක පමණ අලි බබෙකි. පැටවා වලිගයද හකුලාගෙන දිව්වේය. සෙසු සියල්ලෝ එකා පසුපස එකා වැටී දිව්වෝය. පොරකෑමක් නැත. උද්‍යසන රැස්වීමට යන්නාක් මෙන් සියල්ලන් එක පෙළටය. එනිසා ගුණසිරිට අලි ගණන් කිරීමටද හැකිය. කලක් තිස්සේ සොරා කෑ පළපුරුදුකාරයාට අමතරව තවත් හයදෙනෙකි. ගුණසිරි තනිව එළවා ඇත්තේ අලි හත්දෙනෙකුගේ නඩයකි. එදින පැන ගියද ඔවුන්ගේ පැමිණීම නැවතුණේද නැත. ඒ උක් වගාවේ රස හොඳින්ම හඳුනාගත් නිසා විය හැකිය.

■ රජනිකා ලියනගේ



# අනිත් නිවුන් දරුවා සෙල්ලම් කරද්දි මේ දුව බලාගෙන ඉන්නවා

## ඔලුව බර නිසා එයාට ඇඳෙන් බහින්න බෑ

**ආසිංසා දෙව්මිණි**





දරු සම්පතක් කියන්නේ අම්මා කෙනෙක්ට මහමෙරක්. එක දරුවෙක් නෙමෙයි කුස ඇතුළේ දරු දෙන්නෙක් ඉන්නවා කියලා දැනගත්තහම අම්මලාගේ ඒ සතුට දෙගුණ තෙගුණ වෙනවා. හැබැයි ඉතින් නිවුන් දරුවෝ කුසට ආවාම ඒ විදියට සතුටු වෙන්න බැරි අම්මලාත් ඉන්නවා. මොකද දරු දෙන්නෙක් කුසේ ඉන්දැද්දි ඇතිවෙන සංකූලතා නිසා එක් දරුවෙක් රෝගීවෙලා අනිත් දරුවා නීරෝගී විදියට ඉපදෙන අවස්ථාත් නැතුවම නෙවෙයි.

දැනට අවුරුද්දකට කලින් ඔස්ට්‍රේලියාවේ කැන්බෙරා ප්‍රාන්තයේත් එහෙම සිදුවීමක් වුණා. ඒ අම්මට නිවුන් දරුවන් විදියට ලැබිලා තිබුණේ නිරෝගී දියණියක් සහ රෝගී පුතෙක්. කාන්තාව කාලයක් තිස්සේ රෝගී දරුවව නොසලකා හැරලා, නිරෝගී දරුවව විතරක් රැකබලාගෙන තියෙනවා. මේ සිද්ධිය නිසා ඇයට සිරගතවෙන්න පවා සිද්ධ වුණා.

කුසේදි පෝෂණය එක් දරුවෙක්ට විතරක් ලැබීම නිසා  බොහොම කලාතුරකින් නිවුන් දරු දෙන්නගෙන් එක් අයෙක් මියයන අවස්ථාත් තියෙනවා.

එක දරුවෙක් මැරුනේ අනිත් දරුවා නිසා කියලා හිතලා ඉතිරි වෙන දරුවට වෙනස්කම් කරපු අම්මලා ගැනත් වාර්තා වෙලා තියෙනවා.

ඔය වගේ කතා අස්සේ මේ කියන්න යන්නේ සංකූලතා සහිත නිවුන් දරුවව රැකගන්න දුක් විඳින උතුම් මව්හත් ගුණැති අම්මා කෙනෙක් ගැන. ඇය ජාඇල පමුණුගම ලක්ෂිකා ද සිල්වා.

"නිවුන් බබාලා ඉපදෙන්න ඉන්නවා කිව්වහම මට වගේම මහත්තයාටත් ගොඩක් සතුටු හිතුණා. බඩේ ඉන්නේ දුවලා දෙන්නෙක් කිව්වහම ඒ දෙන්නටම අවශ්‍ය කළමනා වෙන වෙනම ලෑස්ති කරගෙන ආසාවෙන් බලාගෙන හිටියා. බබාලා දෙන්නට මාස හතක් වෙද්දි එක බබෙක්ගේ ඔලුව ලොකුයි කියලා දොස්තර මහත්තුරු කිව්වා. එදා ඉඳලා දරු දෙන්නා හම්බෙනකල්ම අපි ගිනි පත්තු වෙවී තමයි හිටියේ."

2020 නොවැම්බර් 19 වැනිදා පුංචි පැටව් දෙන්නා ඉපදිලා. නිවුන් සංකූලතා නිසා එක දුවෙක්ට හයිඩ්‍රොකැප්ලස් (Hudorocephalous) කියන ලෙඩේ. මේ ලෙඩේදි වෙන්නේ මොළේ කුහරවල වතුර පිරෙන එක. වතුර පිරීමත් එක්ක බබාගේ ඔලුව ප්‍රමාණාත්මකව විශාල වෙනවා.

"ලෙඩේ තියෙන දුවගේ නම ආසිංසා දෙව්මිණී. ඉපදුණු දවසේ ඉඳලම දරුවගේ ඔලුව ලොකුයි. එයාගේ ඔලුව ගලක් වගේ බරයි. සමබර නැහැ. ඒ නිසා ඔලුව කෙළින් තියාගෙන ඉන්න බැහැ. ඉපදිලා මාසෙකින් වගේ දුවගේ නළල සිදුරු කරලා ඇඟ ඇතුළට උපකරණයක් දැම්මා. ඒක දැම්මහම ඔලුවේ වතුර බඩට යනවා කියලයි කිව්වේ. ඒත් ඒකෙන් කිසිම වෙනසක් වුණේ නැහැ. පස්සේ මාස තුනකින් ආයෙත් කන ළඟින් සිදුරු කරලා ඇඟ ඇතුළට උපකරණයක් දැම්මා. තාමත් දුවගේ ඇඟේ ඒ මැෂින් එක තියෙනවා. ඒකෙනුත් වෙනසක් තියෙනවා කියන්න බැහැ. වෙන දරුවෝ මාස 4න් වගේ පෙරළෙනවා, ඔලුව උස්සනවානේ. මෙයාට පෙරළෙන්න ගොඩක් කල් ගියා. දුවට දැන් අවුරුදු 2 1/2ක්. දරුවා ඔලුව ටිකක් හරි ඉසසුවේ මේ මෑතකදී."

නිවුන් සංකූලතා නිසා ආසිංසා දුවට කතා කරන්න ටිකක් අමාරුයිලු. ඒ වගේම දරුවගේ කල්පනාව අඩු ගතියකුත් තියෙනවා කියලයි අම්මා ලක්ෂිකා කියන්නේ. තමන්ගේ දරුවා මේ විදියට දුක් විඳින එක ඉවසගන්න බැරි තැන ලක්ෂිකා දුව වෙනුවෙන් එක එක ප්‍රතිකාර ක්‍රම අත්හදාබැලුවලු. ඒ වෙනුවෙන් තිබුණු හැම සතේම වියදම් කළාලු.

"කිසිම තැනකින් දරුවට සුවයක් ලැබුණේ නැහැ. මීට මාස කීපයකට කලින් මට අනුරාධපුරේ වෙද නෝනා කෙනෙක් ගැන අහන්න ලැබුණා. ඇය රජයේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරියක්. ඒ වෙද නෝනා මේ වගේ ඔලුවේ වතුර පිරෙන දරුවෝ සෑහෙන දෙනෙක් සුව කරලා තියෙනවා කියලයි ආරංචි වුණේ. ඉතින් අපිත් දරුවට එතැනට අරගෙන ගියා. වෙද නෝනා ගාවට යද්දි දුවට ඉඳගන්න කරන්න මොකුත් බැහැ. එතැනට ගිහින් මාස තුනෙන් දුව තනියම ඉඳගන්න පටන්ගත්තා. ප්‍රතිකාර නිසා සමහර විට දරුවගේ ඔලුවේ වතුර අඩුවෙලා එයාට බර දැනෙනවා අඩු ඇති."

මේ කියන වෛද්‍යවරියගෙන් ආසිංසා දුවව සුව කරගන්න පුළුවන් කියලා අම්මට ලොකු විශ්වාසක් තියෙනවා. ඒත් දිගටම මේ ප්‍රතිකාරවලට යන්න පුළුවන් වෙයිද කියන එකලු ඇයට තියෙන එකම බය.

"මාසෙකට සැරයක් දුවව අනුරාධපුරේ එක්කරගෙන යන්න ඕනේ. බෙත්හේත් වාහන වියදම්වලට 25000ක් විතර වැය වෙනවා. මගේ මහත්තයා කරන්නේ කුලී රැකියාවක්. ඉතින් එයාට ලොකු වැටුපක් ලැබෙන්නේ නැහැ. අපි ඉන්නෙත් කුලී නිවසක. තව ඉස්කොලේ යන පුංචි පුතෙකුත් ඉන්නවා. ඉතින් දරුවගේ බෙහෙත්වලට මාසිකව ඒ වගේ මුදලක් හොයාගන්නේ හරිම අමාරුවෙන්."

අමාරුවෙන් හරි සල්ලි හොයාගෙන තව ටික කාලයක් ප්‍රතිකාර කළොත් පුංචි ආසිංසා දුවට හොඳටම සනීප වෙලා අනිත් පැටියා වගේ දුවලා පැනලා සෙල්ලම් කරයි කියලයි අම්මා කියන්නේ.



"අනිත් නිවුන් දරුවා සෙල්ලම් කරද්දි මේ දුව බලාගෙන ඉන්නවා. ඔලුව බර නිසා එයාට ඇඳෙන් බැහැලා ඔලුව කෙළින් තියාගෙන සෙල්ලම් කරන්න බැහැනේ. දුව තව ටිකක් ලොකු වෙන්න කලින් මේ ලෙඩේ හොඳ කරගන්නයි අපිට ඕනේ. නැත්නම් දුවට ඉගෙනගන්න, අනාගතයක් ගැන හිතන්නත් කිසි දෙයක් කරගන්න බැරිවෙයි."

අම්මලා දරුවෝ හදන්නේ ඒ දරුවන්ගේ අනාගතේ ගැන හීන පොදියක් තියාගෙන. ඉතින් ආසිංසා දුවට ඔලුව කෙළින් තියාගෙන ලස්සනට ජීවත්වෙන්න පුළුවන් හෙටක් හදලා දෙන්න කැමති උතුම් හදවත් ඇත්තෝ මුණගැහේවි කියන බලාපොරොත්තුවෙනුයි අපි මේ ලිපිය ලිව්වේ.



"සාමාන්‍ය දරුවෙක් විදියට ජීවත්වෙන්න මගේ දරුවට පිහිටක් වෙන්න පුළුවන් නම් ලොකු පිනක්. දුවට දිගටම ප්‍රතිකාර කරන්න සල්ලි හොයාගන්න බැරිවුණොත් දරුවට හැමදාම මේ විදියට ජීවත්වෙන්න වෙයි."

ලක්ෂිකා දරුවා වෙනුවෙන් උදව් ඉල්ලුවේ කඳුළු සලන ගමන්. දරු සෙනෙහස දැනෙන මව් කෙනෙක් පිය කෙනෙක් නම් දරුවා වෙනුවෙන් හඬාවැටෙන මේ අම්මා වෙනුවෙනුත් පිහිටක් වෙන්න කියන එකයි අපෙත් ඉල්ලීම. 0718808337 ලක්ෂිකා අම්මගේ දුරකතන අංකය.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# පැරිෂුට් එක දිගෑරුනේ නැත්තම් වැටිලා මැරෙයි නේද කියලා ගොඩක් අය ඇහුවා

## නාවික හමුදාවේ පැරිෂුට් ශූරියෝ ධරණී ට කී කතා

මොන වැඩ රාජකාරි තිබුණත් පෙබරවාරි මාසෙ 4 වැනිදා උදේ පාන්දර එක්කො ගෙදර රූපවාහිනිය ඉස්සරහා හරි නැත්නම් ගාලු මුවදොර පිටිය ඉස්සරහා හරි පෙලගැහෙන්න අපේ උදවිය හරි රුසියෝ. ඒ වෙන කාරණාවක් නිසා නෙවෙයි අපේ රටට නිදහස ලැබීම සමරන නිදහස් උත්සවය සියැසින් දැකබලාගන්න තියෙන උනන්දුව නිසා. එයිනුත් අපේ ඇය වැඩිපුරම කැමති ත්‍රිවිධ හමුදාවේ කෙල්ලො කොල්ලො ටික අහස, පොළොව, මුහුද කියලා සීමාවක් නැතුව පෙන්වන වැඩකිඩ ටික බලාගන්න. අඩි දහස් ගාණක් උඩ ඉඳන් පැරිෂුට් ආධාරයෙන් බිමට පනින අපේ විරුවන්ගේ සංදර්ශන දකිද්දී ඕනෑම කෙනෙක්ගේ ඇඟේ ලොමු ඩැහැගැන්වෙන එක ඉතින් අහන්න දෙයක් නෙවෙයි. හැබැයි යුද, ගුවන්, විශේෂ කාර්ය බලකා සහ පොලිස් නිලධාරීන්ට වගේම නිලධාරිනියන්ටත් පැරිෂුට් පුහුණුව ලබාදීලා තිබුණට මෑතක් වෙනකම් නාවික හමුදා නිලධාරිනියන්ට ඒ අවස්ථාව ලැබිලා තිබුණේ නැහැ.

ඒ නිසා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මැතිතුමාගේ සංකල්පයකට අනුව පහුගිය අප්‍රේල් මාසෙදි ඔවුන්ටත් ඒ අවස්ථාව ලබාදීමට නාවික හමුදාව කටයුතු කරලා තිබුණා.

ඒ අනුව නාවික නිලධාරිනියන් හයදෙනෙක් ඉල්ලුම් කරලා තිබුණත් අවසාන පුහුණුවට යන්න අවස්ථාව ලැබිලා තිබුණේ ඉන් නිලධාරිනියන් පස්දෙනෙකුට විතරයි.

ඒ ලුතිනන් ඉරේශා මදුශානි, ලුතිනන් ප්‍රසාදි නදීශානි, බලකාන්තා ශාරීරික අභ්‍යාසක අයේශා විජේරත්න, සාමාන්‍ය කාන්තා නැවි මහීශා රණසිංහ සහ සාමාන්‍ය කාන්තා නැවි කෞශි පෙරේරා කියන නිලධාරිනියන්.

වැඩේ කියන්නේ ලොකු වැඩ කළාට මේ පස්දෙනාම අවුරුදු 20-35 අතර හුරුබුහුටි තරුණියන්.

අඩි දහස් ගණනක් උඩ ඉඳන් පනිනකොට නිකමටවත් අත්වැරදීමක් සිද්ධ වුණොත් වෙන දේ ගැන ආයේ අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ. හැබැයි ඒ අවදානම් කිසිවක් නොතකමින් කිරිල්ලියන් සේ ඉහළ අහසේ දක්ෂකම් පාන මේ තරුණ නිලධාරිනියන් පස්දෙනා එක්ක කෙටි කතාබහක නිරතවෙන්න පහුගිය දවසක අපිට අවස්ථාව ලැබුණා.

තාත්තාගේ සහ අයියාගේ අඩිපාරේ යමින් නාවික හමුදාවට බැඳුණු අනුරාධපුරේ අයේශාට නම් පැරිෂුට් පුහුණුව ඒ තරම් අභියෝගයක් නොවුණු බවයි ඇය කිව්වේ.

"මගේ තාත්තා විශ්‍රාමික යුද හමුදා සෙබළෙක්. අයියත් දැනට ක්‍රියාන්විත සේවයේ නිරතවෙලා ඉන්නවා. ඒ නිසා පුංචි කාලේ ඉඳලම මටත් නේවි එකට යන්න ලොකු ආසාවක් තිබුණා. ගෙදරින් කිසිම විරුද්ධත්වයක් තිබුණෙත් නැහැ. හැබැයි හමුදා පුහුණුව ගැන දන්න නිසා තාත්තා නම් කිව්වේ යනවා නම් ආයේ අමාරුයි කියලා අතරමගදි හැරිලා එන්න බලාගෙන යන්න එපා කියලා. ඊටපස්සෙ මම උසස් පෙළ ඉවරවුණ ගමන්ම පූනෑවේ නාවික හමුදා කඳවුරේ සම්මුඛ පරීක්ෂණවලට ගිහින් මුලින්ම 2013දී ආධුනික කාන්තා නැවියෙක් විදියට නාවික හමුදාවට බැඳුණා. එතකොට මට අවුරුදු විස්සයි."







දැන් තිස් හැවිරිදි වියේ පසුවන අයේශා අද වනවිට නාවික හමුදාවේ වසර දහයක පළපුරුදුකාරිනියක්. නාවික හමුදාවේ ශාරීරික අභ්‍යාස අංශයේ පුහුණු උපදේශකවරියක් ලෙසද කටයුතු කරන ඇය පැරිෂුට් පුහුණුව ගැන කිව්වේ මෙහෙම කතාවක්.

"හැම අවුරුද්දෙම නිදහස් උත්සවයදට යුද, ගුවන්, විශේෂ කාර්ය බලකා කියන මේ තුනේම කාන්තා සෙබළියන් පැරිෂුට් කණ්ඩායම් නියෝජනය කරන විදිය අපි දැක්කා. එතකොට අපිටත් අවස්ථාවක් තිබුණා නම් හොඳයි නේද කියන ආසාව හිතේ තිබුණට ඒ වෙනකොටත් ඒ අවස්ථාව ලැබිලා තිබුණේ නැහැ."

මේ වසරේ අප්‍රේල් මාසයේදී නාවික හමුදා ප්‍රධානීන් මෙම පාඨමාලාව ගැන කළ දැනුම්දීමකට අනුව ඔවුන්ටද ඊට අවස්ථාවක් ලැබුණු බවයි ඇය කියන්නේ.

"අපෙන් කාන්තා නිලධාරිනියන් හයදෙනෙක් විතරයි මේකට ඉල්ලුම් කරලා තිබුණේ. ඒකෙනුත් අපි පස්දෙනෙකුට විතරයි ශාරීරික සහ මානසික යෝග්‍යතා පුහුණුවෙන් සමත් වෙලා මේ පැරිෂුට් පුහුණුවට යන්න අවස්ථාව ලැබුණේ."

එතැන් පටන් ඔවුන් මාස දෙකකට ආසන්න කාලයක් අම්පාර ගුවන් හමුදා පාසලෙන් මෙම පුහුණුව ලබාගත් බව ඇය කියා සිටියා.

"මේ පුහුණුව අපි මුලින්ම අඩි දෙක වගේ උස මට්ටමෙන් පටන් අරගෙන පස්සේ 1000ත් 800ත් අතර ඉහළ ඉඳන් පනින සජීවී පැනීම් වාර පහකින් තමයි අවසන් වුණේ. ඇත්තමට මුලින්ම අඩි 1000ක් උඩ ඉඳන් පනින්න හදපු වෙලාවෙ මට පොඩි බයක්වත් දැනුණේ නැහැ. ගොඩක් අය ඇහුවා නිකමටවත් පැරිෂුට් එක දිගෑරුනේ නැත්තම් වැටිලා මැරෙයි, අතපය කැඩෙයි කියලා, එහෙම බය හිතුණේ නැද්ද කියලා. ඇත්තමට මට ඒ වෙලාවේ බයකට වඩා දැනුණේ කොහොමහරි ඒ අභියෝගය ජයගන්නවා කියන අධිෂ්ඨානය විතරයි. ඒ ආත්මවිශ්වාසය නිසා තමයි මට ඒ අභියෝගය ජයගන්න ලැබුණේ."

මෙම පුහුණුව සාර්ථකව නිමකළ ඉරේශාටත් අපිට කියන්නට මේ ආ ගමනේ ඒ හා සමානම රසවත් කතාවක් තිබුණා.

"මම නාවික හමුදාවට බැඳුනේ කැලණි විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය උපාධිය අවසන් කරපු ගමන්මයි. මගේ අයියත් යුද හමුදාවේ නිසා මමත් නේවි එකට යනවට අම්මයි තාත්තයි අකමැති වුණේ නැහැ. පස්සෙ මම මුලින්ම 2015දී උප ලුතිනන්වරියක් විදියට නේවි එකට බැඳුනා."

පැරිෂුට් පුහුණුව ගැන ඇය කීවේ මෙවන්නක්.

"මම කොහොමත් පුංචි කාලේ ඉඳලම ගොඩක් උස තැන්වල ඉඳන් බිමට පනින්න බය කෙනෙක්. මෙතැනදීත් පළවැනි අඩි 1000 උඩ ඉඳන් බිමට පනින්න හදනකොට මැරෙයි අතපය කැඩෙයි කියලාම නොහිතුණාට මොකද මම ගොඩක් බයෙන් හිටියේ. අනික කරුමෙටවත් පැරිෂුට් එක දිගෑරුනේ නැත්තම් කියලත් නොහිතුණාම නෙවෙයි. ඒත් ඒ වෙලාවේ අපේ පුහුණු නිලධාරීතුමන්ලා කිව්වා එයාලා ගැන සම්පූර්ණ විශ්වාසය තියාගෙන පනින්න




01 බල කාන්තා නාවික දිව්‍යාංජලී තිසේරා 02 බල කාන්තා ශරීරික අභ්‍යාසක චතුරංගනී විජයරත්න 03 ලුතිනන් ප්‍රසාදි නදීශානි 04 ලුතිනන් ඉරේෂා මධුශානි 05 බල කාන්තා නාවික මධුවන්ති රණසිංහ

කියලා. මොකද අපේ පැරිශුට් ඔතන්නෙ ඒ අය නිසා ඒවා උඩදි අනිවාර්යයෙන්ම දිගෑරෙනවා කියලත් එයාලා අපිව දැනුවත් කළා. අනික නිකමටවත් එහෙම නොවුණොත් අපි ළඟ තියෙන අතිරේක පැරිශුට් එක දිගෑරගන්න විදිය ගැනත් ඒ අය අපිව දැනුවත් කළා.

පුංචි කාලේ උඩ ඉඳන් පනින්න තියා පහළ බලන්නත් බය මම අද මේ වගේ අභියෝගයක් ජයගත්තේ ආත්මවිශ්වාසය නිසා. ඇත්තමට මම ඕනෑම කෙනෙකුට කියන්නෙ හිත තියෙනවා නම් කරන්න බැරි දෙයක් නෑ."

තම පියාගේ සිතැගියාවන් සහ සතුට වෙනුවෙන් පැරිශුට් ශූරියක් වූ කෞශිට කිව්වේ මෙහෙම කතාවක්.

"නාවික හමුදාවට සම්බන්ධ වෙන්න මට පොඩි කාලේ ඉඳලම ලොකු ආසාවක් තිබුණා. හැබැයි ඉස්කෝලේ නෙට්බෝල් ගුරුතුමිය මාව ඒකට වැඩියෙන් උනන්දු කරවපු නිසා තමයි ඒ ආසාව වැඩිවුණේ. අන්තිමට මං උසස් පෙළ ලියලා නාවික හමුදාවට බැඳුනා. එතකොට මට අවුරුදු 21යි.

දවසක් මම නිවාඩුවට ගෙදර ගියාම අම්මා කිව්වා නිදහස් උත්සවේදි අනිත් බලඇණිවල ගැහැනු ළමයි උඩ ඉඳන් පැරිශුට්වලින් පනින හැටි ටීවී එකෙන් බලලා ඒ සතුටට අපේ තාත්තා හොඳටම ඇඬුවා කියලා. ඒ වෙලාවෙදි මම හිතාගත්තා නේවි එකෙන් අපිටත් අවස්ථාවක් ලැබුණොත් අනිවාර්යයෙන්ම තාත්තාගේ ආසාව ඉශ්ට කරනවා කියලා. ඒ හිතුවත් වගේම වාසනාවකට ටික දවසක් යනකොට අපිටත් ඒ අවස්ථාව ලැබුණා විතරක් නෙවෙයි ඒක සාර්ථකව ජයගන්නත් මට පුළුවන් වුණා.

මේ පැරිශුට් පුහුණුවේදී අපිත් කොල්ලොත් එක්ක කරට කර ඉස්සරහට ගියා. අපිට කොල්ලන්ට තරම් ඇඟේ හයියක් නැතිවෙන්න පුළුවන්. හැබැයි ඊටත් වඩා මේක කරන්න පුළුවන් කියන හිතේ දහිරිය තිබුණා. ඇත්තටම ගැහැනු පිරිමි කියලා වෙනසක් නැහැ ආත්මවිශ්වාසය තියේනම් ඕන කෙනෙකුට ඕන අභියෝගයක් ජයගන්න පුළුවන්"

ඉතින් මේ කුළුඳුල් පැරිශුට් ශූරියන්ගේ ආත්මශක්තියට වගේම හිතේ ගතේ තියන හයියට ඇස්වහක් කටවහක් නම් වදින්න එපා කියන එකයි වචනයෙන් නොකිව්වත් අපේ ප්‍රාර්ථනය වුණේ.

■ ලිහිණි මධුෂිකා









# බස් එකක් දෙවනත් කර ඉතිහාසගත වූ ‘කළු පාට’ රෝසා







අහක බලන් යන්නේ නංගි ඇයි අපි කළුද? කියලා සිංදුවක් තියනවා මතක ඇතිනේ. කළු එහෙමත් නැත්නම් කාල වර්ණ මිනිස්සුන්ට එදා ඉඳලා සිද්ධ වුණු කෙනෙහිලිකම් ගැන සිහිකරගන්න සමහර වෙලාවට ඔය පද පේළි කිහිපයත් ඇති. හැබැයි මේ කතාව කාල වර්ණකාරයින්ගේ එහෙව් පෙම් පළහිලව්වක් ගැන එහෙම නෙවෙයි.

බස් රථයක හුටපටයක් නිසා ඉතිහාසගතවෙච්ච කාන්තාවක් ගැනයි මේ කතාව. ඇගේ නම රෝසා පාර්ක්ස්. 1955 අවුරුද්දේ දෙසැම්බර් මාසේ 1 වැනිදා තමයි රෝසාට මේ අකරතැබ්බයට මුහුණ දෙන්න සිද්ධ වුණේ.

එදත් සාමාන්‍ය විදියට තමන්ගේ රාජකාරි කටයුතු නිමා කරලා රෝසා, මොන්ට්ගොමරි බලා යන බස් රථයට ගොඩවුණා. මොන්ට්ගොමරි කියන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ එක ප්‍රාන්තයක් වන ඇලබාමාහි අගනගරය. හැබැයි එදා, රෝසා ඉඳගත්තෙ ඇයට වෙන් වූ සුපුරුදු අසුන් පේළියේ නෙවෙයි.

ඒ කාලෙ ඇමරිකාවේ බස්වල කළු ජාතිකයන්ට වෙනම අසුන් පේළියකුත් සුදු ජාතිකයින්ට වෙනම අසුන් පේළියකුත් වෙන්වෙලා තිබුණා. මේ කියන මොන්ට්ගොමරි බස් රථයේත් කළු ජාතිකයින් වෙනුවෙන් වෙන්වෙලා තිබුණේ පසුපස අසුන් පේළිය. ඉදිරිපස අසුන්වල හිඳගෙන යාමට අවසර ලැබුණේ සුදු ජාතිකයින්ට පමණයි. නමුත් එදා මේ රීතිය නොසලකා හරිමින් රෝසා සුදු ජාතිකයින් වෙනුවෙන් වෙන්වුණු ඉදිරිපස අසුනක ඉඳගත්තා.

ටිකෙන් ටික බස් රථය ඉදිරියට ඇදෙද්දී සුදු මිනිසුන්ගෙන් බස් රථය පිරී ගියා. සුදු නෝනාවරු මහත්වරු හිටගෙන යද්දී මේ කළු ගැහැනිය කොහොමද ඉදිරිපස අසුනක හිඳගෙන යන්නේ? බස් රථයේ රයැදුරට ඒක ප්‍රශ්නයක් වුණා. ඒ නිසා වහාම ක්‍රියාත්මක වුණු ඔහු රෝසා පර්ක්ස්ට කිව්වා ඇය හිඳගෙන සිටි අසුන පිරිනමා නැගිටින ලෙස. නමුත් ඇය බොහොම නිර්භීත විදියට ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. කොහොමහරි ඒ ප්‍රතිරෝධය, අවසානයේ ඉතිහාසයට මතක හිටින පාඩමක් උගන්වපු දැවැන්ත සමාජ ව්‍යාපාරයක් බවට පත්වෙලයි නිකන් හිටියේ. ඒ The Montgomery Bus Boycott යන නමින්.

## රියදුරුට තරහා ගිහින් ඇයව අසුනෙන් නැගිට්ටවන්න හැදුවත් ඇය නැගිට්ටේ නෑ

රෝස ඉපදුණේ 1913 පෙබරවාරි මාසේ 4 වැනිදා. පොතේපතේ දැනුම ලබාගන්න නීග්‍රෝ ජාතිකයින් වෙනුවෙන් වෙන්වුණු ඇලබාමාහි පාසලකට ඇතුළත් වුණත් පොතට හිත අලවන්න මත්තෙන් රෝසට පාසලෙන් ඉවත්වෙන්න සිදුවුණා. ඒ වෙන හේතුවක් නිසා නෙවෙයි, ලෙඩ ගානේ ඉඳපු ඇගේ මිත්තණිය රැක බලාගන්න වෙන කෙනෙක් නොඉඳපු නිසා.

කොහොම නමුත් පුංචි කාලෙ ඉඳලම ධවල මිනිස්සුන්ගේ අංකොන් එක්ක හැදී වැඩුණු නිසා වාර්ගික වෙනස්කම්වලට වගේම ප්‍රචණ්ඩත්වයටත් නිතර නිතර මුහුණ දෙන්න මේ දැරිවිට සිද්ධ වුණා. ඒ හැලහැප්පීම්වල ප්‍රතිඵලයක් විදියට තමයි ළමිස්සියක් වෙද්දිම ඇය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සිවිල් ක්‍රියාකාරිනියක් බවට පත්වුණේ.

කාලය ඔහොම ගතවෙද්දී, යන්තම් අවුරුදු 19 පිරෙනකොටම රේමන්ඩ් පාර්ක්ස් කියන බාබර් උන්නැහේව කසාද බැඳගෙන රෝසා යුග ජීවිතේට ඇතුළත් වුණා. එක ජාතියේ කුරුල්ලෝ එක අත්තේ වහනවා කියන්නැහේ මේ ඉලන්දාරියාත් කළු ජාතිකයින්ට වෙනස්කොට සැලකීමේ අසාධාරණයට එරෙහිව සටන් කරපු කෙනෙක්. ඒ නිසා විවාහයෙන් පස්සේ මේ දෙන්නා සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගන සංවිධාන ගණනක කැපී පෙනෙන සාමාජිකයින් බවට පත්වුණා. අවසානයේ රෝසා නතර වුණේ NAACP ( National Association for the Advancement of Colored People) හි මොන්ට්ගොමරි සඳහා වන ලේකම් ධුරයට පත්වෙලා.

එහෙම බලනකොට 1955 අපි කලින් සඳහන් කරපු සිදුවීම වෙනකොටත් රෝසා කියන්නේ සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි කැපී පෙනෙන සමාජ ක්‍රියාකාරිනියක් බව ඉතාම පැහැදිලියි. ඒ කියන්නේ එදා බස් රථයේ අසුන පරිත්‍යාග කිරීම ඇය ප්‍රතික්ෂේප කළේ ප්‍රතිරෝධය පෑමක් ලෙස පමණක්ම නෙවෙයි. ඒක Montgomery Bus Boycott එක (මොන්ට්ගොමරි බස් වර්ජනය) සංවිධානය කරන්න සහ සැලසුම් කරන්න ඇය විසින් ගත් මූලික පියවරක් විතරයි.

හැබැයි එහෙම තත්ත්වයක් යටතේත් එදා බස් රථයේ සිදුවීම සම්බන්ධව වෙනත් විදියකට අර්ථකථනය කරපු පිරිසකුත් හිටියා. ඇය අසුනින් නැගිටීම ප්‍රතික්ෂේප කළේ, ඇගේ නිර්භීතකම නිසා නොව ඇය වෙහෙසට පත්ව සිටි නිසා කියලයි ඔවුන් කිව්වේ. නමුත් රෝසා වගේම ඇගේ කඳවුරේ අනෙක් අයත් දැඩි ලෙස ඒ ප්‍රකාශය ප්‍රතික්ෂේප කළා.

**“මම වෙහෙසට පත්වෙලා ඉඳපු නිසා අසුන දුන්නේ නෑ කියලා ඔවුන් කියනවා. නමුත් ඒක ඇත්ත නෙවෙයි. මට ඒ කියන විදියේ වෙහෙසක් කොහෙත්ම තිබුණේ නෑ. මම වයෝවෘධ කෙනෙක් නෙවෙයි. එතකොට මට වයස අවුරුදු 42යි. ඒ මොහොත වනවිට මා වෙහෙසට පත්ව සිටියා නම් සිටියේ යටත් වී සිටීම නිසා සහ වෙනස්කොට සැලකීම නිසා පමණයි.”**

මොන්ට්ගොමරි බස් වර්ජනය සහ රෝසා පාර්ක්ස්ගේ මේ නිර්භීත ක්‍රියාව නිසා අවසානයේ මොන්ට්ගොමරිහි පොදු ප්‍රවාහනය ඒකාබද්ධ සේවයක් බවට පත්කරන්න ඒ රටේ බලධාරීන්ට සිද්ධ වුණා. හැබැයි මේ සිද්ධිය නිසා, ඒ කියන්නේ අසුන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම නිසා රෝසාට ඇගේ රැකියාව අහිමි වුණා විතරක් නෙවෙයි සිරබත් කන්නත් සිද්ධ වුණා.

ඉන්පසුවත් සිවිල් ක්‍රියාකාරිනියක් ලෙස කැපී පෙනෙන වැඩ කොටසක් ඉටුකරපු රෝසා සැමියාගේ අභාවයෙන් පසුව බොහොම අවාසනාවන්ත විදියට සෞඛ්‍යමය වශයෙන් සහ ආර්ථික වශයෙනුත් අඩපණ වුණා. නමුත් ඒ වෙලාවේ අනෙකුත් සමාජ සේවකයින් සහ කතෝලික පල්ලි ඇගේ පිහිටට ආවා කියලයි සඳහන් වෙන්නේ. කොහොම නමුත් 2005 අවුරුද්දේ අවුරුදු 92ක් ආයු වළඳලා රෝසා යන්න ගියේ අයුක්තියට අසාධාරණයට එරෙහිව හඬ නැගූ පොහොසත් කාන්තාවක් ලෙස ඉතිහාසයට එක්වෙමින්. ඊට පෙර 1999 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදය විසින් සිවිල් වැසියෙකුට පිරිනමන ඉහළම ගෞරවය වන කොන්ග්‍රස් රන් පදක්කම ( Congressional Gold Medal) රෝසාට හිමිවුණා. ඇය හැරුණුකොට ඒ සම්මානය ලබන්න වාසනාවන්ත වුණු ඇමරිකන්කාරයින් වුණේ ජෝර්ජ් වොෂින්ටන්, තෝමස් එඩිසන්ස් බෙට් ෆෝඩ් සහ තෙරේසා මව්තුමිය පමණයි.

■ සුරේෂ් විදානගමගේ



ජාවාරම්කරුවන්ට හසුනොවී
වැදගත් විදිහට වැඩ ටික කරගෙන
සතුටින් රට යන්න
ඔබ රට රස්සාවකට යන්නෙ, ඔබේත් ඔබේ ආදරණීයයන්ගේත් සිහින ඉටු කරගෙන, ජීවිතේ සැපවත් කරගන්න. ඒ යන ගමන, වැදගත් විදිහට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා ගියොත් ඔබට පුළුවන් ඔබේ ආරක්ෂාව, රැකියාව පිළිබඳ හොඳ විශ්වාසයක් ඇතුව සතුටින් පිටව යන්න.
රට යනකොට කතා කරන්න 1989
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙන්න.
www.slbfe.lk
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය




සුනර මහා පීනස් තෛලය
"සෑම ගෙදරටම දිව ඔසුවක්" ගෙනෙන සුනර වෙද මැදුරෙන් වෙළෙඳ පොළට හඳුන්වා දෙන පුදුම සහගත ප්‍රතිඵල ගෙනෙන සුනර මහා පීනස් තෛලය ඔබත් අදම අත්විඳ එහි සැබෑ වෙනස වටහාගන්න.
ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ මෙය රතුලූණු තෛලය ලෙස ද හැඳින්වේ
සොටු දියර ගැලීම, හිස බරවීම, නාසය සිරවීම, හිසරදය, කිවිසුම්යාම, කන් අගුල් වැටීම, පීනස නිසා අකලට හිසකෙස් පැසීම, ඇස්කැසීම, රතුවීම වහා නවතා දමයි.
ඔබ පීනස් රෝගයෙන් පෙළීම නිසා ඔබට දූවිලිවලින් මෙන්ම හිමිදිරි පින්න නිසා නොනවත්වා කිවිසුම් යනවා නම් මෙන්ම එකම විසඳුම. එපමණක් නොව ඇදුම රෝගය මෙන්ම ඕනෑම සෙම්බහුල රෝගයකට මහත් ගුණ ලැබේ. අද්විතීය ගුණයෙන් සපිරි රතු ලූණු, සුදුලූණු, පෙරුංකායම්, කලදුරු, තිප්පිලි, ඉඟුරු, ආදී ප්‍රබල ආයුර්වේදයේ සෙම් රෝග නැසීම සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධ රැසකින් සමන්විත සුනර වෙද මැදුරේ නිෂ්පාදනයක් ලෙස, වෛද්‍යවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ආයුර්වේදයේ සැබෑ ගුණ සුවඳ කැටුව ඔබ අතටපත් කෙරෙන මෙම මහගු තෙල වරක් පාවිච්චිකර වෙනස වටහා ගන්න. කුඩාදරුවන්ගේ ද හිස ගැල්වී මෙන් ඔවුන්ට පවතින සෙම්රෝග නිවරණය කිරීමට මහත් ගුණ දෙන විස්මිත තෙලකි.
සැබෑම ගුණ දෙන ආයුර්වේදානුකූල නියම ප්‍රමිතියෙන් යුතු ඔසුතෙල් නිපැයුමෙන් දිවයිනේ ප්‍රමුඛතම නාමයක් දිනා සිටින සුනර වෙදමැදුරෙන් ඔබ වෙත ගෙන එන තවත් දිව්‍ය ඖෂධයකි.
සුනර මහා පීනස් තෛලය
සියලුම සෙම රෝග වලට දිව ඔසුවකි.
100ml
මිල රු.550/-
විමසීම් -
077 884 39 66
066 225 57 22
නිෂ්පාදනය සහ බෙදාහැරීම
ආයුර්වේද වෛද්‍ය
නදීකා ගජනායක
සුනර වෙදමැදුර, අලකොලමඩ පාර,
රත්තොට, මාතලේ






# මගේ මැක්‍රම් පෝරුවලට ලොකු ඉල්ලුමක් තියෙනවා

ව්‍යවසායිකා
නදීශා මධුෂානි

මැක්‍රම් කියන්නේ නූලෙන් නූල පිළිවෙලට පටලවලා බොහොම ඉවසීමෙන් කරන මනස්කාන්ත ආර්ට් එකක්. මේ කලාව වැඩිපුර ප්‍රසිද්ධ යුරෝපේ. හිත නිවන කලාවක් නිසා ඒ රටවල මැක්‍රම් ආර්ටිස්ට්ලාට තියෙන්නේ වෙනම පිළිගැනීමක්. මැජික් වගේ මැක්‍රම් හදන මායාකාර අත් තියෙන කලාකාරයෝ ඉන්නවා. සමාජ මාධ්‍යවල මිලියන ගණනින් අනුගාමිකයෝ ඉන්න ඉසබෙලා ස්ට්‍රම්බියෝ, ටමර් සම්ලෝනියස්, මිලා කොවෝ, ටෙඩී ඇන්ඩ් වූල්, එරික් ස්ට්‍රීට් ඒ වගේ මායාකාර මැක්‍රම් ආර්ටිස්ලා.

ලංකාවේත් මැක්‍රම් ආර්ටිස්ට්ලා ඉන්නවා. හැබැයි ඒ බහුතරයක් තුළින් අද්විතීය නිර්මාණශීලීත්වයක් දැකගන්න අමාරුයි. හැබැයි මේ කියන්න යන්නේ අර කලින් කිව්ව උදවිය වගේම මැජික් මැක්‍රම් හදන මායාකාර අත් තියෙන යුරෝපෙට පවා මැක්‍රම් යවන තරුණියක් ගැන. ඇය නදීශා මධුෂානි. 'Weaver with nadee' කිව්වහම ටික්ටොක් එකේ, ෆේස්බුක් එකේ ඇයව නොදන්න කෙනෙක් නැහැ. මැක්‍රම් ආර්ටිස්ට් කෙනෙක් විදියට ඈ ඒ තරම් ප්‍රසිද්ධයි. මේ වෙනකොට ඇයට විශාල සමාජ මාධ්‍ය අනුගාමිකයෝ පිරිසක් ඉන්නවා. අද කොච්චර සාර්ථක වුණත් නදීගේ කතාව පටන් අරන් තියෙන්නේ අන්තිම අඩියෙන්. තමන්ගේම දෙයක් පටන්ගන්න හීන දකින කෙනෙක්ට ආදර්ශයක් වෙන්න නදී ඇගේ කතාව අපිත් එක්ක බෙදාගත්තේ මෙහෙමයි. අද 'ධරණී' මුල්පිටුව හැඩවෙලා තියෙන්නෙත් ලස්සන මැක්‍රම් හදන නදීගේ රූපෙන්.

**"මම ඉන්නේ කෑගල්ල ගලපිටමඩ කියන ගමේ. මමයි, අම්මයි, මල්ලියි, මාමායි, ආච්චියි තමයි පවුලේ ඉන්නේ. අපි පුංචි කාලෙම තාත්තා පවුලෙන් වෙන්වුණා. අපිට ජීවත්වෙන්න සල්ලි හොයන්න අම්මා විදේශගත වුණා. අම්මගේ මල්ලි ඒ කියන්නේ මගේ මාමයි, ආච්චි අම්මයි තමයි අපිව බලාගත්තේ. මම සාමාන්‍ය පෙළට වෙනකල් හෙට්ටිපොළ පඬුවස්නුවර ජාතික පාසලෙන් ඉගෙනගත්තා. උසස් පෙළ කළේ නිට්ටඹුව සංඝබෝධි පාසලෙන්. පොඩි කාලේ මට හීන වුණේ ගුරුවරියක් වෙන්න. ගෙදර ආර්ථික ප්‍රශ්න එක්කලා මට අමතර පංතියකටවත් යන්න අමාරු වුණා. පළවැනි පාර උසස් පෙළින් විද්‍යාපීඨ යන්න බැරිවුණා. දෙවැනි සැරේට විභාගේ කරන්න ආර්ථික ශක්තියක් තිබුණේ නැති නිසා ඒ හීනේ අතඇරලා ජොබ් එකක් කරන්න හිතුවා."**

පාසල් අධ්‍යාපනයෙන් පස්සේ නදී රූපලාවණ්‍ය පාඨමාලාවක් කරලා ගෙවල් අහල පහල අයට පුංචි පුංචි සැලෝන් වැඩ කළාලු.

"සැලෝන් එකක් පටන්ගන්න යම් මුදලක් ආයෝජනය කරන්න ඕනානේ. අවශ්‍ය දේවල් ගන්න මට මුදල් තිබුණේ නැහැ. පස්සේ මම ජොබ් එකක් හොයාගෙන කොළඹ බෝඩිං වුණා. ඒක මාකටින් ජොබ් එකක්. මට තිබුණේ ගෙවල්වලට ගිහින් කාඩ් විකුණන්න. කාඩ් එකකට රුපියල් 250ක කමිෂන් එකක් ලැබුණා. හැබැයි වෙනම පඩියක් ලැබුණේ නැහැ. කොච්චර ඇවිද්දත් එක කාඩ් එකක්වත් විකුණුනේ නැති දවස් තිබුණා. ඉතින් සමහර දවසට මට කන්නවත් නැහැ. ඒ රස්සාවෙන් බෝඩින් කුලියවත් ගෙවාගන්න බැරි නිසා මාස හතරක් යද්දි ආයෙම ගමට ආවා. පස්සේ ප්‍රයිවට් හොස්පිටල් එකක රස්සාවක් හම්බවුණා පුංචි පඩියකට. ඒ රස්සාවත් හරි ගියේ නැහැ. පස්සේ ලොජිස්ටික් කම්පැනි එකක වැඩ කළා. ඒක මට ගැළපෙන රස්සාව නෙමෙයි කියලමයි මට හිතුණේ. පුංචි කාලේ ඉඳලා මට ලියන්න පුළුවන්. ඔය අතරේ ක්‍රියේටිව් රයිටර් කෙනෙක් විදියට රස්සාවක් ලැබුණා.



ඒ රස්සාව ආසාවෙන් කර කර ඉන්දැද්දි කොවිඩ් ඇවිල්ලා රස්සාවෙන් අස්වෙලා ගෙදර එන්න වුණා. පස්සේ ටික කාලයක් මට ගෙදරට වෙලා ඉන්න වුණා."

නදී පුංචි කාලයේ ඉඳලම නිර්මාණශීලී ගැහැනු ළමයෙක්ලු. ඉතින් වෙලාව තියෙන වෙලාවට අහක දාන දෙයින් පොඩි පොඩි නිර්මාණ කරන එක ඇගේ පුරුද්දක්ලු.

"අපතේ දාන දේවල් එකතු කරලා නිර්මාණ කරන්න මම ආසයි. ගෙදර හිටපු දවස් ටිකේ මම ටික්ටොක් එකවුන්ට් එකක් හැදුවා. නිකමට වගේ DIY කරන හැටි වීඩියෝ කරලා දැම්මා. බොහොම ඉක්මනින් ඒ වීඩියෝවලට වීව්ස්, කමෙන්ට් වැටුණා."

නදීට මැක්‍රම් අදහස ඇවිල්ලා තියෙන්නෙත් ෆේස්බුක් එකේ දැකපු මැක්‍රම් පිටුවක් නිසයි.

"මැක්‍රම්වලින් ගෘහ අලංකරණ නිර්මාණ හදන ආර්ටිස්ට් කෙනෙක්ව මම දැක්කා. ඒක පිටරට පේජ් එකක්. ඒ නිර්මාණ හරිම ලස්සනයි. පිටරටවල මැක්‍රම්වලට ලොකු ඉල්ලුමක් තියෙනවා කියලා මම දැනගත්තේ එතකොට. මටත් මැක්‍රම් කරලා බලන්න ආස හිතුණා. පස්සේ හොයලා බලද්දි ලොකුවට මැක්‍රම් කරන අය ලංකාවේ නැහැ. ඒ නිසා මට මැක්‍රම් නූල් හොයාගන්නත් අමාරු වුණා. අමාරුවෙන් නූල් කිලෝ එකක් හොයාගන්න පුළුවන් වුණා. ඒක තියාගෙන මම යූටියුබ්, ටික්ටොක් බල බලා මැක්‍රම් ගොතන්න ඉගෙනගත්තා. මුලදි මට සෑහෙන වැරදුණා. ඒත් මම වැඩේ අතඇරියේ නැහැ. මාස දෙකක් විතර යද්දි වැඩේ හුරුවුණා. උපතින්ම පොඩි නිර්මාණශීලීත්වයක් තිබුණු නිසා ලස්සනට නිර්මාණ හදන්න මට පුළුවන් වුණා."

ඔය විදියට මැක්‍රම් වැඩේ කරන අතරතුරේ නදී රස්සා හෙවිල්ල නතර කළේත් නැතිලු.

"තව කෙනෙක් යටතේ වැඩ කරද්දි හිත රිදෙන තැන් වැඩියි. ඒ දේවල් මට ලොකු පීඩනයක් වුණා. මට එක රස්සාවක් කරන්න බැහැ කියන පීඩනෙත් මගේ හිතේ තිබුණා. ඔය අතරේ මම කරාපු කීටැග්, ටේබල් මැට් වගේ පුංචි නිර්මාණ හදලා ටික්ටොක් එකේ දැම්මා. මාස දෙකක් යනකල් එක ඕඩරයක්වත් ආවේ නැහැ. හැබැයි මේක හරියයි කියන විශ්වාසේ මගේ හිතේ ලොකුවටම තිබුණා. මාස දෙකකට පස්සේ ඕඩරයක් ආවා. ඒකට පස්සේ තව ඕඩර් දෙකක් ආවා. රස්සාවක් නොකර මේ වැඩේ දිගටම කරනවා කියලා හිතුවේ ඊටපස්සේ."

මුලදී නදී ගොඩක් නිර්මාණ හදලා තිබුණේ පිටරටට ගැළපෙන විදියට. හැබැයි ඒ නිර්මාණ අපේ පාරිභෝගිකයන්ට ගැළපෙන්නේ නැහැ කියලා තේරුම්ගත්තු ඇය ලංකාවේ අපිට ගැළපෙන විදියට මැක්‍රම් නිර්මාණ කරන්න පටන්ගත්තලු.

**"ගොඩක් අය නිර්මාණයක් වුණත් ගන්නේ ඒකෙන් ප්‍රයෝජනයක් තියෙනවද කියලා බලලයි. මම ඒක තේරුම්ගත්තා. ඉතින් මම ලෑලි ටිකක් අරගෙන මැක්‍රම්වලින් ඒක සම්බන්ධ කරලා බඩු තියන්න පුළුවන් රාක්කයක් හැදුවා. හිතුවා වගේම ඒකට ලොකු ඉල්ලුමක් හැදුනා. දවසින් දවස ලැබෙන ඕඩර් ගාණ වැඩි වුණා. මම බිස්නස් එක පටන්ගත්තේ 2022 මැයි මාසේ. මට දැන් සතියකට බාරගන්න බැරිතරම් ඕඩර්ස් එනවා. මේ වෙනකොට ලොකු නිර්මාණ 400කට වඩා කරලා තියෙනවා."**



නදී ඇගේ මැක්‍රම් පෝරුවක් සමග

නිවාස සැරසිලි, ඇඳුම් පැළඳුම්, ගෘහ භාණ්ඩ, ළමා නිෂ්පාදන විතරක් නෙමෙයි ඇය මැක්‍රම්වලින් විවාහ සැරසිලි පවා කරනවා.

"මල් සැරසිලි, මේස සැරසිලි, පෝරු ඔය සේරම මැක්‍රම්වලින් හදලා සම්පූර්ණ විවාහ උත්සවයම මැක්‍රම්වලින් කරනවා. ඒ වගේම මැක්‍රම් පෝරුවටත් ලොකු ඉල්ලුමක් තියෙනවා. පිටරට ඉන්න ගොඩක් අයගෙන් ඇණවුම් ලැබෙනවා. ගොඩක්ම යුරෝපීය රටවලින්. නිර්මාණ හදනවට අමතරව මම දැන් මැක්‍රම් පාඨමාලාත් කරනවා. එදා මට ගුරු හීනේ හැබෑ කරගන්න බැරි වුණත් මැක්‍රම් නිසා ඒ හීනෙටත් තටු ලැබුණා."

සාර්ථකත්වයේ ගමන ගැන එකදිගට කියාගෙන ආවට නදීගේ ගමන ඒ තරම් සුමුදු මෘදු නැහැ කියලා කාට වුණත් තේරෙනවා. සාර්ථකත්වය වෙනුවෙන් ඇය කරපු කැපකිරීම් ගැන නදී කතා කළේ මෙහෙම.




# යුරෝපා රටවලින් ඇණවුම් ලැබෙනවා වැඩියි

"ගොඩක් නිර්මාණවලට ලී අවශ්‍ය වෙනවා. ඒ ලී සුමට කරන්නත් ඕනේ. මුලදී ලී මැද්දේ වැලි කඩදාසියෙන්. කියතෙන් ලී ඉරාගත්තා. ගෑනු ළමයෙක්ට ඒ වැඩ ටිකක් අමාරුයිනේ. ඒත් එහෙමයි කියලා මම අතඇරියේ නැහැ. බිස්නස් එක සාර්ථක වෙද්දි වැඩවලට අවශ්‍ය සේරම මැෂින් ගත්තා. හැබැයි අදටත් මම ඒවා තනියම කරන්නේ. මැෂින්වලට අත කැපෙන වෙලාවල් තියෙනවා. නූල්වලට අත් මැදෙනවා. අත් දෙකේම දැනටත් කරගැට තියෙනවා. මේ වැඩේට ගොඩක් වෙලාව යන නිසා පාන්දර වෙනකල් වැඩ කරන්න වෙනවා."

පැමිණි දුක් පැණි රහයි කියනවා වගේ ඒ හැම අභියෝගයක්ම නදීට හයියක් කියලා ඇය කිව්වේ සතුටින්. මේ කතා කරන නදීට තාම අවුරුදු 26යි. ගෙදර කාමරෙන් මැක්‍රම් හදන්න පටන්ගත්තු යුවතිය අද මැක්‍රම් වර්ක්ෂොප් එකකට අත්තිවාරම් දලාත් ඉවරයි.

"මුලදි මට නූල් ගන්න සල්ලි තිබුණේ නැහැ. දැන් මට නූල් ගබඩාවක්ම තියෙනවා. මැක්‍රම් හදන අයට ඒවා අලෙවි කරනවා. මගේ වයසේ බහුතරයකට වඩා හොඳ මුදලක් අද මම හම්බ කරනවා. මම මේ වැඩේ පටන්ගනිද්දි 'ඕවට පැවැත්මක් තියෙනවද, ඕවා කරලා ගොඩ යන්න පුළුවන්ද' කියලා සමහරු ඇහුවා. හැබැයි සාර්ථක වුණාට පස්සේ ඉස්සර කතා නොකරපු අයත් අද මාත් එක්ක කතා කරනවා."

නදීට මායාකාර අත් වගේම මායාකාර හිනාවකුත් තියෙනවා. හිත රිදෙන වචන කිව්ව මිනිස්සු ගැන වුණත් ඇය කතා කළේ හිතේ තරහක් නැතිව ලස්සනට හිනාවෙලා.

**"දැන් ගොඩක් අය බිස්නස් කරන්න හිතනවා. ඒක බොහොම හොඳ ප්‍රවණතාවක්. හැබැයි බිස්නස් කරනවා නම් ඉගෙනගන්නේ මොකටද කියලා පාසල් ගමන නතර කරලා බිස්නස් පටන්ගන්න හදන නංගිලා මල්ලිලාත් ඉන්නවා. එහෙම කරන්න එපා. මුලින් හොඳට ඉගෙනගන්න. මොකද හතු පිපෙනවා වගේ එකපාර පිපෙන්න ගියොත් ඉක්මනට පරවෙනවා. ඒ නිසා හිමින් පියවරෙන් පියවර අඩිය තියන්න. එතකොට සාර්ථක වෙන්න ලේසියි. මේ වැඩේ කළේ මමද කියලා වෙලාවකට මටම පුදුම හිතෙනවා. හිතට එන පුංචි සිතුවිල්ලකින් ජීවිතේ වෙනස් කරගන්න පුළුවන්. ඒකට ඕනේ හිතේ හයිය විතරයි."**

ව්‍යාපාරය පටන්ගත්තු දවසේ ඉඳලා හිතට හයිය දුන්නු නදීගේ පෙම්වතා ශේන්වත්, අම්මා, මල්ලි, මාමා, ආච්චි ඔය සේරම දෙනාව ආදරෙන් මතක් කරන්නත් ඇය අමතක කළේ නැහැ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# හොරිවිල වෙදමහත්තයාගෙන් බෙහෙතක්



**ශාන්ත සෙනෙවිරත්න වෙදමහතා**
හොරිවිල වෙද මැදුර

# පීනස මට්ටු කරන්න අපූරු තෙලක්

**මනුස්ස පරාණවලට වැළඳෙනවාය කියන ඔය අට අනුවක් රෝග නිට්ටාවටම සුව කරන්ට පුළුවන් ජගතෙක් ඉන්නවනම් ඉතින් ඒ සිංහල වෙදමහත්තයෙක්ම වෙන්න ඕන. නම් දරාපු ලොකු දොස්තර මහත්තැන්ලා ගාවට හිහිල්ලත් ලෙඩ සුව කරගන්න බැරිවෙද්දී ඒකනේ සමහරු කියන්නේ 'නරකද සිංහල බෙහෙත් ටිකක් බීලා බැලුවොත්' කියලා. මොකද පුද්ගලික ඉස්පිරිතාල හෝ විශේෂඥ වෛද්‍යවරු නොහිටිය පුරාණ කාලේ ඔය වෙදමහත්තුරු තමයි ඕන ලෙඩක් හොඳ කළාය කියන්නේ. අපේ රටේ එහෙව් නම ගිය වෙද පරපුරක් තමයි හොරිවිල වෙද පරපුර කියන්නේ. 'හොරිවිල වෙදමහත්තයා' කිව්වම අදත් ඉතින් නොදන්නා කෙනෙක් නැහැ නොවැ! මේ වෙද පරපුරේ තිස්වැනි පරම්පරාව තමයි අද වෙද්දී වෙදකමේ නියැලෙන්නේ. ඉතින් අද ඉඳලා අපි මේ ලක ලැහැස්ති වෙන්නේ අන්න ඒ හොරිවිල වෙදමහත්තයාගෙන් පුංචි පුංචි ලෙඩවලට අත්බෙහෙත් ගෙදරදීම හදාගන්න විදිය අහලා කියන්නයි.**

**1 කොටස**

බොහෝ දෙනෙක් පීඩාවට පත්කරන ලෙඩකට බේතක් ගැනයි මුලින්ම කියන්න යන්නේ. ඒ තමයි පීනස. උදේ නැගිට්ට වෙලාවේ ඉඳලා කිඹුහුම් අරින උන්දැලා තමා පුංචි වුණත් මේ ලෙඩේ තියන අමාරුව දන්නේ. ඒ විතරක්ද, අකලට හිසකෙස් සුදුවෙන එකත් පීනසේ ප්‍රතිඵලයක්නේ. ඕකට ඉතින් ඉස්පිරිතාලේ ගියාම දූවිලි වදින්න යන්න එපා, අවේලාවේ නාන්න එපා, තද අව්වේ යන්න එපා වගේ අටෝරාශියක් උපදෙස් පිළිපදින්න වෙනවනේ. ඒවා ඉතින් ප්‍රයෝගිකව කරන්න පුළුවන් වැඩයැ! අන්න ඒ නිසා මේ ලෙඩේ නිට්ටාවට හොඳ කරගන්න පුළුවන් අත්බෙහෙතක් හදාගන්න විදිය වෙදමහත්තයා අපිට කිව්වා. ඒක ඇවිල්ලා පීනස් තෙලක්. නම රතුලූනු තෙල.

**අවශ්‍ය ද්‍රව්‍ය**

රතුලූනු කිලෝ එකක්, තලතෙල් බෝතලයක්, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, කළුදුරු, කරාබුනැටි, වසාවාසි, සාදික්කා, සූදුරු, පෙරුංකායම් ග්‍රෑම් 5 බැගින්

**තෙල හින්ඳන හැටි**

මුලින්ම රතුලූනු පොතු ඇරලා හෝදලා මදපවනේ වේලගන්න. ඊටපස්සේ ඉඟුරු ඇතුළු අනෙක් ඖෂධ ටික හොඳින් අඹරගන්න. ඇඹරීමේ පහසුවට රතුලූනු යොදගන්නත් පුවුවන්. ඊටපස්සේ ඒ ටික කල්කයක් විදියට හදගන්න. දැන් බඳුනකට තලතෙල් ටික දලා ලිපේ තියලා රත්කරන්න. මදක් තලාගත්ත රතුලූනු ටිකත් ඒකට දන්න. ඒ කරලා තෙල් කරවෙන්න නොදී හිඳගන්න. රතුලූනු තද දුඹුරු පාටට ආවට පස්සේ අර කලින් හදගත්ත කල්කය ඒකට එකතු කරන්න. නියම පදමට ආපුවම ඒක ලිපෙන් බාලා නිවෙන්න දෙන්න. ඊළඟට පිරිසිදු බෝතලයට ඒක පෙරාගන්න.

**පාවිච්චි කරන හැටි**

ඒ විදියට හින්ඳගත්ත තෙල උදේ වරුවට හිස ගල්වලා ටික වෙලාවක් සම්බාහනය කරන්න ඕන. හැබැයි ඔය සත්කාරේ කරද්දී හවස්යාමේ නාන්න නම් තියාගන්න එපා. ඒ විදියට මාසයක් හමාරක් දවස ගානේ තෙල ඔලුවට වැටෙද්දි පීනසක් තිබුණද කියලවත් හොයාගන්න බැරිවෙනවා කියලයි වෙද මහත්තයා කිව්වේ.

■ රුවන් එස්.සෙනවිරත්න





අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

# ඉතිහාස ගුරුතුමා ‘කුවේණි’ ගැන කිව්වාම මට තරු විසිවුණා සර්

## සර් නොවෙන්න, මට ගංජා හේනක මිසක් වෛද්‍ය විද්‍යාලයේ දොර නම් කවදාවත් ඇරෙන්නේ නෑ

පසුගිය සතියේ ‘ධරණී’ පුවත්පතට මා ලියූ ලිපිය කියවූ කොළඹ විශ්වවිද්‍යාලයේ දුවක මට කතා කරා. ජීවිතය වරදවාගත් දූවරුන් අතරේ ජීවිතය දිනාගත් මේ ශිෂ්‍යාවගේ ගම්පළාත ඇඹිලිපිටිය. දුව සාමාන්‍ය පෙළ විභාගයට ඉතිහාසය ඉගෙනගෙන තියෙනවා. පාසැලේදී විද්‍යා විෂයන්වලට වැඩි බරක් පැටවෙන හින්දු ඉතිහාසය, බුද්ධ ධර්මය වැනි විෂයන්වලට ලැබෙන්නේ අඩු සැලකිල්ලක්නෙ. ඒ නිසා මේ දුව විෂයයන් ඉගෙනගන්න ඇඹිලිපිටියේ සිපාරා ආයතනයට ගිහින්. ඒකේ හිටපු ගුරු දෙව්වරුන් අතර දුවගේ හිත ඇදීගිය ගුරුතුමා සඳමාල් මුණසිංහ ගුරුතුමාලු. එතුමා විෂය කරුණුවලට අමතරව ජීවිතයත් කියලා දෙනවා කියලයි දුව මට කිව්වේ.

ඇඹිලිපිටිය දුෂ්කර කලාපය හේන් ගොවිතැන් හා ගංජා වගාවට ප්‍රසිද්ධ බව හැමෝම දන්නවනේ. ඉතින් අඩු වයසින් විවාහ වන අයගේ ප්‍රමාණයත් වැඩියි. පොත්, රෙදි නිකන් දුන්නත් ඉස්කෝලවලින් අධ්‍යාපන ගැන ඒ හැටි බලකිරීමක් නැහැ. ඉගෙනගන්න එකා ඉගෙනගත්තට අනෙක් අය එන්නන් වාලේ ඉස්කෝලෙ එනවා. මේ දුව ඉඳලා තියෙන්නෙත් ඒ ගොඩේ. ඔහොම ඉන්නකොට දවසක් සිපාරා ආයතනයෙදී ඉතිහාස ගුරුතුමා මේ දුවලාට ලංකා ඉතිහාසය ගැන අපූරු පාඩමක් කියලා දීලා. ගුරුතුමා පාඩම කියලා දුන්නේ මෙන්න මේ විදියටලු.

“දරුවනේ ලංකාවේ නාමමාත්‍රික ඉතිහාසය ආරම්භ වෙන්නෙ විජය රජ්ජුරුවන්ගෙන්නේ. ඒත් ඊට කලින් ලංකාවේ ඉතා දියුණු සංස්කෘතියක්, ඉතිහාසයක් තිබිලා තියෙනවා. රාවණ රජ්ජුරුවෝ ඒ ඉතිහාසයේ අභිමානවත් සංකේතයක්. ඒත් මහවිහාර හාමුදුරුවරු අතින් රාවණ පරම්පරාව ගිලිහෙනවා. ඉතින් පුතේ මේ කියන විජය හොරකමකට අහුවෙලා එයාගේ පිරිසත් එක්ක පිටුවහල් කරනවා. ඒ පිටුවහල් වෙච්ච පිරිස තම්මැන්නාව කියන ප්‍රදේශයට එනවා. ඉතින් මේ හොරු කණ්ඩායම තම්මැන්නාවට ගොඩබැහැලා යනකොට බැල්ලක් දැකලා ඒ බැල්ල පිටුපස යනවා. බැල්ල නවතින්නේ කපු කටිමින් ඉන්න දේශීය කාන්තාවක ළඟ. විජය පස්සේ දැනගන්නවා මේ රම්බා නමැති යක්ෂ සෙන්පතියාගේ දුව බව. කුවේණියට විජය දැක්ක ගමන් ඔහු පිළිබඳ සිතක් පහල වෙනවා. මේ අය කවුද, ආවේ කොහෙන්ද, අම්මා තාත්තා කවුද මේ කිසිම දෙයක් කුවේණිය හෙව්වේ නැහැ. ලංකාවේ ඉතිහාසගත පළවැනි කාන්තාව පිටින් ආ නමක් ගමක් දන්නේ නැති මිනිහෙකුට රැවටුණා. දරුවන් දෙන්නෙක් හැදෙනකල් හිටපු විජය ඉන්දියාවෙන් තව ගෑනියක් ගේනකොටයි ඇයට තරු පෙනුණේ. කුවේණිට යක්ෂ පරපුර ශාප කළා. ඇය දිවි නසාගත්තා. දරුවෝ රත්නපුර පැත්තට ඇවිත් වැදි පරම්පරාවක් ඇති කළා. ඔන්න දරුවනේ අපේ ඉතිහාසයේ ගැහැනියක් ඉතිහාසගත වෙන්නම ‘බූට්’ එකක් කාපු පළමු අවස්ථාව.

කුවේණි ආවෙත් ඇඹිලිපිටියට ආසන්න රත්නපුරයට. ඉතින් අපි ආයෙත් වැද්දෝ වෙනවද? ඉතින් එහෙමයි කියලා අපිත් වවලා පොලිසියට අහුවෙවී ජීවත්වෙන්නද ආස? ඇයි දුවේ ඉස්කෝලේ උගන්වන්නේ නොමිලේ. පොත් දෙන්නේ නොමිලේ. රෙදි දෙන්නේ නොමිලේ. පුතාලට දුවලට හිතෙන්නේ නැද්ද මේ රටේ ඕනතරම් රස්සාවල් තියෙනවා. ව්‍යාපාර තියෙනවා. ඇයි අම්මා තාත්තා කළ දේම කරන්නේ? ආස නැද්ද හොඳට ඉගෙනගෙන හොඳට ඇඳලා උගතෙකුත් වෙලා ඕන නම් තමන්ගේ කියලා ව්‍යාපාරයකුත් කරගෙන නැගිටින්න? දැන් බලන්න පුතාලට පෙම් කරාට ඇවිදින්න තරම් නිදහසක් නැහැ. හැමෝම ඇස් ලොකු කරගෙන බලන් ඉන්නවා. පුතාලට දුවලට හොඳට ඉගෙනගත්තොත් කැම්පස් යන්න පුළුවන්. එහෙ පෙම් කරන්න තහනමක් නෑ. කැම්පස් ජෝඩු සියයක් ගත්තොත් හැත්තෑපහක් කසාද බඳිනවා. නිදහසේ ඉගෙනගන්න ජීවිතය විඳින්න පුළුවන්. පුතාලා අද ගිහින් මේ ගැන කල්පනා කරන්න. ඇයි ලොකු රස්සා පොහොසතුන්ටම දීලා පැත්තකට වෙන්නද ආස?”

සර් එහෙම කියලා පංතියෙන් බැහැලා ගිහින්. සර්ගේ ඇස් දෙකේ කඳුළක් තියෙනවා මේ දුව දැක්කා. ඊට දවස් දෙකකට පස්සේ මේ දුව සර් ළඟට ගියාලු.

**“සර් මට කතාවක් කියන්න තියෙනවා. මේක මට කියන්න හිතුණේ එදා කුවේණිගේ කතාව සර් කියපු දවසේ. සර් මං දහය පංතියෙදිම කොල්ලෙක් එක්ක යාළු වුණා. මට ඕන වුණේ ඉකිමණින් කසාදයක් කරගෙන හේනක් කොටලා ජීවත්වෙන්න. එදා සර් කිව්වනේ කුවේණි එයා තෝරාගත් විජය ගැන හෙව්වේ නෑ කියලා. ඇත්තමයි මං යාළුවෙච්ච කොල්ලා ගැනත් මං මෙලෝ දෙයක් දන්නෙ නෑ. අන්තිමට වැරදි තීන්දුවක් අරන් කුවේණි වගේ මට මැරෙන්න බැහැ සර්. මං කොහොමද සර් ජීවිතය දිහා බලන්නේ?”**

එතකොට සර් මේ දුවට මෙහෙම කිව්වාලු “දුවට බැරිද ඒ පිරිමි ළමයා මගේ ළඟට එක්කරගෙන එන්න?” දුව හා කිව්වා. ඒත් එයිද කියලා සැකයි. ඒත් ඒ කොල්ලා සර් මුණගැහෙන්න ආවා.

“පුතා මේ දුව මට ඔක්කොම කතාව කිව්වා. කොහෙද පුතාගේ ගෙවල්? මොනවද අම්මා තාත්තා කරන්නේ? ඔය දෙන්නා මේ වයසෙදි පැනලා ගියොත් දෙන්නම පරිවාසෙට දානවා. ඒ හින්දා මං පුතාටත් දුවටත් උපදේශයක් දෙන්නම්. දැන් පුතා ඔයාලට ඕනනම් පැනලා යන්න පුළුවන්. එතකොට හේන් කොටලා ගංජා

දෙන්නා ඊට පසුවද ගුරුතුමාව හමුවුණා. සර්ට පොරොන්දු වුණා සර් කිව්ව අරමුණට ඉලක්කයට යන්න. පස්සේ දෙන්නම වෛද්‍ය විද්‍යාලයට තේරුණා. අම්මලා තාත්තලා නොපෙන්වන ලෝකයක් ගුරුවරයෙකුට පෙන්වන්න පුළුවන්.

‘අපේ සඳමාල් සර් අපිට ගුරුවරයෙක් නෙවෙයි සර් අප්පච්චි කෙනෙක්’ ඒ දුව එහෙමයි කිව්වේ.

**‘වෙදු සිහිවෙන්නෙ ලෙඩ දුක් ආ දට**
**බුදුහිමි සිහිවෙන්නෙ පුර හඳ ආ දට**
**පන්දම් සිහිවෙන්නෙ කළුවර ආ දට**
**ගුරුවරු නම් අනේ මට නම් මගේ අම්මාය’**

සමහර වෙලාවට අම්මලා තාත්තලාගෙන් ගිලිහෙන දරුවන්ගේ ජීවිතවලට එළිය ගේන්නේ වෙන කවුරුත් නෙවෙයි. හොඳ ගුරුවරු...

අත්තනායක එම්. හේරත්



# ලොකු මහත්තයෙක් ඕනෑ නම් ලොකු දෑවැද්දකුත් ඕනෑ



**සත්‍යා මට දවසක් පැවසුවා ඔවුන් සමහර දිනවල ඇයට ආහාර පවා නොදෙන බව. එක දිනක් ඇයව රාත්‍රියක් පුරා නිවසින් එළියට දමා තිබුණා**

තමා ප්‍රියකරන පෙම්බරයෙකුගේ පතිනිය වී කුලගෙට යාම බහුතරයක් තරුණ ගැහැනු ළමුන්ට ඇති සිහිනයකි. ඊට ජීවත්වන රට හෝ තත්ත්වය තරාතිරම අදාළ නොවේ. නමුත් විවාහ සම්බන්ධයෙන් අසල්වැසි ඉන්දියාවේ තත්ත්වය මීට වඩා වෙනස්ය. බොහෝ පැතුම් දරාගෙන කුලගෙට යන බොහෝ තරුණියන්ගේ ජීවිතය කෙලවර වන්නේ ඛේදවාචකයකිනි.

22 හැවිරිදි කේරල තරුණියක වූ සත්‍යා තිවාරි ද මනාලියක වී අලුත් නෑදෑයින් පිරිසක් අතරට ගියේ එබඳු පැතුම් ගොන්නක් හිතේ දරාගෙනය. ඇගේ සැමියා සත්‍යාට වඩා වසර 10ක් වැඩිමල් ගුරුවරයෙකු වූ අතර ඔවුන්ගේ විවාහය සිදුවූයේ යෝජනාවකිනි. නමුත් එම විවාහයට අවුරුද්දක් පිරෙන්නට පෙර සත්‍යා ජීවිතයෙන් සමුගෙන තිබුණි.

**"ඇත්තටම සත්‍යා මියගිහින් තිබුණේ සියදිවි නසාගෙන."**

කලක් සත්‍යාගේ සමීප මිතුරියකව සිටි මාධවී දැන් පවසන්නීය.

**"නූගත් වීම හැරෙන්නට තරුණියක ලෙස ඇයට වෙන කිසිඳු අඩුපාඩුවක් තිබුණේ නැහැ. කොහොමත් ගම්වල ගෑනු ළමයි පාසල් නොයාම සාමාන්‍ය දෙයක්. සත්‍යාගේ නෑදෑයෝ විවාහයේදී රත්තරන් ආභරණ ගොඩක් හා අක්කරයකට වැඩි ඉඩමක් දෑවැද්ද හැටියට දුන්නා. ඒත් මාස දෙකක් යද්දි ඇගේ සැමියාට රැකියාවට යන්න අලුත්ම කාර් එකකුත් අරන් දෙන්න ඇගේ දෙමව්පියන්ට සිද්ධ වුණා."**

එසේ නම් සත්‍යාට ආර්ථික අඩුපාඩුවක් තිබී නැත. නමුත් ඇත්ත කතාව ඊට වෙනස්ය. සත්‍යා සියදිවි නසාගෙන තිබුණේ සිය මනාලයා හා ඔහුගේ ඥාතීන් දෑවැද්ද මදි යැයි දිගින් දිගටම වද දීම හේතුවෙනි. (අන් බොහෝ ඉන්දියානු ජෝඩු සේම සත්‍යාත් සැමියාත් ජීවත්වූයේ සිය ඥාතීන් සමඟ එකම නිවසකය.)

**"සත්‍යා මට දවසක් පැවසුවා ඔවුන් සමහර දිනවල ඇයට ආහාර පවා නොදෙන බව. එක දිනක් ඇයව රාත්‍රියක් පුරා නිවසින් එළියට දමා තිබුණා. ඇයට ජීවිතය එපාවීම පුදුමයක් නොවේ."**

සත්‍යා තිවාරිගේ කතාවට සමාන සිද්ධි දිගින් දිගටම වාර්තා වන බව ඉන්දියාවේ පවුල් ජීවිත පිළිබඳ කරන ලද අලුත්ම අධ්‍යනයකින් හෙළි වී ඇත. ඒ හැම එකකම පසුබිමෙහි ප්‍රධාන භූමිකාව වී ඇත්තේ මනාලියගේ දෑවැද්දය. උගත්කම වැඩිවන විට දෑවැද්ද එතරම් වැදගත් ලෙස නොසලකනු ඇතැයි අප සිතුවත් ඇත්තටම සිදු වී ඇත්තේ එහි අනෙක් පැත්තය.

**"මෑත කාලයේ ඉන්දියාවේ පිරිමින් වෙනුවෙන් රැකියා අවස්ථා වැඩිවීමත් සමඟ ඔවුන් ඉල්ලන දෑවැද්දේ විශාලත්වය වැඩි වී තිබෙනවා."**

එසෙ පවසන්නේ දකුණු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජෙෆ්රි වීවර් ය.

මෙය හිතළු ප්‍රකාශයක් නොවේ. ඉන්දියාවේ ග්‍රාමීය ආර්ථික හා සමාජ තත්ත්වය පිළිබඳව දශක නවයක සමීක්ෂණ වාර්තා අධ්‍යනය කිරීමෙන් ලබාගත් නිගමනයකි. ඒ සඳහා ඉන්දියාවේ ජනගහනය අධිකම ප්‍රාන්ත 17ක විවාහක පවුල් 74,000ක් සහභාගී කරගෙන තිබේ.

නව යුවලක් විවාහ වනවිට මනාලියගේ ඥාතීන් විසින් මනාලයාට නිශ්චල හෝ චංචල දේපල ඇතුළත් 'දෑවැද්දක්' ලබාදීම ඉන්දියාවේ සාම්ප්‍රදායික සිරිතකි. එහි වටිනාකම මනාලිය හා ඇගේ පවුල්වල ආර්ථික හා සමාජ තත්ත්වය අනුව අඩු වැඩිවෙයි.

**"අලුත් ඥාතීන් අතර මනාලියට ඇති පිළිගැනීම තීරණය කරන්නේ ඇගේ රූමත්කම හෝ ගුණවත්කම නොවෙයි. ඇයට ලැබෙන දෑවැද්ද අනුවයි. දෑවැද්ද වටිනාකමින් අඩු නම් ඇය නිරන්තරයෙන්ම සිය සැමියාගේ හා ඥාතීන්ගේ අඩන්තේට්ටම්වලට ලක්වනවා. මෙය ඇතැම්විට කෙලවර වන්නේ ඇය සියදිවි නසාගැනීමෙන් හෝ ඝාතනයට ලක්වීමෙන්."**

දෑවැද්ද හුවමාරුව 1961 වසරේ සිට ඉන්දියාව තුළ නීතියෙන් තහනම් කර තිබුණත් තවමත් එය ක්‍රියාත්මක වෙයි. වෙනසකට ඇත්තේ අධ්‍යාපනය හා උසස් රැකියාවලට වැඩිපුර යොමුවීම මගින් ඉන්දියානු පිරිමි ලොකු දෑවැද්දක් ඉල්ලන්නට පෙළඹී සිටීමයි. මේ නිසා 'වැදගත්' රස්සාවක් කරන සැමියකු ලබාගන්නට නම් විශාල දෑවැද්දක් සොයා ගන්නට තරුණියන්ට සිදු වී තිබේ. කෙතරම් රූමත් වුවත් දෑවැද්ද 'බර' අඩු නම් එවැන්නියන්ට සිදුවන්නේ යන්තම් එදා වේල පිරිමසා ගන්නා නූගත් පුද්ගලයෙකු හා දීග යන්නටය.

**"විවාහයෙන් පසුව ඔවුන් මනාලයාගේ ඥාතීන් සමඟ වාසය කිරීමත් මෙම ගැටලුවට එක් හේතුවක්."**

මෙසේ ප්‍රකාශ කරන්නේ මහාචාර්ය වීවර් සමඟ මෙම අධ්‍යනය සිදුකළ වර්ජිනියා සරසවියේ මහාචාර්ය ගෞරව් චිප්ලන්කර් ය.

1960 සිට දශක හයක පමණ කාලය තුළ ඉන්දියානු විවාහවලින් 90%ක්ම සිදු වී ඇත්තේ වැඩිහිටියන්ගේ බලපෑම අනුවය. එසේම ඔවුන්ගෙන් 90%ක්ම විවාහයෙන් පසුව වාසය කර ඇත්තේ සැමියාගේ ඥාතීන් සමඟ එකම නිවසකය. සමහර අවස්ථාවල මනාලියගේ දෑවැද්ද සැමියාට ගැටලුවක් නොවූ අතර එයට බලපෑම් එල්ල කර ඇත්තේ ඔහුගේ දෙමව්පියන් ඇතුළු ඥාතීන් විසිනි.

**"තමන්ගේ ණයතුරුස් ගෙවා දැමීමට, වාහන ගැනීමට පවා ඔවුන් යොදාගන්නේ මනාලියගේ දායාදය. නව යුවලගේ ප්‍රයෝජනය සඳහා නොව මුළු පවුලම ගොඩයාම සඳහා ඔවුන් මෙම දෑවැද්ද ඉල්ලමක් කරගෙන තිබෙනවා."**

කාන්තාවන් ඉහළ අධ්‍යාපනයක් ලබා උසස් රැකියාවලට යොමු නොවීමත් මෙම ගැටලුවට බොහෝදුරට බලපා ඇත. ශ්‍රම බලකායෙන් වැඩි කොටසක් පිරිමින් වීම හේතුවෙන් මේ තත්ත්වය උදා වී තිබේ. වැදගත් යැයි සම්මත රැකියාවල යෙදෙන පිරිමි තමන්ගේ බලය පෙන්වන්නේ ලොකු දෑවැද්දක් ඉල්ලා සිටිති. එවැන්නකු සිය දියණියගේ සැමියා කරගන්නට නම් දෙමව්පියන්ට ලොකු දෑවැද්දක් දෙන්නට සිදුවෙයි.

නමුත් මේ වළෙන් ගොඩයාමේ ඉනිමග ඇත්තේද කාන්තාවන්ගේ අතේය.

**"උසස් රැකියාවන්ට කාන්තාවන් වැඩි වැඩියෙන් යොමු වුවහොත් ඔවුන්ට මෙම ඛේදවාචකය මග හරින්නට පුළුවනි. එයට කෙතරම් කාලයක් ගතවේදැයි කියන්නට බැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් කාන්තා සංවිධාන මෙන්ම රජයත් මීට වඩා උනන්දු විය යුතුයි."**

මහාචාර්ය ගෞරව් පවසයි.

එසේ නොවුවහොත් සත්‍යා තිවාරි මෙන් බොහෝ තරුණියන්ට සිය දිවි නසාගැනීමෙන් සිය ඉරණම විසඳගන්නට සිදුවනු ඇත.

■ වසන්ත විජේරත්න

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
සජීවී සංගීතය සමඟින්
ප්‍රයිඩ් රයිස — සඳුදා
රයිස් ඇන්ඩ් කරි — අඟහරුවාදා
කහ බත් — බදාදා
රයිස් ඇන්ඩ් කරි — බ්‍රහස්පතින්දා
බිරියානි — සිකුරාදා
එකක මිල රු.455/=
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )

# බුදු මහත්තයෝ 11ට කලින් නඩුව ඉවර කරන්න

## කඩුගන්නාව බෝම්බකරු අවසන් වතාවට නීතීඥයාගෙන් ඉල්ලයි



ප්‍රේමය විවිධ ස්වරූපයෙන් පැමිණෙයි. එයට අර්ථ නිරූපණ දීම අසීරුය. එහෙත් ප්‍රේමයේ නාමයෙන් කිසිවකුගේ ජීවිතය උදුරා ගැනීමට කිසිවකුට අයිතියක් නැත. කඩුගන්නාව තැපැල් බෝම්බය පිළිබඳ කතාව පනහ දශකයේදී මෙරට දැඩි කතාබහට ලක්වූවකි. දෙවන ලෝක යුද සමයේදී ජපන්නු අහසින් බෝම්බ හෙළූහ. එහෙත් කඩුගන්නාව දෙදරා ගියේ තැපෑලෙන් පැමිණි බෝම්බයකිනි. එයද පාසල් සිසුවකු ඉලක්ක කර ගනිමිනි. ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අද අදහස් දක්වන්නේ ඒ පිළිබඳවයි. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රි (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. රටේ සුප්‍රසිද්ධ නඩු කටයුතු ආශ්‍රිතව ඔහු ලබාදෙන අදහස්ද බෙහෙවින් වැදගත් වේ. මෙම ලිපියද ඔහුගේ වටිනා දැනුම් සම්භාරය ඇසුරෙන් ලියූවකි.

**21 කොටස**

### මහනුවර උසස් පාසලකට පැමිණි තරුණ සිසුවා

සමරසිංහ කෑගල්ලේ සිට මහනුවරට පැමිණියේ නගරයේ උසස් පාසලක අධ්‍යාපන වරම් ලබමිනි. එය ඔවුන්ගේ පවුලටද සතුටුදායක සිදුවීමකි. මහනුවරට පැමිණි සමරසිංහට පාසල් නේවාසිකාගාරයේ ඉඩක් ලැබුණේ නැත. ඒ අනුව බෝඩිමක නැවතීමට සිදුවිය. එහෙත් එම ස්ථානය ඔහුට ගැළපුණේ නැත. එහිදී ඔහුගේ ඥාතියකු වූ කොඩිකාරආරච්චි වහා ඉදිරිපත් විය. ඔහුගේ දැන හැඳිනීම මත ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය ජයවර්ධන නම් අයෙකුගේ සාප්පුව පිටුපස කාමරයක් සිසුවාට ලැබිණ. එම නවාතැන සුදුසුය. ආරක්ෂිතය. නවාතැනේ හිමිකරුවා හොඳින් සලකන්නේය. රැක බලාගන්නේය. එනිසා වඩා සුව පහසුව රැඳී සිටීමට සේම පාසල් ගමනටද එය පහසුවකි. සමරසිංහ ප්‍රියමනාප, කඩවසම් යෞවනයෙකි. නවාතැන හිමිකරුවා වූ ජයවර්ධනගේ ආදරය දයාව සිසුවාට වැඩියෙන් ලැබීමට එයද හේතු වන්නට ඇත. සිසුවාට මෙන්ම පවුලේ අයටද එය අස්වැසිල්ලකි.

### ජයවර්ධනගේ ආලය

සමරසිංහ කෙරෙහි ජයවර්ධනට වූ ආදරය කෙමෙන් කෙමෙන් වෙනත් ස්වරූපයකට පෙරළෙන්නට විය. එය ලිංගික බලපෑමක් දක්වා දුරදිග ගියේය. සමරසිංහට මෙය මහා කරදරයකි. ඔහුට අවැසි වූයේ වහාම නවාතැන වෙනස් කිරීමටයි. ජයවර්ධනගේ ටේලර් සාප්පුවට පිරිමි ළමුන්ගේ පැමිණීම වැඩි බවටද තොරතුරු තිබිණ. අවිවාහකයකු වූ ජයවර්ධන සතුව ජේම්ස් වර්ගයේ රතු පැහැති මෝටර් බයිසිකලයක් විය. එය පාසල් සිසුන්ගේ ආකර්ෂණයට හේතු විය. ජයවර්ධන ඔවුන් එහි නංවාගෙන ගිය බවටද තොරතුරු ලැබිණ. තමන්ටද ජයවර්ධන යම් යම් ලිංගික අතවර කළ බව එම දරුවන් පසුව පවසා තිබේ.

### ලිපි මගින් ඉල්ලීම්

ජයවර්ධනගේ නවාතැනට සමරසිංහ පැමිණියේ 1945 දීය. ජයවර්ධනගේ වැඩි ආදරයද තෑගිබෝගද සමරසිංහට රිස්සුවේ නැත. 1946 අප්‍රේල් නිවාඩුවට සමරසිංහ ගෙදර ගියේ ඒ අප්‍රසන්න හැඟීමද හිතේ තබා ගනිමිනි. තමා නව නවාතැනක් සොයාගන්නා බවද ඔහු ජයවර්ධනට ඉඟි කළේය. එය ජයවර්ධනට දරාගැනීමට නොහැකි තත්ත්වයක් විය. ඒ අනුව ඔහු සමරසිංහට ලිපියක් යැවීය. තෑගිබෝග ගැනද, තමා ඔහුට ආදරය කළ අයුරුද, ඔහු නැතිව තමාට ජීවත් විය නොහැකි බවද ජයවර්ධන එහි සඳහන් කර තිබිණ. එය සමරසිංහ ගණනකට නොගත්තේය. පසුව තවත් ලිපියක් ලැබිණ. ඉන්දියාවේ සවාරියක් යාමට ඉන් ඇරයුම් කර තිබේ. එයට සමරසිංහගෙන් ප්‍රතිචාරයක් නොවූ තැන ජයවර්ධන තවත් ඉල්ලීමක් කළේ ය. ඒ, 'කඩවුණු පොරොන්දුව' චිත්‍රපටය නැරඹීමට තමා සමඟ යාමට එන ලෙසයි. ඊටද යහපත් ප්‍රතිචාරයක් නොවීය. අනතුරුව සමරසිංහට ජයවර්ධනගෙන් ලැබුණේ තර්ජනාත්මක ලිපියකි.

**"මං ඔයාගේ හොඳම යාළුවා වෙනවා. නැත්තම් නරකම හතුරා වෙනවා."**

යනුවෙන් එහි ලියා තිබිණ.

මේ තර්ජන හේතුවෙන් සහ අලුත් තැනක් සොයාගැනීමට නොහැකි වීම හේතුවෙන් සමරසිංහ නිවාඩුව අවසන් වී යළි ජයවර්ධනගේ ටේලර් සාප්පුවටම ගියේය. ඒ අතරතුර තවත් තැනක් සෙවූවද එය සාර්ථක නොවීය.

### නව නවාතැනක්

දෙවන පාසල් වාරය අවසන් වීමෙන් පසු සමරසිංහ අගෝස්තු නිවාඩුවට ගෙදර ගියේ කෙසේ හෝ වෙනත් නවාතැනක් සොයා ගැනීමේ අරමුණෙනි. ඒ ගැන ඉව වැටුණු ජයවර්ධන සමරසිංහගෙන් ලිපියක් මගින් විමසුවේ ඔහුගේ නිවසට එන්නද යනුවෙනි. පළමු වතාවට ජයවර්ධනට සමරසිංහ පිළිතුරු ලිපියක් එව්වේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර බැන වදිමිනි. එය ජයවර්ධනගේ දැඩි කෝපයට හේතු විය.

**"මං බිම වැටිලා මැරුණත් ඔයාගෙ ගෙදර පස් පාගන්නෙ නෑ. ඔයා දැනගන්න. මං නමින් විතරක් නෙමේ, ක්‍රියාවෙනුත් ජයවර්ධන."**

යනුවෙන් ඔහු සමරසිංහට ලියූවේ ඒ අනුවය.

මේ ලිපිය සමඟ ජයවර්ධනගේ හැසිරීම ප්‍රශ්න සහගත බව සමරසිංහගේ පවුලේ උදවියටද පෙනී ගියේය. ඒ අනුව නැවත කොඩිකාරආරච්චිගේ උදව්වෙන් දරුවා වෙනුවෙන් නව වාසස්ථානයක් සොයාගත්තේ ආරක්ෂාව ගැන සලකමිනි. එවර සමරසිංහ නැවතුණේ අල්විස් නමැත්තෙකුට අයත් තැනකයි. එය ආරංචි වන ජයවර්ධන සමරසිංහට පමණක් නොව අල්විස්ටද තර්ජනය කළේය. වරක් ඔහු ඒ සඳහා කිණිස්සක්ද රැගෙන ගියේය. එය අල්විස්ටද කරදරයක් විය. එබැවින් සමරසිංහ තවදුරටත් රඳවා ගැනීමට ඔහු අකමැති විය. එබැවින් සමරසිංහට කඩුගන්නාවට පැමිණීමට සිදුවිය. එය ගරාජයකට අයත් ගොඩනැගිල්ලක ඉහළ මාලයේ කාමරයකි. පහසුව මෙන්ම පාසලට ඇති දුර අනුවද එය සමරසිංහට නොගැළපිණ. එහෙත් කළ යුතු වෙන යමක් නොවූ බැවින් ඔහු එහි රැඳී සිටියේය.

### පහරදීමක්

මේ සියල්ල මෙසේ සිදුවන අතර කාලයේ දිනක් මහමගදී ජයවර්ධනට සමරසිංහ හමුවිය. එහිදීද යළි තමා වෙත එන ලෙස ඔහු සමරසිංහගෙන් ඉල්ලීය. ඊට සිසුවා එකඟ වූයේ නැත. ඒ ගැන ජයවර්ධන සිය කේන්තිය මුදුහැරියේ සමරසිංහට පහරක් ගසමිනි. එයට සමරසිංහ පොලිසියේ පැමිණිල්ලක්ද දැමීය. ඊට පැවරූ නඩුවෙන් ජයවර්ධන වරදකරු විය. ඔහුගේ සිතේ වූ කේන්තිය, වේදනාව තදබල වෛරයකට පෙරළිණ.

**නීතීඥ ඊලියන් පෙරේරා පසුව පවසා තිබුණේ මිනීමැරීම් නඩුවකදී මෙතරම් සැහැල්ලුවෙන් සිටි චූදිතයකු සිය වෘත්තීය ජීවිතයේදී දුටුවේනම් ඒ ජයවර්ධන බවයි**



කඩුගන්නාව නගරයේ පැරණි දසුනක්

### තැන තැන තර්ජන

ජයවර්ධන සමරසිංහට විවිධ අයුරින් තර්ජනය කළේය. "කරන දේ බලාගනිං" යනුවෙන් ඔහු සමරසිංහට පවසා තිබිණ. තමා බෝම්බ සෑදීමට දන්නා බවත් සමරසිංහට බෝම්බයක් යවන බවත් ඔහු ඇතැම් අවස්ථාවල පවසා තිබේ. එනිසා සමරසිංහගේ පවුලේ සාමාජිකයෝද දැඩි අවධානයෙන් පසුවූහ. ජයවර්ධන මිතුරකුගෙන් ජෙලග්නයිට් කූරු ඉල්ලා තිබුණේද ඒ අතරවාරයේය. 1948 ජනවාරියේ දිනක මුණගැසුනු අයෙකු ජයවර්ධනගෙන් සමරසිංහ ගැන විමසා තිබේ.

**"මං එයාට තෑග්ගක් යැව්වා."**

ඒ, ජයවර්ධනගේ පිළිතුරයි.

### තැපෑලෙන් ආ මාරයා

ජයවර්ධන ජ්‍යොතිෂය දැඩි සේ විශ්වාස කළේය. ඔහු සමරසිංහගේ කේන්දරය පරීක්ෂා කර ඔහුගේ අපල කාලයද සොයාගෙන තිබිණි. කෙසේ වෙතත් සමරසිංහ නොදැනම ඔහුට



**බෝගම්බර මගහැර වැලිකඩ දී එල්ලන ලෙස ඉල්ලීමක්**

නරක කාලයක් උදාවෙමින් තිබිණ. 1948 ජනවාරියේ දිනක කොළඹ තැපැල් ස්ථාන දෙකකින් පාර්සල් දෙක බැගින් තැපෑලට දමා තිබේ. කඩුගන්නාවේ සමරසිංහ නමටද එකක් විය. පාසල් ඇරී නවාතැනට පැමිණි ඔහුට එය ලැබිණ. පාර්සල් විවෘත කිරීමේ අවදානම ගැන කතාබහ කර තිබුණද පාසල් සිසුවකු වූ සමරසිංහට එය මදකට අමතක වන්නට ඇත. ඔහු දැඩි ආසාවෙන් පාර්සලය විවර කළේය. ඒ සමඟ ආ දැඩි ශබ්දය සමඟ පහළ ගරාජයේ රැඳී සිටි පිරිස වහාම ඉහළ මාලයට ගොස් ඇත. ඒ වෙද්දීත් සමරසිංහට දෑත් අහිමි වී තිබිණ. වහාම ඔහු රෝහලට රැගෙන ගියද සමරසිංහගේ දිවි රැකුණේ නැත. සමරසිංහගේ ඥාතීන්ටද පාර්සල් යවා තිබුණද විවිධ හේතු මත ඔවුන් කිසිවකුට අනතුරක් නොවීය. මෙම පාර්සල් හතරේම 'PULL' යනුවෙන් සඳහන් කර තිබිණ. රජයේ අත්අකුරු පරීක්ෂකවරයා පසුව සඳහන් කර තිබුණේ ඒ සියල්ල එකම අයෙකු ලියූ බවයි.

### එල්ලුම් ගස් යාම කේන්දරයෙන් නොදුටු විත්තිකරු

හෙළි වූ කරුණු අනුව සමරසිංහ ඝාතනය සම්බන්ධව ජයවර්ධනට එරෙහිව නඩු පැවරිණ. මහනුවරදී නඩුව විභාග කෙරුණේ ජූරි සභාවක් ඉදිරියේය. මෙම නඩුව විභාගයට ගත වූයේ දින අටක් පමණි. සමරසිංහගේ ගමේ සිටි තරහකාරයකු මෙය කළ බවට ඇඟවීමටද විත්තිය උත්සාහ කළේය. ඇසූ දුටු සාක්ෂි කිසිවක් නොවූ මෙම නඩුව සම්පූර්ණයෙන්ම රඳා පැවතියේ පරිවේෂණීය සාක්ෂි මතයි. ඊලියන් පෙරේරා ජ්‍යේෂ්ඨ නීතීඥවරයා ජයවර්ධන වෙනුවෙන් පෙනී සිටියේය. ඔහු පසුව පවසා තිබුණේ මිනීමැරීම් නඩුවකදී මෙතරම් සැහැල්ලුවෙන් සිටි චූදිතයකු සිය වෘත්තීය ජීවිතයේදී දුටුවේනම් ඒ ජයවර්ධන බවයි. අවසන් දිනයේදී නඩුවට පෙර ඊලියන් පෙරේරා සිය සේවාදායකයා හමුවිය. එහිදී ජයවර්ධන අපූරු ඉල්ලීමක් කළේය.

**"කොහොම හරි මහත්තයෝ අද එකොළහට කලින් ජූරි සභාවෙ තීරණය ගන්න ඕනෙ."**

එය කළ නොහැකි බව නීතීඥවරයා පහදා දුන්නේය.

**"තව සාක්කිකාරයො දෙන්නෙකුත් කැඳවන්න තියෙනවා. මං හරස් ප්‍රශ්න අහන්නත් ඕනෙ. ඒ නිසා කීයටවත් එකොළහට කලින් ඕක කරන්න බෑ"**

**"අනේ මහත්තයෝ මේක කොහොම හරි කරන්න ඕනෙ. නැත්තං මං අමාරුවේ වැටෙනවා. එකොළහ පහුවුණොත් මට එල්ලුම් ගස් යන්න වෙනවා."**

ජයවර්ධන තම ග්‍රහ කේන්දරයට අනුව විශ්වාස කළේ පෙරවරු 11 ට පෙර ජූරියේ තීන්දුව ලැබුණොත් තමාට එල්ලුම් ගස් යාමට නොවන බවයි. ජ්‍යොතිෂය විශ්වාස කළද නොකළද නීතීඥවරයා සිය සේවාදායකයාගේ ඉල්ලීමටද ඇහුම්කන් දිය යුතුය. උසාවි කටයුතු උදෑසන 9.30ට ඇරඹිණ. පැමිණිල්ල සාක්ෂිකරුවන් දෙදෙනෙකු කැඳවා තිබේ. වේලාව ඉතිරි කරගත යුතු බැවින් ඊලියන් පෙරේරා නීතීඥවරයා හරස් ප්‍රශ්න ඇසුවේ නැත. විනිසුරුගේ දේශනයද සිදු කෙරිණ. ඊලියන් පෙරේරා සිය දේශනය සඳහා නැගී සිටින විට උදෑසන 10.20 පමණ විය. ඔහු කෙටි දේශනයක් කරමින් සිය සේවාදායකයාගේ නිවැරදි බව පැහැදිලි කළේය. පසුව තීරණය ගැනීම සඳහා ජූරි සභාව 10.40ට නිල කාමරයට ගොස් තිබේ. ඔරලෝසුවේ 11 සටහන් වනවිටද ජූරි සභාව පිටතට පැමිණියේ නැත. එහිදී සියලු බලාපොරොත්තු සුන් වූ බව ජයවර්ධනගේ මුහුණින් පෙනිණ. ජූරි සභාව සිය තීන්දුව සමඟ පිටතට පැමිණියේ 11.05ටයි. ඒ අනුව නඩුව පවත්වාගෙන යාමට තීරණය කෙරිණ. පිටතට පැමිණි පසු ජයවර්ධන සිය නීතීඥයාට කතා කළේය.

**"මං මහත්තයාට මුකුත් කියන්නෑ. මේක තමා මගේ දෛවය."**

නඩුව අවසන් වූයේ ජයවර්ධනට එරෙහිව 1949 මැයි 20 ද මරණ දඬුවම නියම කිරීමෙනි. ඊට එරෙහිව අභියාචනා කළද සාර්ථක වූයේ නැත. 1950 මාර්තු 18 වනදා චූදිතයාගේ ඉල්ලීම මත බෝගම්බර වෙනුවට වැලිකඩදී ඔහු එල්ලා මරා දැමීමට පියවර ගැනිණ. තමා දන සිටි නැකැත් සාස්තරය මඟින් ජයවර්ධනට එය නොපෙනෙන්නට ඇත. නොඑසේනම් සොබාදහම ඊට වඩා ප්‍රබල වූවා විය හැකිය.

■ **නීතීඥ රජනිකා ලියනගේ**





**කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී පද පේළි 4කින් යුත්**

**එක් කවියක් පමණක්**

**යොමු කිරීමට කාරුණික වන්න.**

### කවිකාර කොමලිට

උප්පැන්නේ හැටියට නමගත් කොමලී
හැප්පෙන එකත් සතුටකි උනමුත් කිඹුලී
පුප්පන නිසා කවියෙන් කියමින් හැවිලී
තිප්පිලි කසායකි මේ නොමැතිව කැවිලී

කවියෙන් කලාවෙන් කිසිවිට නොවන ගැතී
සවියෙන් යුතුව පෙරටම යන ගතිය ඇතී
ඇරයුම් ඔබේ පිළිගම් කර ඔබට තුතී
එහෙනම් හැප්පෙමුද හැරද කොමල ගතී

සරසවියගෙන් දයාදය ලෙස ලැබුණ
හරබර කවි ගොතා ඇත රසවෙන් පිරුණ
නරකට හොඳට දෙකටම හදවත ඇරුණ
බර ඇරගනිමු අරගෙන කවි අවි පරණ

සෝමා වැලිකල
කන්තලේ

සෝමක්කේ එපා වෙන්නට දැන් උරණ
ෆිට් බොඩියක්ය ඇත්තේ මට නම් අරුම
බර ඇරගන්න ඕනෑ නම් වී තරුණ
ජිම් එකකට යන්ට හැර ගති ඇල් මැරුණ

කොමලි කියයි එයා අනේ යස හැඩකාරී
ඒ මදිවට දෙවෙනි වෙන්නෙ නැති කවිකාරී
කවියෙක්මයි පෙම් කරන්නෙ හරි කටකාරී
එපා වැඩිය ළංවෙන්නට හරිම වදකබාරී

ලීලා කේ. ජයසූරිය
විගොඩ
බෙම්මුල්ල

ඉතිහාසයෙත් ඔය ගති වෙන්සක් වී කොහිද?
ගෑනුන් හට කතා හැදුවෙ ගෑනුම නොවෙද?

**ඔබේ කවි අභියෝග**

කොමලිගේ කොලමට එවීමේදී 0712808985 හෝ dharanee.editor@liberty.lk යන ඊමේල් ලිපිනයට යොමු කරන්න.
නැතිනම්,
කොමලිගෙ කොලම, ධරණී පුවත්පත, නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන ලිපිනයට එවන්න

# බෝධිසත්වයෙක් වගේ මිනිහෙක් නොසලකා හරින්න ඒ ගෑනු චංචි මානවිකාවද?



රැකියාවක් හොයාගෙන සාරා කොළඹට ආවේ සුනාමියට හරියටම සතියකට කලින්. දකුණු පළාතේ වක්වැල්ල කිට්ටුවට වෙන්න පිහිටලා තිබුණු ඇගේ නිවහන ඊට සතියකට පස්සේ සුනාමි රළ පෙළ විසින් උදුරාගෙන ගිහින් තිබුණා. දවසකට වේලක් නැත්නම් බොහොම කලාතුරකින් දෙවේලක් කාලා බඩවියත රැකගෙන හිටපු සාරාගේ අම්මයි, තාත්තායි, නංගියි තුන්දෙනාමත් ඒ රළ පෙළ විසින් අරන් ගිහින් තිබුණා. තමන් වාසනාවන්තයිද නැත්නම් අවාසනාවන්තයිද කියන එක ගැන සාරාට නිච්චියක් තිබුණේ නෑ. පළවැනි පඩියෙන් ගෙදර ඉඳපු අහිංසක ප්‍රාණීන් තුන්දෙනා සතුටු කරන විදිය ගැන හීන මව මවා ඉඳපු සාරාට සිද්ධ වුණේ ඒ පඩිය ලැබෙන්නත් කලින්ම හිතවන්තයින්ගෙන් ලැබුණු මුදල් එක්කාසු කරලා ඒ අයට මතක වස්ත්‍ර පූජා කරන්න.

කොළඹ නුහුරු නුපුරුදු වටපිටාව, ආගන්තුක මිනිස්සු, තමන්ගේම කියන අයගේ වියෝව කියන මේ හැමදේම නිසා ඇය හිටියේ තෝන්තු වෙලා වගේ. මහා හුඟක් බලාපොරොත්තු ඇයට තිබුණේ නෑ. තමන්ට දැන් ඉතිරි වෙලා තියෙන්නේ ජීවත්වෙනවාද මැරෙනවද කියන එක තීරණය කරන්න විතරයි කියලයි ඇයට හිතුණේ.

ඒ අතරතුරේ ජංගම දුරකතනය නාද වුණාත් ඒ කවුද කියලා බලන්න තරම් උවමනාවක් සාරාට තිබුණේ නෑ.

'ලොකු පුංචි වෙන්නැති' ඇය හිතුවේ එහෙම. දැන් ගමෙන් කියලා ඇමතුමක් දීලා සුව දුක් අහන්න ඉන්නේ ලොකු පුංචි විතරයි. ඒත් මේ වෙලාවේ ඇයටවත් උත්තර බඳින්න සාරට ඕන වුණේ නෑ.

දුරකතනය ආපහු වතාවක් නාද වෙන්න ගත්තා. කෝකටත් කියලා ෆෝන් එක අතට අරගෙන බලද්දී නොදන්නා අංකයකින් ඇමතුමක්... ගන්නවද? නැද්ද? ඕන එකක් කියලා ඇය ෆෝන් එක කනේ තියාගත්තා.

**"සාරා... මම සම්පත්. අකවුන්ට් ඩිපාර්ට්මන්ට් එකේ..."**

එහෙම කිව්වට සාරාට ඒ කවුද කියලා නිච්චියක් නෑ. ඒත් ඇය ඒ බවක් නොපෙන්වා කතා කළා.

**"ආහ් සම්පත්... කියන්න."**

**"ඔෆිස් එකේ වට්ස්ඇප් ගෲප් එකේ පහුගිය සතියේ සමරි එක ගැන පොඩි චැට් එකක් යනවා. ඔයාගෙ අකවුන්ට් අප්ඩේට් එකක් ගැන මැනේජර් ප්‍රශ්නයක් අහලා. ටික වෙලාවක් ගිහිල්ලත් ඔයා ඒකට උත්තරයක් නොදීපු නිසයි මම ඔයාට කෝල් කළේ. වෙන කෙනෙක් නම් කමක් නෑ. මැනේජර් නිසා උත්තර නොදී ඉන්න එක හරි මදිනේ."**

සාරා පියවි සිහියට ආවේ ඊටපස්සේ. ඇත්ත නේන්නම්. වට්ස්ඇප් ගෲප් එකේ සෑහෙන්න ලොකු සංවාදයක්. කළමනාකරුගේ පණිවිඩයට උත්තර නොබැඳ ටික වෙලාවක් ගතවීම ගැන ඇයට කණගාටුවක් වගේම තැතිගැන්මකුත් තිබුණා.

**"අනේ බොහොම ස්තූතියි සම්පත්. මම ෆෝන් එක බලලා තිබුණේ නැහැ ගොඩක් වෙලාවකින්. මම දැන්ම ඒකට reply කරන්නම්."**

එහෙම කියපු සාරා දඩි බිඩි ගාලා කෝල් එක කට් කරලා වට්ස්ඇප් ගෲප් එකේ ඇයගෙන් විමසලා තිබුණු පැනයට පිළිතුරු දුන්නේ ප්‍රමාදය ගැන සමාව හජනය කරන ගමන්.

කොහොමින් කොහොමහරි 'මැරෙනවාද? ජීවත් වෙනවාද?' කියලා හිත හිතා හිටපු කෙල්ලගේ සිතුවිලි දැහැන බිඳිලා ඊළඟ දවසේ කාර්යාලයට ගිහින් කරන්න තියෙන වැඩ කොටස ගැන සිහිවෙන්න පටන්ගත්තා. සම්පත් කතා නොකරන්න තව පොඩ්ඩෙන් කළමනාකරුගෙන් හොඳ දෝස්මුරයක් අහගන්න වුණත් ඉඩ තිබුණා. එහෙම නොවුණොත් වෙන්නේ සාරා මේ දවස්වල ඉන්න මානසික තත්ත්වය ගැන ඒ හැමෝටම අවබෝධයක් තිබුණු නිසා මිසක් වෙන හේතුවක් හින්දා නෙවෙයි. කොහොම වුණත් සම්පත්ගෙ ඒ කාරුණික බවට සාරා හදවතින්ම සතුතිවන්ත වුණා.

ඒ ඇතිවුණු පැහැදීම නිසාම පස්සෙන් පහුව කාර්යාලයේ සාරාට ඉන්න හොඳම යාළුවා වුණෙත් සම්පත්. මේ දෙන්නගේ යාළුකම ගැන සමහර උදවිය කට කැඩිච්ච කතා එහෙම නොකිව්වත් නෙවෙයි. ඒවා ඉතින් මොන ඔෆිස් එකෙත් පොදු කාරණානේ. හැබැයි යාළුකමට එහා ගිය ගනුදෙනුවක් තිබුණේ නැති නිසා සාරා ඒ කටකතා ගැන ඒ හැටි වද වුණේ නෑ.

**"ඇයි හැමදාම කඩෙන් කන්නේ? වයිෆ් උදේට උයන්නේ නැද්ද?"**

දවසක් දවල් කෑම කන වෙලාවක සාරා, සම්පත්ගෙන් එහෙම ඇහුවෙ නිකමට වගේ. කසාද බැඳලා කියලා දන්නවා වුණාට ඔහුගේ පවුල් ජීවිතය ගැන වැඩි යමක් මීට පෙර කවදාවත් කතා වෙලා තිබුණේ නෑ.

**"උදේ විතරක් නම් බැරියෑ. තුන්වේලම මම කන්නේ කඩෙන්."**

සම්පත් හැමදාම රෑට පොඩි ඩ්‍රින්ක් එකක් දාලා රෑ වෙලා ගෙදර යන බව කියලා තිබුණාට ඒ පවුලේ ප්‍රශ්නයක් තිබුණු බවක් සාරා දැනගෙන හිටියේ නෑ. බිරිඳගේ නොසළකා හැරීම් ගැන එදා තමයි සම්පත්, සාරා එක්ක විස්තර කිව්වේ. ඒ නිසා බෝඩිමේ කොහොමත් උයන එකනෙ කියලා පහුවදා උදේ උයලා ඉවරවෙලා ඇය සම්පත්ටත් එක්ක බත් මුලක් බැඳ ගත්තා. බත් මුල දෝතින්ම සම්පත්ට දෙද්දී ඔහුගේ ඇස්වල දිලිසුණු කඳුළු දැකලා සාරාට පුදුමත් හිතුණා.

**"මොකද අනේ? මං වැරැද්දක්වත් කළාද?"**

"මට කවුරුත් මෙහෙම කරලා නෑ සාරා. මගේම ගෙදර මිනිස්සු මං පිටස්තරයෙක් ගානට දාලා සලකද්දි ඔයා මෙහෙම කරනකොට මට දරාගන්න බෑ."

කොහොමින් කොහොමහරි කල් යද්දී ඔය අනුකම්පාව, භූමිකම්පාවක් වෙලා සාරා, සම්පත්ට ආදරේ කරන්න ගත්තා. ඇත්තටම ඔහු හොඳ ගතිගුණ තිබුණු හොඳ පිරිමියෙක්. තමන්ගේ කියලා කාත් කවුරුත් නැති කොළඹ රටේ නෑදෑයෙක් වගේ, සහෝදරයෙක් වගේ ඇයව බලාගත්තේ සම්පත්. එහෙව් පිරිමියෙක්ව නොසලකා හැරීම නිසා සම්පත්ගේ බිරිඳ සම්බන්ධයෙන් ඇයට කොහෙත්ම පැහැදීමක් තිබුණේ නෑ.

පස්සේ පස්සේ මේ දෙන්නගේ සම්බන්ධය කාර්යාලය ඇතුළේත් ප්‍රසිද්ධ රහසක් වුණා. ඔෆිස් ඉවර වෙලා සාරාව බෝඩිමට දාන්න යන සම්පත් සමහරදාට ඇගේ බෝඩිං කමරේම නතර වුණා. අන්තිමට ඇඳුම් කෑලි එක දෙක අරගෙන ආපු සම්පතුත් ඒ බෝඩිං කාමරේම ස්ථිර නවාතැන්කරුවෙක් බවට පත්වුණා. බිරිඳ ඔහු ගැන හොයලා බලන වගක් පේන්න තිබුණේත් නෑ.

ඔහොම ඉන්නකොට එක දවසක නොදන්නා දුරකතන අංකයකින් ඇයට ඇමතුමක් ලැබුණා.

**"සාරා... මම අරුන්දතී... සම්පත්ගෙ වයිෆ්."**

කියන්න ඕන මොනවද කියලා සාරාට හිතාගන්න බැරි වුණා. එන හැටියට ගහ උළුවස්සා කියලා අහන දේකට උත්තර දෙනවා කියලා ඇය හිතාගත්තා.

**"අරුන්දතී... කියන්න."**

සාරාගේත් සම්පත්ගේත් සම්බන්ධය ගැන දැනුවත් බව අරුන්දතී කිව්වා. සම්පත් ගැන බොහෝ චෝදනා ඇයට තිබුණා. ඒත් සම්පත් අරුන්දතීගෙ නොසලකා හැරීම් ගැන කියලා තිබුණු නිසා සාරාට හිතුණේ අරුන්දතී බොරු සිල් රෙද්දක් පොරවාගෙන කතා කරනවා කියලා.

**"අරුන්දතී... ඔයා ඔය කියන ගොඩක් දේවල් සම්පත් මට කියලා තියෙනවා. අනික මාත් එක්ක සම්බන්ධයක් තිබුණත් නැතත් ඔයාගෙන් වෙන්වෙන්න තීරණය කරලයි එයා හිටියේ. ඒ නිසා ඉස්සර එයා කරපු වැරදි ගැන දැන් මට කියන්න එන්න එපා. මට වැදගත් වෙන්නේ එයාගේ වර්තමානය විතරයි."**

එහෙම නොකිව්වොත් තමන්ට මේ හැටි ආදරේ කරන සම්පත් වෙනුවෙන් කරන ලොකු අසාධාරණයක් හැටියටයි ඇය හිතුවේ. ඇත්තටම ඒ වෙනකොටත් සම්පත් දික්කසාද නඩුවකට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරලයි තිබුණේ.

හැබැයි මාස කිහිපයක් ගතවෙද්දී සාරාට සම්පත්ගෙ මොකක්දෝ වෙනසක් දැනෙන්න ගත්තා. ඔහු සාරා ගැන සොයා බලන බව, ඇගේ සතුට වෙනුවෙන් ක්‍රියා කරන බව නිතර කිව්වත් ඔහුගේ ක්‍රියාවෙන් ඒ බවක් පේන්න තිබුණේ නෑ. ඒ විතරක් නෙවෙයි වචනයක් එහේ මෙහේ වුණු ගමන් සම්පත්ට තරහා ගියා. සාරා පිරිමි කෙනෙක් එක්ක යාළුකමට කතා කළත් සම්පත් ඇයව සැක කළා. ඒ නිසා දෙදෙනා අතර සතුට රඳවාගන්න ඔහුට අවැසි විදියට ජීවත්වෙන්න සාරා උත්සාහ කළා. ඇය ස්වාධීන ගතිගුණ තිබුණු යුවතියක්. නමුත් සම්පත් වෙනුවෙන් තිබුණු ප්‍රේමය විසින් ඒ ස්වාධීන බව යටපත් කර සාම්ප්‍රදායික ගැහැනියක් නිර්මාණය කර තිබුණා.

ඔහොම ටිකෙන් ටික කාලය ගෙවෙද්දී සාරාට තේරුම් ගියා මේ දෙදෙනා අතර පවතින සම්බන්ධය රැකගන්න ඇය විසින් පුදුම වෙහෙසක් තනියම දරන බව. ඒ වෙහෙස විසින් ඇයව පීඩාවට පත් කර තිබුණා. සාරාගෙ ඉවසීමේ සීමාව ඉක්මවා ගියා. ඇඳුම් කඩමාලු ටිකත් අරගෙන එහෙව් දවසක සම්පත් එන්න කලින් ඇය බෝඩිම් කාමරයෙන් පිටව ගියා.


ස්ථිර නවාතැනක් සොයාගන්නා තෙක් සාරා ඇගේ මිතුරියගේ නාවාතැනේ තාවකාලිකව නතර වුණා. හිතේ ආවේගයට මෙහෙම තීරණයක් ගත්තත්, සම්පත් හොඳින්ද? කනවද බොනවාද? වගේ දේවල් සිතමින් ඇය නිතර කණගාටු වුණා. මිතුරිය සමඟ ඒ දේවල් පවසමින් ඇය හඬ වැටුණා.

**"ගොනෝ... මෙච්චර කාලයක් ඒ මිනිහගේ රංගනේට අහුවෙලා ජීවිතේ නාස්ති කරගත්තා මදිවටද තව අඬන්නේ? ඌට කිසි ගානක් නෑ. ඕවා හිතන්න තිබුණේ කලින්. කසාද බැඳපු මිනිහෙක් ඇවිල්ලා තනිකඩ ගෑනියෙක් එක්ක කසාද ගෑනිගෙ වැරදි කියද්දී මොලේ කළඳක් හරි තිබුණා නම් උඹට හිතන්න තිබුණා ඇයි ඒ ගෑනි එහෙම කරන්නේ කියලා. කිසිම වරදක් නොකරන බෝධිසත්වයෙක් වගේ මිනිහෙක් නොසලකා හරින්න තරම් ගෑනු චිංචි මානවිකාවොද? මෙතනින් ඉස්සරහටවත් මොලේ කල්පනා කරලා වැඩ කරපං. කරුමෙ උඹව දලා ගියා. ආපහු කරුමෙ පස්සේ දුවන්න තියාගන්න එපා."**

මිතුරියගේ වචන ටිකක් සැරපරුෂ වුණාට අම්මා අප්පා නැති තමන්ට මේ වෙලාවේ මොළේ පාදන්න එහෙව් මිතුරියක හරි ඉන්න එක ගැන සාරා සතුටු වුණා. ඒත් එක්කම ඇයට අරුන්දතී මතක් වුණා. ඇත්ත නේන්නම්. බෝධිසත්වයෙක් වගේ මිනිහෙක් නොසලකා හරින්න තරම් ගෑනු චිංචි මානවිකාවොද?

එහෙම වෙන්න බෑ. සම්පත් කියන්නේ දේවදත්තයෙක්. එහෙව් පිරිමින්ට සකී, මාතෘ භාර්යවෝ ගැළපෙන්නේ නෑ.

■ සුරේෂ් විදානගමගේ



වැනිලා පළමුවරට අහස දෙස බලමින්

# දශක තුනකට පසු අහස දැකලා සතුටින් ඉපිලුණු චිම්පන්සි වැනිලා

'ගාර්ඩියන්ස් ඔෆ් ගැලැක්සි' කියන්නේ හොලිවුඩ්වල සුපිරි වීර චිත්‍රපට මාලාවක්. සුපිරි වීරයන්ගේ කතා ගැන ලොකු කැමැත්තක් නැතත් 2023 ආපු ගාර්ඩියන්ස් ඔෆ් ගැලැක්සි බලන්න ඕන කියලා හිතුණේ ඒ චිත්‍රපටයෙන් සත්ව අයිතිවාසිකම් ගැන කතා කරනවා කියලා ආරංචි වුණ නිසයි.

බැලින්නම් කතාව ඇත්ත. චිත්‍රපටයේ වැඩිපුරම තිබුණේ රසායනාගාරවල දුක් විඳින සතුන්ගේ සංවේදී දර්ශන. ඒ කතාවේ ප්‍රධාන චරිතය තමයි 'රොකට්'. එයා පුංචි රැකූන් කෙනෙක්. රොකට්ට යාළුවෝ තුන්දෙනෙක් හිටියා ලයිලා, ෆ්ලෝරා සහ ටිජ්ස් කියලා. 'ලයිලා' ඔටර් කෙනෙක්. අපි ඔය දියබල්ලා කියලා සිංහලෙන් කියන්නේ. එතකොට 'ෆ්ලෝරා' කියන්නේ හාවියක්. 'ටිජ්ස්' කියන්නේ සීල් මත්ස්‍යයෙකුට. මේ හතරදෙනා ඉන්නේ කූඩුවක. ඉපදුණු දවසේ ඉඳලම කූඩුවේ වහලය විතරක් දැකලා තිබුණු එයාලගේ ඒකම හීනය වුණේ කවදාහරි දවසක අහස දකින එක. හැබැයි ඇත්තටම අහස දකින්න තරම් ලයිලයි, ටිජ්සුයු, ෆ්ලෝරායි වාසනාවන්ත වුණේ නැහැ. මොකද කතාව අන්තිමට පරීක්ෂණාගාරේ ඉඳපු නපුරු මිනිහා එයාලව මරලා දානවා.

මේක කතාවක් විතරයි. හැබැයි අපි මේ ලියමන කියවන මේ වෙලාවෙත් ලෝකේ පුරා පරීක්ෂණාගාරවල කාටවත් වරදක් නොකළ අහිංසක සත්තු මිලියන 115ක් දුක් විඳිනවා. ඒ අයගෙන් මිලියන 110ක් වාර්ෂිකව මරණයට පත්වෙනවා. රසායනාගාර පරීක්ෂණ නිසා ඇමරිකාවේ වාර්ෂිකව මියයන චිම්පන්සි ප්‍රමාණය 1700කට වැඩියි.

මේ අතරතුර ගිය සතියේ ලෝකේම මිනිස්සුන්ගේ හිත් කළඹන සංවේදී වීඩියෝවක් මාධ්‍යට නිකුත් වෙලා තිබුණා. ඉපදුණු දා ඉඳලා අවුරුදු 29ක් කූඩුවක හිරවෙලා ඉඳපු 'වැනිලා' කියන ගැහැනු චිම්පන්සියෙකුට නිදහස ලැබිලා. එළියට ආපු ගමන් ඇය මුලින්ම කරන්නේ පුදුමෙන් වගේ අහස දිහා බලන එක. මොකද ඉපදුණු දවසේ ඉඳලා වැනිලා, අපි දකින මේ නිල් අහස දැකලා තිබුණේ නෑ. වැනිලාට දැනුණු හැඟීම මොනවගේ එකක්ද කියන්න අපි දන්නේ නෑ. හැබැයි ඇය පළමු වතාවට පෙනීම ලද්දියක් වගේ පුදුමෙන් හිනාවෙවී අහස දිහා බලාගෙන ඉන්න දර්ශනය සංවේදී හිත් තියෙන මිනිස්සුන්ගේ ඇස්වලට කඳුළු ගෙනාපු බව රහසක් නෙවෙයි. වැනිලා ඒ විදියට අහස බලාගෙන ඉද්දි මට මතක් වුණේ කතාවේ හිටපු ලයිලා, ෆ්ලෝරා සහ ටිජ්ස්ව. වරදක් නොකර දඬුවමට ලක්වෙන එක මොන වගේද කියලා සත්තුන්ට කියන්න පුළුවන් වුණා නම් ඒ අයත් ඒ අයගේ දුක කියයි කියලයි මට හිතුණේ.

වැනිලා ඉපදිලා තියෙන්නේ ප්‍රයිමේට්ස්වල පරීක්ෂණාගාරයක. ඉපදුණු දවසේ ඉඳලා ඇය ශල්‍යකර්ම රාශිකයට භාජන වෙලා. 1997 දී මේ ශල්‍ය රසායනාගාරය වහලා. එතැන ඉඳලා කැලිෆෝනියාවේ සත්ව රැඳවුම්ගාරයක වර්ගමීටර 1/2යක පුංචි කූඩුවක හිරවෙලයි  ඇය ජීවත්වුණේ.

සිතුවිල්ලකින්වත් කාටවත් වරදක් නොකර අවුරුදු 29ක් සිරගත වෙලා හිටපු වැනිලට ගිය අවුරුද්දේ ෆ්ලොරිඩාවේ 'සේව් ද චිම්පන්සීස්' කියන වැඩසටහන යටතේ ස්වභාවික රක්ෂිතයට යන්න අවස්ථාව ලැබුණා. විද්‍යාගාරවලින්, සර්කස්වලින් එතකොට සත්ව වෙළඳම් ආයතනවලින් මුදවගත්තු චිම්පන්සි තමයි ඒ රක්ෂිතයේ ජීවත්වෙන්නේ.



ගිය අවුරුද්දේ නිදහස් වුණු වැනිලගේ කතාව කරලියට ආවේ ඇමරිකානු සත්ව විද්‍යාඥ ඇන්ඩෘ ගිලියන් පහුගිය සතියේ වැනිලගේ අර සංවේදී වීඩියෝව මුදාහැරියට පස්සෙයි. ඒත් එක්කම අද වෙනකොට ඇය ලෝකයම සංවේදී කළ මාතෘකාවක් වෙලා.

රක්ෂිතේට මුදාහැරපු හැටියේ වැනිලා කූඩුවෙන් එළියට එන්න කැමති වුණේ නැතිලු. රක්ෂිතයේ ඉන්න අනිත් චිම්පන්සි ඇගේ කූඩුව ළඟට ගියාම තමයි වැනිලා එළියට ඇවිත් තියෙන්නේ. එළියට ආපු හැටියේ පුදුමෙන් වගේ අහස දිහා බලාගෙන ඉන්න වැනිලා තමන්ගේ සගයන්ව ආදරෙන් බදාගන්නවා. ඊටපස්සේ ඇය ආසාවෙන් තණකොළ පාගන, ගස් අතගාලා බලන මේ හැම දර්ශනයක්ම වීඩියෝපටයේ අන්තර්ගතයි. කාටත් වරදක් නොකර සිරගත වුණු තව සත්තු ඕනතරම් ඉන්නවා. ඒ හැමෝම වැනිලා වගේ වාසනාවන්ත නැහැ. එයාලට වැනිලට වගේ අහස බලන්න වෙන එකකුත් නැහැ. හැබැයි ඒ හැමෝටම අහස බලන්න පුළුවන් දවසක් එනවා නම් මේ ලෝකේ කොච්චර ලස්සන වෙයිද, නේද?


■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# බයික් එකෙන් බහින්න කිව්වොත් ආදරේ ඉවර කරනවා

## කාවින්ද්‍යා ජෑන්ස් (KJ)







පහුගිය දවසක මං කොළඹ BMICH එක පැත්තේ රවුමක් දැම්මේ වසරේ අතිදැවැන්තම මෝටර් රථ හා යතුරුපැදි ප්‍රදර්ශනය වුණු 'THE MOTOR SHOW 2023' බලන්න හිතාගෙන. හරියටම දවස මතක නැතිවුණාට මීට සති කීපයකට උඩදි තමයි ඒක පැවැත්වුණේ. එදම ත්‍රාසජනක යතුරුපැදි සංදර්ශනේකුත් තිබුණා. කාර් බාර් අස්සේ ගැවසෙනවට වඩා මට ඕනවුණේ ඒක බලාගන්න. මොකද ඉතින් කොයිතරම් හයිරංකාර වාහන තිබුණත් කොල්ලන්ගේ ආසාව දඬු මොනරෙටනේ.

වැඩේ පටන් අරන් විනාඩි විස්සක් විතර යද්දි තමයි හොඳ හොඳ සෙල්ලං එළිවෙන ජාමෙට කියලා කවුරුත් බලාපොරොත්තු නොවුණු අන්දමේ දෙයක් දකින්න ලැබුණේ. ඉලන්දාරි භාෂාවෙන්ම කියනවානම් කොල්ලෝ බයික්වලින් ගින්දර ටිකට වැඩ දද්දි එකපාරට කෙල්ලෙක් මතුවුණා. මේ තාක් කිසිම යතුරුපැදි සංදර්ශනයක කෙල්ලක් දැකලා නොතිබුණු හින්ද මට හිතුණෙම මේ කෙල්ල මොන වගේ අඩව්වක් අල්ලයිද දන්නේ නෑ කියලා. හැබැයි ඉතින් එහෙම හිතපු මට තරු විසිවෙන තරමට ඇයත් එතැන වැඩ පෙන්නුවා. ඒ ඇගේ යතුරුපැදිය තනි රෝදයෙන් පැදගෙන යන ගමන්. ඒ විතරක්නම් බැරියැ, ඇය කොල්ලෝ වැඩදන බයික්වල එල්ලිලා ගියේ එතැන ඉඳපු උදවියට 'මරුවා සමඟ වාසේ' චිත්‍රපටය සිහිගන්වන ගමන්.

මේ ගැහැනු දැරිවිගේ නම තමයි කාවින්ද්‍යා ජෑන්ස්. KJ කිව්වහම තමයි ගොඩක් ඇය ඇයව දන්නේ. පුංචිකමටද වැඩ කියනවා වගේ ඇගේ ලොමු ඩැහැගැන්වෙන විදියේ වැඩ කිඩ දැම්මට මේ දැරිවිට තාම වයස විසිඑකයිලු.

**"මං පුංචි කාලේ හීන දැක්කේ නැටුම් ගුරුවරියක් වෙන්න. ඒත් ඉස්කෝලෙන් අයින් වෙනකොට මට තේරුණා ඒක නෙවෙයි යන්න ඕන පාර කියලා. එහෙම හිතලා තමයි රූපලාවණ්‍ය ශිල්පිනියක් විදියට සැලෝන් එකක් පටන්ගත්තේ. හැබැයි ඔය අතරේ පුදුම බයික් පිස්සුවකුත් මට තිබුණා."**

පාරේ බයික් එකක් ගියත් ඒ කාලෙ කාවින්ද්‍යා ඒ දිහා බොහොම උනන්දුවෙන් බලනවාලු.

"මං මුලින්ම බයික් එකක් පැද්දේ ඉස්කෝලේ 9 පන්තියේ ඉන්නකොට. ඒ අපේ නෑදෑ අයියා කෙනෙක්ගේ CT 100 වර්ගයේ බයික් එකක්. පදින්න ගත්ත පළවැනි දවසෙම මං ඒක පෙරළගත්තා. ඊටපස්සේ ආයෙත් නම් බයික් පදින්නේ නෑ කියලා හිතුවා. ඒත් ඉතින් දවසයි දෙකයි ඒ තීරණේ හිටියේ. ඊටපස්සේ ආයෙත් මං අයියගේ බයික් එක ඉල්ලන් පදින්න ගත්තා."

ඉස්කෝල ගමනට ආයුබෝවන් කිව්වට පස්සේ කාවින්ද්‍යා රූපලාවණ්‍ය ශිල්පිනියක් විදියට සැලුන් එකක් පටන්ගත්තා කිව්වනේ. ඉතින් ඒ අතරතුරේ කොහොමද මේ බයික් සංදර්ශනවලට ආවේ කියලා අපි ඇයගෙන් ඇහුවා.

**"මට යාළුවෙක් හරහා '90 Degrees' බයික් ටීම් එක ගැන දැනගන්න ලැබුණා. අයේෂ් ඇලෙක්ස් තමයි මාව ටීම් එකට ගත්තේ. එතැනදි උගන්වන බයික් ස්ටන්ට් එක්ක මට බයික්වලට තිබුණු ආසාව තවත් වැඩිවුණා."**

කිව්වත් වගේ '90 Degrees' කියන්නේ මේ වෙනකොට ලංකාවේ සුපිරිතම යතුරුපැදි කණ්ඩායමක්. ජූඩ් ඇලෙක්ස් තමයි එතැන ප්‍රධානියා. ඔහු ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ යතුරුපැදි ස්ටන්ට් (ක්‍රියාදම) උපදේශකවරයෙක්. දැනට අවුරුදු 12කට විතර කලින් තමයි ඔහු තමන්ගේ සහෝදරයෝ දෙන්නා වෙච්ච බඩී ඇලෙක්ස්, අයේශ් ඇලෙක්ස් වගේම ක්‍රිෂාන් අරුක්ගොඩ එක්ක ඒක ආරම්භ කරලා තියෙන්නේ. ඒ අතරින් අයේෂ් කියන්නේ ලංකාවේ පළවැනි වතාවට අංශක 90ට තනි රෝදෙන් බයික් එක අරන් ගිය කෙනා. ඒ නිසාම තමයි ටීම් එකට '90 Degrees' කියන්නේ.

"මගේ ජීවිතේ සෑහෙන්න වෙනස්වුණු තැන එතැන. ඒක නිකන්ම බයික් ටීම් එකක් නෙවෙයි. 'Team 90 Degrees Training School Academy' කියලා එතැන අපිට හොඳ පුහුණුවක් දෙනවා. නිහාල් සර්, ශේන් සර්ගේ හංවැල්ල ඇක්ෂන් පාර්ක් එකේ සහ මධුරංග කල්දේරගේ මීරිගම රේසිං ට්‍රැක් එකේ ඒ පුහුණුවීම් සිදුකරන්නේ."

හැබැයි මේ ළඟක් වෙනකල්ම කාවින්ද්‍යයි යතුරුපැදියයි අතරේ තියෙන මේ පලහිලව්වට ඇයගේ ගෙදර අය කවුරුත් කැමතිවෙලා නෑ. ඇයි ඉතින් යතුරුපැදි ස්ටන්ට් කරනවා කියන්නේ එසේ මෙසේ සෙල්ලමක් නෙවෙයිනේ. අනික කෙල්ලෙක් මෙහෙම දෙයක් කරද්දි කොයි අම්මට තාත්තටද බලාගෙන ඉන්න පුළුවන්?

**"මං 90 Degrees එක්ක එකතුවෙද්දි ගෑනු ළමයි කවුරුත් බයික් ස්ටන්ට් කළේ නෑ. ඒ නිසාමයි මට ඒක කොහොමහරි ඉගෙනගන්න හිතුණේ. මුලදි ලේසි වුණේ නෑ. ඒත් පුරුදු වුණා. දැන් නම් බයික් ස්ටන්ට්වල ගොඩාක් දේවල් මට කරන්න පුළුවන්. ඒත් ඉගෙනගන්න තව ගොඩාක් දේවල් තියෙනවා. හැමදේම ඉගෙනගන දවසක ජාත්‍යන්තරයට යන එක තමයි ලොකුම ආසාව වෙන්නේ."**

කාවින්ද්‍යා යන පාරේ යන්න කවුරුම හරි තරුණියක් කැමති නම් ඔවුන්ගේ යතුරුපැදි කණ්ඩායමට එකතුවෙන්න කියලයි ඇය කිව්වේ. ඒ අතරේ යතුරුපැදි ස්ටන්ට් කරන අයට රස්තියාදුකාරයෝ කියන ලේබලේ ගහන ඇත්තන්වත් ඇය මේ විදියට මතක් කළා.

"ස්ටන්ට් කරන එක හැමෝටම කරන්න බෑ. ඒ නිසා ස්ටන්ට් කරනවා කියන්නේ දක්ෂකමක් මිසක් රස්තියාදුකාරකමක් නෙවෙයි."

ලංකාවේ පළවැනි වතාවට යතුරුපැදියක් ස්ටන්ට් කරන තරුණිය විදියට ඒ ආඩම්බරෙත් ඇයගෙන්ම වචන කරගන්න හිතුණේ ඔය අතරේ.

**"ඒ ගැන ලොකු සතුටක් තියෙනවා. මේ වෙනකල් අපේ රටේ බයික් ස්ටන්ට් කළේ කොල්ලෝ විතරයි. ඒත් කෙල්ලන්ටත් ඒක කරන්න බැරි නෑ කියලා මං ඔප්පු කළා."**

ඉතින් යතුරුපැදියෙන් වැඩ දන කාවින්ද්‍යාට ලංකාවෙන් එහාට ගිහින් ජාත්‍යන්තරය අල්ලන්නත් සුබ පතන ගමන් මං ඇයට සමුදුන්නා. ඒත් අන්තිම මොහොතේ මේ ප්‍රශ්නෙත් අහන්නම හිතුණා. ඒ දවසක ඇයගේ අයිතිකාරයා ඇයට යතුරුපැදියෙන් බහින්න කිව්වොත් මොකද කරන්නේ කියලා. ඒකට කාවින්ද්‍යා දුන්නේ මෙහෙම උත්තරයක්.


**"තාම නම් පෙම්වතෙක් නෑ. ඒත් ඉන්න කාලෙක එයා කිව්වොත් බයික් පදින එක නවත්තලා දන්න කියලා මං නවත්තලා දන්නේ ඒ සම්බන්ධය මිසක් බයික් පදින එක නෙවෙයි. මොකද අපි ආස දේවල් කරන්න ඉඩක් නොදෙන ආදරේකින් කිසිම වැඩක් නෑ."**

■ රුවන් එස්. සෙනවිරත්න



# කාලි මෑණියන්ගේ හැඩරුවින් යුතු රූමතියක හමුවීම්





මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

කාලි මෑණියන් ආරූඪ වී ශාස්ත්‍ර කියන කාන්තාවන් මා ඕනෑතරම් දැක ඇත. එහෙත්, කාලි මෑණියන්ගේ ස්වරූපය දරන කාන්තාවක නිකවැරටිය ප්‍රදේශයේ හිඳින බව මට අසන්නට ලැබුණේ පළමු වතාවටය. ඒ උපපොලිස් පරීක්ෂකවරයකුගෙනි. ඔහු වැඩිදුරටත් පැවසූ අන්දමට කාලි මෑණියන්ගේ ආරූඪයෙන් ශාස්ත්‍ර කියන බව පවසන බොහෝ කාන්තාවන් තුළ පවත්නා සටකපටකම් මැය තුළ දක්නට නැත. එසේම මෙම කාන්තාව ශාස්ත්‍ර කීමට කිසිඳු මුදලක් අය නොකරන බවද ඔහු කීය. උපපොලිස් පරීක්ෂකවරයා කී අන්දමට කාලි මෑණියන්ගේ වරම සේම පෙනුමද සහිත මේ කාන්තාව එම ප්‍රදේශයේ පොලිස් කොස්තාපල්වරියකගේ ඥාති සොයුරියකි.

කෙසේ නමුත් ඇය හමුවීමට නිකවැරටියට යාමේ ප්‍රායෝගික දුෂ්කරතාව සැලකිල්ලට ගත් මම ඊට පෙර කිහිප අවස්ථාවක් ඇය දුරකතනයෙන් සම්බන්ධ කරගතිමි.

සාමාන්‍යයෙන් මෙවැනි මෑණිවරුන් සිය ගණනක් හමුවී සහ දුරකතනයෙන් කතාබස්කොට ඇති මට ඔවුන්ගේ වචන උච්ඡාරණය, කතා ශෛලිය, පවසන කරුණු ආදියේ සමාන බව ආදිය කෙරෙහි යම් වැටහීමක් තිබේ. නමුදු මෙම කාන්තාව හා කතා කළ අවස්ථා කිහිපය තුළම මට වැටහී ගියේ ඇය එවැනි අන් සියලු කාන්තාවන්ට වඩා වෙනස් බවය. ඉතා සිහින් අහිංසක කටහඬකින් යුතු ඇය සෙසු මෑණිවරුන් මෙන් දෙඩමලු නොවීමද මගේ අවධානයට යොමුවිය.

**"අපේ ගමේ අක්කා කෙනෙක් දැන් ටික කාලෙක ඉඳලා ගම්පහ, යක්කල ආයුර්වේදයේ නතරවෙලා ඉන්නවා. මමයි අපේ නංගි කෙනෙකුයි ළඟදි දවසක බලන්න යන්න හිතාගෙන ඉන්නේ. මෙහෙන් පාන්දර තුනේ බස් එකේ නැග්ගම උදේ හත වෙනකොට යක්කලින් බහින්න පුළුවන්."** දිනක් දුරකතනයෙන් මා ඇමතූ අවස්ථාවක ඇය කීවාය. ඉන්පසු මෙම මෑණියන් සියැසින් දැකගැනීමේ මා තුළ වූ උනන්දුව දලුලා වැඩෙන අයුරක් මට හැඟිණ. එබැවින් ඇය කී දිනයේ කී වෙලාවටම යක්කල ආයුර්වේද රෝහල අභියසට ගිය මට කාලි මෑණියන්ගේ රුව සහිත ඇය සියැසින් දැකගැනීමේ අවස්ථාව හිමිවිය.

සාමාන්‍ය කාන්තාවගේ උසට වඩා තරමක් උසින් යුතු සිහින් සිරුරකින් යුතු ඇය සාමාන්‍යයෙන් අප එදිනෙදා දකින කාන්තාවන් බොහොමයකට වඩා කාල වර්ණයෙන් යුතු වූවාය. එහෙත් ඉන් ඇගේ රූප සොබාවට කිසිඳු බාධාවක් වී නොමැති බව මට එක්වරම වැටහී ගියේ ඇගේ දිගැටි දෙනෙත, සිහින් දිගු නාසය සහ ලා රත් පැහැයෙන් යුතු සිහින් දෙතොල මගින් ඇගේ රූ සිරියට ලබාදී තිබූ නොමඳ දායකත්වය නිසාය. නමුදු ඇගේ කාල වර්ණ කෙස් කළඹේ නළල දෙසට වන්නට වූ කොටසෙහි කෙස් රොදක් ඉදී තිබූ අතර එය ඇගේ සිරුරේ සහ කෙස් කළඹේ කාල වර්ණය අතුරින් විශේෂයෙන් කැපී පෙනුණි.

පෙර කී උපපොලිස් පරීක්ෂකවරයා, මා දැන හඳුනා කතාබස් කිරීමෙන් අයහපතක් සිදුවිය නොහැකි බවට සහතිකකොට තිබූ බැවින් දෝ ඇය මා මුණගැසුනු මොහොතේ සිට අතිශය සුහදශීලී බවක් පළකළාය. ඒ අනුව ඇයත් වයස අවුරුදු විසි ගණන්වල පසුවන බවක් පෙනුණු ඇගේ ඥාති සොයුරියත් සමඟ යක්කල ආයුර්වේද රෝහල ඉදිරිපිට පිහිටි බොජුන්හලට ගොස් උදේ ආහාරය ගැනීමට මට අවකාශ ලැබිණි.

**ඒක හරිම ලස්සන ඉර බහින හැන්දෑවක්. අපේ ගෙදරට එන පාරේ එනකොට මං දැක්කා පාර හරහා මූණු දෙකක් තියෙන බළලෙක් පනිනවා. මට එච්චරයි මතක**

**"මං පුංචි කාලේ ඉඳලම හුඟක් උත්සාහයෙන් ජීවිතේ ගොඩනගාගන්න උත්සාහ කරපු ගෑනියෙක්. අපේ අම්මා අප්පච්චි ජීවත්වුණේ හේන් කුඹුරු කරලා. ඒ හින්දු මටත් ඉස්කෝලේ ගිහින් ඉහළට ඉගෙනගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. කොහොමහරි වයස අවුරුදු විසිපහේදී විතර මම අපේ ගමේ මනුස්සයෙක්ව කසාද බැන්දා. ඒ කසාදෙන් අපිට දුවෙකුත් ඉන්නවා. ඊත් අවුරුදු දෙක තුනකට පස්සේ කොළඹ රස්සාවකට කියලා ගමෙන් පිටවුණු මිනිහා දැන් අවුරුදු පහ හයක් වෙනවා ඉන්නවද මලාද කියලාවත් ආරංචියක් නෑ."** එසේ දැන හඳුනාගැනීමෙන් පසු ඇය කීවාය. ඇය සම්බන්ධයෙන් මුල්වරට මා හා කරුණු ඉදිරිපත් කළ උපපොලිස් පරීක්ෂකවරයා ඇයට කාලි අම්මාගේ රුවට සමාන රුවක් ඇති බව පවසා සිටියේ ඇගේ සමේ කාල වර්ණයට වඩා මුහුණේ අවයවවල, සිරුරේ හැඩයේ සහ හටකඬේ ඇති ප්‍රසන්නශීලී බව නිසා විය යුතු යැයි ඇය හා කතාබස් කරන අතරේ මට කිහිපවරක්ම සිතිණ.

කෙසේ හෝ පසුව හේන් කුඹුරු ගොවිතැනින් උපයාගන්නා මුදල ජීවත්වීමට ප්‍රමාණවත් නොවූ බැවින් ඇය ගමේ කාන්තාවන් කිහිපදෙනෙකු හා එක්ව එක්තරා මූල්‍ය සමාගමකින් ක්ෂුද්‍ර ණයක් ලබාගෙන තිබිණි. එහෙත් ඇය කළ ස්වයං රැකියාවෙන් ලද ආදායම ණය වාරිකය ගෙවීමට තරම්වත් ප්‍රමාණවත් නොවීම නිසා ඇය දිනෙන් දින අමාරුවේ වැටී තිබේ. ඒ අතර එම ප්‍රදේශයේ පවතින ප්‍රවාහන දුෂ්කරතා මත ඇය ස්කූටි යතුරුපැදියක්ද කොටස් වශයෙන් මුදල් ගෙවීමේ පදනම මත මිලදී ගෙන තිබුණි.

**"අපි කොහොමහරි යන්තමින් පණ ගැටගහගෙන ඉන්න අතරේ තමයි කොරෝනා ආවේ. ඊත් අපේ ණය වාරික ගෙනියන්න එන සර්ගෙන්වත් (ක්ෂුද්‍ර ණය ආයතනයේ නියෝජිතයා) ස්කූටිය ගත්තු තැනින්වත් අපිට කිසිම සහනයක් ලැබුණේ නෑ..."** කී ඇය දිගු සුසුමක් හෙළා නිහඬ වූවාය. ඉන්පසු ඇය කීයේ එසේ තමන් මෙන් දරුණු ණය උගුලකට පත් ඒ ගමේ කාන්තාවන්ගෙන් කිහිපදෙනෙකු එම ක්ෂ්ද්‍ර මූල්‍ය ණය ආයතනයේ නියෝජිතයා විසින් වෙනත් රැකියාවන්ට කුරුණෑගල හා කොළඹ රැගෙන ගිය බවකි.

**"ඔය අතරේ දවසක් මම අපේ නැන්දා කෙනෙකුගෙන් අතමාරුවක් ඉල්ලගන්න ස්කූටියෙන් ගිහින් ගෙදර එමින් හිටියා. ඇත්තෙන්ම මම දැනගෙන හිටියා මට ආපහු ගෙදර එන්නවත් පෙට්‍රල් නැති බව. ඒක හරිම ලස්සන ඉර බහින හැන්දෑවක්. මම අපේ ගෙදරට එන පාරේ එනකොට මං දැක්කා පාර හරහා මූණු දෙකක් තියෙන බළලෙක් පනිනවා. මට එච්චරයි මතක."**

ඇය කීවාය. එම කාන්තාව පවසන අන්දමට ඉන්පසු සිදුවූ කිසිවක් ඇයට මතක නැත. ඒ වනවිට සිය යතුරපැදියද සමඟ මහමග අයිනේ පෙරළී සිටි ඇය ගම්වාසීන් විසින් ඔසවාගෙන නිවසට පැමිණෙන විටත් ඇය **"මම කාලි අම්මා යකෝ, මාව අල්ලන්න එපා"** යැයි බෙරිහන් දුන් බව පසුව ගම්වාසීන් පවසා ඇත. ඉන්පසුව ප්‍රදේශයේ ප්‍රසිද්ධ දේවාලයක කපු මහතකුගේ ඉල්ලීම මත නිවස ඉදිරිපිට කාලි මෑණියන් වෙනුවෙන් පහන් පැළක් ඉදිකළ ඇයට බදාදා සහ සෙනසුරාදා සන්ධ්‍යා යාමයේ එම කාලි ආරූඪය ලබාගැනීමේ හැකියාව ලබාගෙන ඇත.

එහෙත් මෙය ඉතා සරල මනෝ විද්‍යාත්මක සිද්ධාන්තයක් මත පදනම් වූවකි. තමන්ගේ ජීවිතය හා සම්බන්ධ බරපතළ ගැටලු අර්බුද මුල්කොට ඇතිවන මානසික ගැටුම (Conflict) නම් සාධකය හමුවේ සමහරකු විඝටන ආබාධය (Dissociative Disorder) නම් මානසික අර්බුදයට මුහුණදෙති. එවිට ඒ තැනැත්තාගේ සැබෑ පෞරුෂය යටපත්ව යටි සිත තුළ පැන නැගී ඇති ද්විතීය පෞරුෂයක් ඉස්මතු වීම ඉබේම සිදුවෙයි. මේ කාන්තාව මුහුණ පා ඇත්තේද එවන් තත්ත්වයකටය.

එහෙත් එවන් මානසික අර්බුදයන් මුදල් ඉපැයීම පිණිස යොදාගන්නා වත්මන් සමාජයෙන් මතුවූ මෙම අපූරු කාලි මෑණියන් එසේ නොකිරීම සම්බන්ධයෙන් මගේ ස්තූතිය ඇය වෙත පුදකළ යුතුය.

# කැරලි කොණ්ඩකාරියන්ට මේ හැටි ඉල්ලුමක්?

හෝව්... හෝව්... හෝව්... අද රූපලාවණ්‍ය ලිපිය කර්ල් කොණ්ඩයක් තියෙන අයට විතරයි. හැබැයි ඉතින් ස්වභාවික කර්ල් නැතත් කොණ්ඩේ කර්ල් කරන්න හිතාගෙන ඉන්න කෙනෙක්ටත් මේ ලිපිය වැදගත්.

'මැගී නූඩ්ල්ස් කොණ්ඩ තියෙන කෙල්ලො තමයි ලස්සනම' කියලා මේ මෑතකදි ෆේස්බුක් එකේ පෝස්ට් එකක් ෂෙයාර් වෙලා තිබුණා. කර්ල් කොණ්ඩ තියෙන කෙල්ලෝ ඇවිදින්නේ අඩි දෙකක් උඩින් කියලත් සමහරු ඇවිල්ලා ලියලා තිබුණා. ඔය කර්ල් කොණ්ඩ හැදෙන්නේ ජානමය බලපෑමෙන්. ඒ නිසා ඉතින් හැමෝටම කර්ල් කොණ්ඩ ලැබෙන්නේ නැහැ. සාමාන්‍ය කොණ්ඩ තියෙන ගෑනු ළමයි සීයක් මැද්දෙ වුණත් කර්ල් කොණ්ඩකාරියක් තිබ්බොත් කැපිලා පේන්නේ එයැයිව කියන එක ඉන්තේරුවෙන්ම කියතෑකි. ඉතින් එහෙම බැලුවහම කොණ්ඩ කර්ල් කෙල්ලෝ උඩින් යන එක සාධාරණයිනේ.

ලංකාවේ නිළි රැජින මාලනී ෆොන්සේකා මහත්මියට තියෙන්නේත් රැලි කොණ්ඩයක්. මාලනීගේ දිග අක්බඹරු කොණ්ඩෙට ඒ කාලේ මුළු ලංකාවේම කොලුගැටව් වශීවෙලා හිටියලු. විජය කුමාරතුංග මහත්තයට තිබුණේ චූටි මුදු කොණ්ඩයක්. ඔය හේතුව නිසා 80 දශකෙදි රැලි කොණ්ඩ ලංකාවේ උමතුවක් වෙලා තියෙනවා. ඒ කාලේ හිටපු හැම කොල්ලගෙම හීනේ විජේගේ වගේ රැලි කොණ්ඩයක් හදාගන්න එකලු.

ලංකාවේ විතරක් නෙවෙයි පිටරටවලත් කර්ල් කොණ්ඩෙට විශේෂ සැලකිලි ලැබිලා තියෙනවා. ග්‍රීසියේ හිටියයි කියන ග්‍රීක දෙවිවරුන්ට් තිබුණේ කැරලි කොණ්ඩලු. ග්‍රීක ප්‍රතිමාවලට රැලි කොණ්ඩ දාලා තියෙන එකෙන් ඒක පැහැදිලියි. තව කතාවක් තියෙනවා. 18 වැනි සියවසේ ප්‍රංශයේ ජීවත්වෙච්ච 14 වැනි ලුවී රජ්ජුරුවන්ගේ කොණ්ඩේ හැලිලා ඒ උතුමානන්ගේ තට්ටේ පෑදුනාලු. මේ කාරණාවෙන් සෝතාප වෙච්ච රජතුමා රටේ ඉන්න කෙස් සැකසුම් ශිල්පීන් 48කට කියලා මහ විශාල කොණ්ඩයක් හදවලා. රජතුමා කැමති කර්ල් කොණ්ඩවලටලු. ඉතින් හැදෙව්වෙත් කර්ල් බොරු කොණ්ඩයක්. රජතුමා මේ විග් එක දාපුවාහම් රටේ ඉන්න ප්‍රභූවරු හිතුවේ රජා මේක ෆැෂන් එකට දානවා කියලයි. පස්සේ උන්දැලත් මහා කෙස්වලු දාන්න පටන්ගත්තාලු. ඒ පිංතූර අදටත් අන්තර්ජාලයේ දකින්න තියෙනවා.

ඔය කවුරු කොහොම ආස වුණත්, ලස්සන වුණත් කර්ල් කොණ්ඩවල කතා ඔය පේන තරම් සුන්දර නැහැ. මොකද ඔය කැරලි ගැටගැහුණාම එව්වා ලිහන එක යුද්ධෙකට දෙවැනි නැහැ. ඒ නිසා කැරලි කොණ්ඩේ හරි විදියට තියාගන්නේ කොහොමද කියන කාරණාව වගේම කැරලි කොණ්ඩෙට හොඳ සත්කාර ටිකක් ගැනත් කතා කරන්න අද අපි හිතුවා.

හිතුවක්කාර කැරලි මට්ටු කරන්න හොඳම දේ හරියට නාන එක. ඇයි අපි හරියට නාන්නේ නැහැ කියලා හිතුවද? කියලා දැන් කැරලිකාරියෙක්ට හිතෙන්න පුළුවන්. නානවා නම් තමයි. හැබැයි ගොඩක් අය කර්ල් කෙස් සෝදන්නේ සාමාන්‍ය උදවිය කෙස් කළඹ සෝදන විදියටමයි. කැරලි කොණ්ඩේ විශේෂයිනේ. ඉතින් සාමාන්‍ය විදියට නාලා පුළුවන්යෑ?

පළවැනි කාරණාව කර්ල් කොණ්ඩෙට හරියන ෂැම්පු එකක් තෝරගන්න එක. කොණ්ඩේ සිල්ක් වගේ සුමුදු මුදු කරනවා කියලා කියන ෂැම්පු කිසිම වෙලාවක කර්ල් කොණ්ඩෙට ගාන්න එපා. ඒවගෙන් කොණ්ඩේ කර්ල් ගතිය නැතිවෙනවා.

සාමාන්‍ය කොණ්ඩෙකට වඩා පොකුටු කොණ්ඩයක වියළි ස්වභාවය වැඩියි. ඒ කියන්නේ කෙස්වල තියෙන ස්වභාවික තෙල් ප්‍රමාණය අඩුයි. ෂැම්පු එකක් තෝරගන්නකොට සල්ෆේට්, සිලිකොන්, ඇල්කොහොල්, පැරබීන් කියන රසායන අඩංගු ෂැම්පු භාවිතා කරන්න එපා. කර්ල් කොණ්ඩය වෙනුවෙන් හදපු ෂැම්පු වර්ග තියෙනවා. පුළුවන් නම් එහෙම ෂැම්පු එකක් පාවිච්චි කරන්න. නැත්නම් හර්බල් ෂැම්පු වුණත් කමක් නැහැ.

කර්ල් කොණ්ඩයක් තියෙන කෙනෙක්ට හැමදාම නාන එක යුතු නැහැ. දවස් දෙකකට නැත්නම් තුනකට පාරක් නෑවහම ඇති. අනික කොණ්ඩේ ෂැම්පු කරද්දි කෙළින්ම කොණ්ඩෙට ෂැම්පු හලන්න එපා. අතට ෂැම්පු ටිකක් දාලා ඒකට වතුර ටිකක් එකතු කරලා පෙණ හදාගෙන ඒ පෙණවලින් හිසේ සම විතරක් සෝදන්න. හිසකෙස්වලට ආයේ අමුතුවෙන් ෂැම්පු දාන්න අවශ්‍ය නැහැ.

කොණ්ඩේ කන්ඩිෂනර් කරන එක තමයි කර්ල් අයට වැදගත්ම කොටස. නාලා ඒ තෙත තියෙද්දිම ඔලුව පහතට දාලා කොණ්ඩේ කන්ඩිෂනර් ගාන්න. රැලි කොණ්ඩේ වෙනුවෙන් හදපු කන්ඩිෂනර් තියෙනවා. එහෙම නැත්නම් රසකාරක නොයෙදූ යෝගට්, ඔලිව් තෙල්, මී පැණි, ඇපල් විනාකිරි හොඳට බ්ලෙන්ඩ් කරලා කන්ඩිෂනර් එකක් විදියට ගාන්නත් පුළුවන්. කන්ඩිෂනර් ගාලා විනාඩි 20ක් ඉන්න. ඔය අතරේ ඕනේ නම් කොණ්ඩේ පීරගන්න. විනාඩි 20කින් පහළට වැටෙන විදියටම ඔලුව තියාගෙන කොණ්ඩේ සෝදගන්න. කොණ්ඩේ පිහිදාගන්න මයික්‍රොෆයිබර් තියෙන තුවායක් පාවිච්චි කරන්න. රළු තුවාවලින් කර්ල් ටික කැඩිලා යන්න පුළුවන්. නැත්නම් පිරිසිදු ඝන ටීෂර්ට් එකකින් කොණ්ඩේ පිහිදාගන්න. ඒ වගේම අත්‍යවශ්‍යම වෙලාවක ඇර හෙයා ඩ්‍රයර් පාවිච්චි කරලා කර්ල් කොණ්ඩේ වේලන්න එපා. හුළගෙන් වේලගන්න තරමට රැලි ටික රැකගන්න ලේසියි.

ඊගාව කාරණාව කොණ්ඩේ පීරන එක. කිසිම වෙලාවක සාමාන්‍ය පනාවලින් කර්ල් කොණ්ඩ පීරන්න එපා. කඩේ ලොකු දැති පනා තියෙනවා (Wide Tooth Comb). ඒවා ඒ තරම් මිලක් නැහැ. මේ වර්ගයේ පනාවක් පාවිච්චි කරන්න. නාලා ඉන්න වෙලාවක නැත්නම් තෙල් ගාලා තියෙන වෙලාවක ඇර සාමාන්‍ය වෙලාවට කොණ්ඩය පීරන්න එපා. අත්‍යවශ්‍යම නම් අතින් ටිකක් ගැට කැඩුවට කමක් නැහැ. නිතරම මතක තියාගන්න කෙස්වල පහළ ඉඳලා උඩට තමයි පීරන්න ඕනේ.

ඒ වගේමයි රබර් පටි, හීනි බූල් බෑන්ඩ්, පටි වගේ දේවල්වලින් ඇදලා, බැඳලා, තද කරලා කර්ල් කොණ්ඩේ ගැටගහන්න එපා. එතකොට කොණ්ඩේ කර්ල් එක යනවා කියන එක අමුතුවෙන් කියන්න ඕනේ නැහැනේ. හෙයා ක්ලිප්වලින් සැහැල්ලුවට ගැටගහගෙන ඉන්න තරමට රැලි ටික තියාගන්න ලේසියි. රැලි කොණ්ඩකාරියන්ට කොට්න් කොට්ට උර ගැළපෙන්නේ නැහැ. රෑට නිදාගනිද්දි තිබුණු රැලි ටික උදේට නැගිට්ද්දිත් ඒ විදියටම තියෙන්න ඕනේ නම් සිල්ක් කොට්ටෙක නිදාගන්නම වෙනවා.

ඔය මොන දේ කළත් ලොකු හුළඟක් ආවොත් වෙලාවකට ලස්සන කැරලි ටික කැඩෙන්න පුළුවන්. හැබැයි නැතිවුණු කර්ල් ටික ඉක්මනින්ම ආයෙත් හදාගන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. මේකට ස්ප්‍රේ බෝතලේක දාගත්තු වතුර ටිකක් ඕනේ. ඒකත් එක්ක ඔලිව් තෙල්, එඬරු තෙල් නැත්නම් සුපිරිසිදු සුදු පොල්තෙල් කියන තෙල් වර්ග තුනෙන් එකකුත් ඕනේ. මුලින්ම කොණ්ඩෙට වතුර ටිකක් ස්ප්‍රේ කරගන්න. ගොඩක්මත් නෙමෙයි. සාමාන්‍ය ප්‍රමාණයට. ඊටපස්සේ තෙල් ටිකක් අත්ලට දාලා කොණ්ඩෙට ගාන්න. දැන් කොණ්ඩේ ඇතුළු පැත්තේ ඉඳලා අත දාලා ඇඟිලිවලින් කොණ්ඩේ පීරන්න. ඊටපස්සේ අතින් හොඳට ගුලි කර කර කොණ්ඩේ සෙට් කරගන්න.

කර්ල් කොණ්ඩවලට විශේෂයෙන්ම කරගන්න පුළුවන් ස්වභාවික සත්කාර කිහිපයක් ගැනත් අපි බලමු.

කර්ල් කොණ්ඩ ඉක්මනටම වියැළෙන්න බලනවා කියලා අපි කිව්වනේ. ඒ නිසා කර්ල් කොණ්ඩයක් තියෙන කෙනෙක් මාසෙකට දෙපාරක් හරි තෙල් සාත්තුවක් කරන්නම ඕනේ. ඒකට මේ ටික හොයාන්න. මුරුංගා කොළ මිටක්, කරපිංචා, වද මල්, කීකිරිඳිය කොළ, කොහොඹ කොළ, එඬරු තෙල්, ඔලිව් තෙල්. මේ කියපු සේරම ටික සෝදලා මදපවනේ වේලගන්න. ඔලිව් තෙල් ටිකයි එඬරු තෙල් ටිකයි ලිපේ තියලා රත් කරන්න. ඒකට අර අමුද්‍රව්‍ය සේරම එකතු කරලා මද ගින්නෙ හින්දවන්න. තෙල් ටික නිවෙන්න ඇරලා ඔලුවේ ගාලා හිස සම්බාහනය කරන්න. පැය 2ක් විතර තියලා සෝදලා අරින්න. ඔය තෙල හදාගන්න අමාරු නම් පොල්තෙල්, එඬරු තෙල්, ඔලිව් තෙල් ඔය ඕන තෙලක් කොණ්ඩෙට ගාන්න.

තෙල් සත්කාරයට අමතර මේ හෙයා මාස්ක් ටිකත් ගාලා බලන්න.

රෝස පෙති ටිකක්, කෝමාරිකා ජෙල්, ඔලිව් තෙල්, එඬරු තෙල්, විටමින් E කරලක් හොඳින් බ්ලෙන්ඩ් කරලා කෙස් කළඹේ ආලේප කරලා විනාඩි 20ක් තියලා නාන්න.

යෝගට් ටිකකට මී පැණි ටිකක් මිශ්‍ර කරලා කොණ්ඩේ ගාන්න. විනඩි 30ක් විතර ඉඳලා හෝදලා අරින්න.

ඔලිව් තෙල්, බිත්තර, විටමින් E හොඳට මිශ්‍ර කරලා අලේප කරන්න. විනාඩි 20ක් විතර ඉඳලා සෝදලා අරින්න. අලිගැටපේර මදයට විටමින් E, මී පැණි එකතු කරලා ගාන්න.

ඇපල් විනාකිරිවලට වදමල් යුෂ එකතු කරලා රැලි කොණ්ඩේ ගාලා බලන්න. මේ කියන සත්කාරවලින් එකක් සතිය ගානේවත් කරන්න පුළුවන් නම් ඕනම කෙනෙකුට කැරැල්ලක් නැතුව කැරලි ටික රැකගන්න පුළුවන් බව සහතිකයි.



■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



**ඉන්දිකා ප්‍රනාන්දු**
මනෝඋපදේශිකා සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරී

# සමහර ආච්චිලාට දොස්තර දැක්ක ගමන් ලෙඩ හොඳ වෙන්නේ මෙහෙමයි



**දේව මෙහෙයවල්වලදී අවුරුදු ගණන් රෝද පුටුවේ ඉඳපු මිනිස්සු එකපාර ඇවිදින්න ගන්නෙත් මේ නිසා තමයි**

කර්ට් රිච්ටර් කියන ඇමරිකානු විද්‍යාඥයා 1950දී ටිකක් අමුතු පරීක්ෂණයක් කළා. හදිසි අවස්ථාවලට මුහුණ දෙන විදිය ගත්තහම මීයන්ගෙයි මිනිස්සුන්ගෙයි මොළය හැසිරෙන්නේ එකම විදියට නිසා ඒ පරීක්ෂණයට යොදාගත්තේ මීයන්ව.

වීදුරු දහයක් අරගෙන එව්වට බාගෙට වතුර පුරවලා වීදුරු දහයට මීයන් දහදෙනෙක් දැම්මා. මීයෝ බේරෙන්න උත්සාහ කළත් භාජනේ කට උස වැඩි නිසා මීයන්ට පැනලා බේරෙන්න බැරි වුණා. විනාඩි 15ක් යද්දි මීයෝ දහදෙනාම මැරුණා. දෙවැනි වටේදි ආයේ බාගෙට වතුර පුරවපු භාජනවලට මීයෝ දහදෙනෙක් දැම්මා. විනාඩි 10ක් කිට්ටු වෙද්දි රිච්ටර් මහත්තයා මේ මීයෝ දහදෙනාව උඩට අරන් ඒ අයට කන්න බොන්න දීලා විවේක දුන්නා. ටික වෙලාවකින් මේ සත්තුන්ව ආයෙත් වීදුරුවලට දැම්මා. විනාඩි 15 යද්දි හරි නම් මේ මීයෝ මැරෙන්න ඕනානේ. හැබැයි මීයෝ මැරුණේ නැහැ. උන් එකදිගටම අල්ලන් හිටියා. කොච්චර වෙලාවක්ද දන්නවද? හරියටම පැය අටක්.

ඒක වුණේ මෙහෙමයි. ජීවිතේ අතඅරින්නේ නැතිව ඉවසන් අල්ලගෙන හිටියොත් කලින් වගේ කවුරු හරි බේරගනී කියලා මීයාගේ මොළය හිතනවා. මොළය දෙන ඒ පණිවිඩය එක්ක මීයගේ ශක්තිය 240 ගුණයකින් වැඩිවෙලා පැය අටක් අල්ලන් ඉන්න පුළුවන් වුණේ ඒ නිසයි.

මිනිස්සුන්ටත් මේක මෙහෙමමයි. මොනවා හරි දෙයක් නැත්තම් කවුරු හරි කෙනෙක් තමන්ව බේරගනී කියන විශ්වාස මිනිස්සුන්ට තියෙනවා. මිනිස්සු මිත්‍යා විශ්වාස පස්සේ යන්නේ වුණත් මනසේ ඔය ස්වභාවය නිසයි.

මිනිස් මොළය හරියට පොඩි දරුවෙක් වගෙයි. රවට්ටන්න ලේසියි. මොළය විශ්වාස කරන්නේ ඇත්ත නෙමෙයි එයාට පේන දේ දකින දේයි. හොල්මන් කියලා දෙයක් නැහැ කියලා දැන දැනත් හොල්මන් ෆිල්ම් එකක් බලද්දි අපි බයවෙන්නේ ඒකයි. මොකද මොළය එයා දකින දේ ඇත්ත කියලා විශ්වාස කරනවා. 1955දී ඇමරිකානු වෛද්‍ය හෙන්රි කේ බීචර් මේ ස්වභාවය තේරුම් අරන් ප්‍රතිකාර සංකල්පයක් නිර්මාණය කළා. ඒකට කියන්නේ ප්ලේස්බෝ බලපෑම (Pleacebo effect) කියලා. ප්ලේස්බෝ ගැන නොදන්නවා වුණත් මිනිස්සුන්ගේ මොළයේ ස්වභාවය ගැන දන්න සමහර වංචාකාරී මිනිස්සු වාණිජ පරමාර්ථයෙන් මේ වගේ ක්‍රම පාවිච්චි කරලා මිනිස්සුන්ව රවට්ටනවා. ප්ලේස්බෝ බලපෑම ගැන ටිකක් දැනුවත් කරන්න හිතුවේ ඒ නිසයි.

ප්ලේස්බෝ කියන්නේ චිකිත්සක වටිනාකමක් නැති ප්‍රතිකාරවලට. සමහර මිනිස්සු ඉන්නවා ඒ අයට තියෙන්නේ හිතින් හදාගත්තු ලෙඩ. අර අපි මනෝකායික ලෙඩ කියන්නේ. අපේ ගෙවල් ගාව වයසක ආච්චි කෙනෙක් හිටියා. මේ ආච්චිට සතියට වතාවක් ලෙඩ. හැබැයි දොස්තර මහත්තයගේ මූණ බලලා ආපුවහම පහුවෙනිදට ලෙඩේ හොඳයි.

ඔය වගේ ලෙඩ්ඩු ගැන ඩොක්ටර්ස්ලත් දන්නවා. ඒ වගේ රෝගීන් වෙනුවෙන් වෛද්‍යවරු වුණත් පාවිච්චි කරන්නේ අර ක්‍රමය. ඇමරිකාවේ හාවර්ඩ් විශ්වවිද්‍යාලය මේ ප්ලේස්බෝ ගැන සෑහෙන පරීක්ෂණ කරලා තියෙනවා. මානසික ආතතියට පත්වෙච්ච් රෝගීන් 50 අරගෙන ඒ පිරිස දෙකට බෙදලා එයින් එක පිරිසකට සීනි පෙති දුන්නලු. අනිත් පිරිසට ඇත්තම ඖෂධ දීලා. පරීක්ෂණය අවසානෙදි ව්‍යාජ පෙති බීපු අයත් සුවවෙලා. ඒකට හේතුව මනසේ ස්වභාවය. මොකද තමන්ට තියෙන ලෙඩේට බෙහෙත් ලැබුණා කියලා මොළය හිතනවා. දෙවැනි ලෝක යුද්දේ කාලේ තුවාල වුණු සොල්දාදුවන්ට වේදනානාශක වෙනුවට ව්‍යාජ පෙති දීලා තියෙනවා. අදටත් සමහර සැත්කම්වල වේදනාව අඩුවෙන්න දෙන වේදනානාශක මිනිස් ඇඟට ඒ තරම් යෝග්‍ය නැහැ. ඒ නිසා සමහර අවස්ථාවලදී වෛද්‍යවරු වේදනානාශක විදියට ව්‍යාජ පෙති දෙනවා. පෙත්ත බීපු බව මොළය දැනගත්තු හැටියේ ඒකට රැවටිලා ඇත්තටම වේදනානාශක හෝර්මෝන ස්‍රාවය කරනවා. එතකොට ඇත්තටම වේදනාව අඩුවෙනවා.

පෙති බොනකොට මොළය හිතන්නේ ඒක ක්‍රියාකාරී ඖෂධයක් කියලානේ. ඉතින් ලොකු පෙත්තක් දුන්නහම පොඩි පෙත්තක් දුන්නටත් වඩා ඉෆෙක්ටිව්. පිටරටවල නම් පෙති විතරක් නෙමෙයි නිෂ්ක්‍රීය එන්නත්, සැත්කම් වගේ ක්‍රමත් භාවිතා කරනවා. විශාදය, වේදනාව, ආසාත්මිකතා, අංශබාගය, හන්දිපත් වේදනා, ආතති කළමනාකරණය, නින්ද නොයාම, තෙහෙට්ටුව වගේ තත්ත්වවලටත් ප්ලේස්බෝ පාවිච්චි කරනවා. හෝමියෝපති ක්‍රමයත් එක්තරා ප්ලේස්බෝ ක්‍රමයක් කියලයි වෛද්‍යවරු කියන්නේ. ඇත්තටම රෝගියාට ලෙඩක් තියෙනවද නැද්ද කියන එක බලලා වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් ඇතිව තමයි වෛද්‍යවරු මේ ක්‍රමය භාවිතා කරන්නේ. ප්‍රශ්නේ ඒක නෙමෙයි. එහෙම නැති කාණ්ඩෙකුත් ඉන්නවා. කවුද දන්නවද? කට්ටඩියෝ, කපුවෝ, දේව පුත්‍රයෝ කියාගන්නේ අන්න එහෙම උදවිය. ප්ලේස්බෝ ක්‍රමේදි මේ අය පාවිච්චි කරන්නේ පෙති නෙමේ වෙනත් බලවේගයක්, ශක්තියක් නැත්නම් බලවත් පුද්ගලයෙක් ලෙඩ සුව කරනවා කියන සංකල්පය.

කොන්දේ වේදනාවක් නිසා අවුරුදු තුනක් විතර එකතැන් වෙලා හිටපු කාන්තාවක් හිටියා. දවසක් ඇය ඇගේ ගමේ තිබුණු සුව මෙහෙයකට සහභාගී වෙලා වාර දෙකක් යද්දි ඇගේ රෝගය සුවවෙලා කාන්තාව ඇවිදින්න පටන්ගත්තා. ඒ සිද්ධිය එක්ක ගමේ හැමෝම ඒ තැන විශ්වාස කරන්න ගත්තා. ඒත් එක්කම යන පිරිස වැඩිවුණා විතරක් නෙමේ එතැනට යන සමහරු ඇත්තටම සුව වුණා. මමත් දවසක් ඔය කියන සුව මෙහෙය බලන්න ගියා. එතැන වැඩිපුරම හිටියේ කාන්තාවෝ. මම ඒ කිහිපදෙනෙක් එක්කම කතා කළා. ගොඩක්ම හිටියේ ආර්ථික ප්‍රශ්න තියෙන අය. සමහරුන්ව පවුලෙන් නොසලකා හැරලා. නැත්නම් සැමියාගෙන් පීඩන. එතැනදී ලැබෙන මානසික හයිය එක්කලා අර ප්ලේස්බෝ ඉෆෙක්ට් එක ක්‍රියාත්මක වෙලා සමහරුන්ගේ ලෙඩ සුවවුණා. මොකද මානසික පීඩනයට ප්ලේස්බෝ ක්‍රමේ ගොඩක් ක්‍රියා කරනවා. සමහර ලෙඩ්ඩු ඉන්නවා එතැන කතා කරන ගැම්මට රෝද පුටුවෙන් නැගිටිනවා. හැබැයි ගෙදර ගිහිල්ලා බැලුවහම ලෙඩේ තිබුණාටත් වැඩිය වැඩිවෙලා.

සුව මෙහෙයවලදී විතරක් නෙමෙයි සුර දැම්මහම, තැඹිලි බිව්වහම, අර පූජාව කළාම ලෙඩ හොඳ වෙනවා කියන කපු මහත්තුරු කරන්නෙත් ඔය වැඩේම තමයි. හොඳම දේ තමයි ඔය වැඩ කරන ගොඩක් අය මිනිස්සුන්ගෙන් මනසේ ස්වභාවය ගැන හොඳට දන්නවා.

ඔය වැඩවලදි එක්කෙනෙක් දෙන්නෙක්ට ප්ලේස්බෝ ඉෆෙක්ට් එක වැඩ කළාට හැමෝටම මේක බලපාන්නේ නැහැ. මොකද මනෝකායික ලෙඩ හොඳ වුණාට මේකෙන් ඇත්ත ලෙඩ හොඳ කරන්න බැහැනේ. මීට මාස කිහිපයකට කලින් උණ දරුවෙක්ව රෝහලට ගෙනියන්නේ නැතිව සුව මෙහෙයේ වතුර පොව පොවා ඉඳලා මැරුණා මතක ඇති.

ප්ලේස්බෝ වංචාකරුවන්ට රැවටෙන මිනිස්සු ගැන 2013දී සමීක්ෂණයක් කරලා තියෙනවා. මේ පරීක්ෂණය කරලා තිබුණ් යුරෝපීය ජාතිකයන් යොදාගෙන 1960 ඉඳලා ගත්තහම 2013 වෙද්දි ප්ලේස්බෝ වංචාවලට අහුවෙන මිනිස්සු වැඩිවෙලා. විද්‍යාව, තාක්ෂණය කොච්චර දියුණු වුණත් මිනිස් මොළයට මේ වංචා ගැන පැහැදිලි කරන්න තාමත් බැරිවෙලා තියෙනවා. ඒ රටවල එහෙම නම් ලංකාවේ තත්ත්වය ගැන අමුතුවෙන් කියන්න ඕනේ නැහැනේ. දුවට තිබුණ ලෙඩක් හොඳ කරනවා කියලා හොර කපුවෙක් මේ ළඟකදිත් දියණියක් කෙලෙසලා තිබුණා. ලෙඩේ හොඳ කරන්න දරුවට තනියම පූජාවක් කරන්න ඕන කියලා කිව්වහම, තනියම කරන පූජාව මොකක්ද කියලා හිතන්න තරම් අපේ මව්වරු බුද්ධිමත් වෙන්න ඕනේ නේද?

තව දෙයක්. ආර්ථික ප්‍රශ්න තියෙන උදවිය විතරක් නෙමේ උතුරන්න සල්ලි තියෙන අයත් ප්ලේස්බෝ පස්සේ යනවා මම දැකලා තියෙනවා. අද සමාජේ තියෙන සංකීර්ණ බව එක්කලා සල්ලි තියෙන මිනිස්සුන්ටත් හැංගුණු ප්‍රශ්න තියෙනවා. ඒ ගොඩක් උදවිය ඉන්නේ පීඩාවෙන්. සල්ලි, බලය, ප්‍රසිද්ධිය කොයි වෙලේ නැතිවෙයිද කියන බය ඒ අයට තියෙනවා. ඒත් එක්කම ඒ අයට පීඩනය, ආතතිය, විශාදය වගේ තත්ත්වයන් ඇතිවෙනවා. ඒ දේවල් කළමනාකරණය කරගන්න ගිහින් ප්ලේස්බෝවලට රැවටෙනවා.

මිනිස්සු බොහොම ඉක්මනට හති වැටෙනවා. අත අරිනවා. ඉතින් කොයිවෙල් හරි උඩ ඉන්න කෙනෙක් තමන්ව බේරගනී කියන විශ්වාසය වෙලාවකට මිනිස්සුන්ට මානසික යැපීමක්. ඒ යැපීම හොඳට හිටින තැනුත් තියෙනවා. අර මීයන්ට වුණා වගේ. ඉතින් තමන්ගේ විශ්වාසය නැති කරගන්න කියන එක නෙමේ මම කියන්නේ. තමන්ගේ විශ්වාසය තියාගන්න. හැබැයි දැන් සමාජයේ බහුතරයක් ඉන්නේ වංචාකාර මිනිස්සු. ඒ වගේ අය ඉන්න තැන්වලදි බුද්ධිය මෙහෙයවලා වැඩ කරන්න. ටිකක් කල්පනා කරන්න. තමන්ගේ චර්යාවේ වෙනසක්, රෝග ලක්ෂණයක් තියෙනවා නම් ප්‍රාතිහාර්යය කරන්න යන්න කලින් වෛද්‍යවරයෙක් ළඟට යන එක තමයි හොඳම දේ.

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**



**තමන්ගේ දුර්වලකම් ගැන පිටස්තර පිරිමි එක්ක කියනවාට කිසිම මහත්තයෙක් කැමති නෑ**

# ගෙම්බි වගේ ගැහැනුන්ට පිරිමි මෙච්චර කැමති ඇයි?



කොළඹ විශ්වවිද්‍යාලයේ
හිටපු කථිකාචාර්ය
**ජනහිත විජයබණ්ඩාර**

'කිරලා හඬන්නේ වෙල ළඟ එනවාදෝ
බල්ලා බුරන්නේ මිදුලට ආවාදෝ
පුසා අඬන්නේ මිදුලට ආවාදෝ
පුසුඹ දැනෙන්නේ මං වෙත ආවාදෝ'

ඕක ඇවිල්ලා ගොඩක් බිරින්දෑවන්ට තමන්ගේ ස්වාමි පුරුෂයා දුර තියාම අඳුනගන්න පුළුවන් බව කියැවෙන පරණ කවියක්.

ඇත්තෙන් කිරලා කෑ ගහන සද්දේ ඇහෙනකොටම ගෙදර ඉන්න බිරිඳ දන්නවලු ඒ වෙනකොට තමන්ගේ සැමියා වෙළ හරියෙන් එනවා කියලා. බල්ලා බුරනකොට දන්නවලු ඔහු ඉන්නෙ ගේ පේනමානේ කියලා. ඔන්න පූසා අඬනවා කියන්නෙ උන්දෑ ගේ ඇතුළටම ඇවිල්ලා කියන එකලු. ඊටත් වැඩියෙන් සුවඳ දැනෙනවා නම් ඔහු ඊළඟ තප්පරේ තමන්ගේ ළඟට එනවා කියලා ඇය දන්නවලු. එදා බිරින්දෑවරුන්ට ඒ තරම් හොඳට තමන්ගේ සැමියව කියැවීමේ හැකියාවක් තිබුණට අද වෙනකොට තත්ත්වේ තරමක් වෙනස් වෙලා කියලයි අපිට හිතෙන්නේ.

තමන්ගේ සිතැඟි හඳුනාගන්න එක, අගය කරන එක පිරිමින්ගෙන් ගැහැනුන්ට විතරක් ලැබිය යුතු දෙයක් කියලයි ගොඩක් උදවිය හිතන් ඉන්නෙ. ස්වාමියා නිතරම තමන්ගේ රුව ගුණ වර්ණනා නොකළොත්, කෑමක රස ගුණ අගය නොකළොත්, ගොඩක් බිරින්දෑවරු නෝන්කාඩු කියන්නෙත් ඒක නිසා නොවැ.

ඒ නිසා කොයිතරම් වැඩ රාජකාරි තිබුණත් බිරිඳ වෙනුවෙනුත් පොඩි හරි කාලයක් කැප කරන්න කියලයි ගොඩක් මනෝ උපදේශකවරු පවා පිරිමි උදවියට උපදෙස් දෙන්නෙ. හැබැයි ඉතින් අනිත් අතට ගැහැනුන්ගෙනුත් පිරිමින්ට ඔය කියන අගය කිරීම ලැබිය යුතු නැද්ද..?

කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය ජනහිත විජයබණ්ඩාර මහතා එක්ක මේ සංවාදය ඒ ගැනයි.

මනමේ නාට්‍යයෙන්ම මම ඔය කතාවට ආරම්භයක් ගන්නම්. එදා මනමේ කුමාරයා වැදි රජුට පරාද වුණේ වෙන හේතුවක් නිසා නෙවෙයි. මනමේ ඒ වෙලාවේ මානසිකව කඩන් වැටුණා කියලයි මට නම් හිතෙන්නේ. මොකද සටන වෙලාවෙදි කුමරියගේ මුවින් නොකියයුතු යමක් කියැවෙනවා. ඒ තමයි 'මනමේ ඔබත් එක්ක හැප්පෙන්න තරම් හයිහත්තියක් තියෙන පුරුෂයෙක් නෙවෙයි, ඒ නිසා ඔහුට අනුකම්පා කරන්න' කියලා. මං හිතන්නෙ නෑ මේ ලෝකේ කිසිම පිරිමියෙක් පිටස්තරයෙක් ඉස්සරහා තමන්ගේ සහකාරිය තමන් දුර්වලයි කියලා කියනවට කැමති ඇති කියලා. ඕනම පිරිමියෙක් කැමති තමන්ගේ හයිහත්තිය සහ හැකියාව ගැන බිරිඳ අගය කරනවානම්.

ඊළඟට මනමේ නාට්‍යයේ වැදි රජාත් කළේ ඒකමයි. මනමේ එක්ක සටන් කරලා කුමාරියවත් අරගෙන කැලේට යනකොට මේ වැද්ද ඇයගෙන් මෙහෙම අහනවා.

'මනමෙට සෙනෙහස ඉවත දමාදෝ
වනයේ වැදි රජ කෙනෙකු පතාදෝ'

කියලා. ඔය අහන්නෙ වෙන මොකක්වත් නෙවෙයි. අර තරම් ලස්සන, රජසැප දෙන්න පුළුවන් මිනිහව දාලා උඹ මං ළඟට ආවේ මගේ මොන විශේෂත්වයක් නිසාද කියලනේ.

ඒ වෙලාවේ කුමරිය කියන්නේ මට ඒ රජසැපවලට වැඩිය උඹව වටිනවා කියලා. ආන්න ඒ වෙලාවේ වැද්දෙක් වුණත් ඔහු තුළින් සාම්ප්‍රදායික පිරිමියාව එළියට පනිනවා. ඒ නිසා කුමාරිට කියනවා 'සනසයි මා සිත ඔබ කී වදනා' කියලා.

පිරිමි කටින් නොකීවට මොකද හිත යටින් ගෑනුන්ගෙන් අගය කිරීම බලාපොරොත්තු වෙන ජාතියක් කියන්න ඕකත් අපේ සාහිත්‍යයේ එන හොඳ උදාහරණයක්.

ගොඩක් පිරිමි කැමති තමන්ගේ බිරිඳ නැත්තම් පෙම්වතිය රෝස මලක් වගේ ඉන්නවට නෙවෙයි. උන් වැඩි හරියක් කැමති ඒකී ගෙම්බියක් වගේ ඉන්නවට. මොකද ඔය ගෙම්බියන්ව කොච්චර ගෙවල්වලින් පැන්නුවත් ලේසියකට පන්නගන්න බැහැ. කොටින්ම උන්ව බෙල්ලෙන් අල්ලලා එළියට විසි කළත් අනිත් පැත්තට බිමට වැටෙන්නෙත් ගේ දිහා බලාගෙනමයි. ඒ හැරෙන පමාවට ආපහු සැරයක් ගේ ඇතුළෙම බක බක ගානවා. ආන්න ඒ වගේ කොච්චර පැන්නුවත් තමන්ගේ අපේම එල්ලිලා ඉන්නවට තමයි ගොඩක් පිරිමිත් කැමති. එළවන තරමටම අනේ මට ඔයා නැතුව ඉන්න බෑ කියනවා නම් ඔය ගොඩක් පිරිමි හරි කැමතියි.

ඕකට මම තවත් ඇත්තම කතාවක් කියන්නම්.

විශ්වවිද්‍යාලයේදි මගෙන් ඉගෙනගත්ත ශිෂ්‍යයෙක් හිටියා ජයරුවන් කියලා. අද වෙනකොට ඔහු විධායක ශ්‍රේණියේ රැකියාවක් කරනවා. හැබැයි ඉතින් වෙලාවක් ලැබුණ හැටියේ මාවත් බලලා යන්න එනවා. එහෙම ආපු ගොඩක් වෙලාවට ඔහු මට කිව්වෙ "අනේ සර් මගේ නෝනට මං ගැන කිසිම ගානක් නැහැ" කියලා. සමහරක්දට ඔහු කාර්යාලයට යන්න ලෑස්ති වෙලා බිරිඳගෙන් අහනවලු අද මම ලස්සනද කියලා. එහෙම වෙලාවට ඇය කියන්නෙම වෙන පිරිමි නැතුවට හොඳයි කියලලු. උපන්දිනයක් දකටවත් කේක් එකක් විශේෂ කෑමක් හදලා ඔහුව පුදුම කරවයි කියලා හිතුවත් ඇයට ඒවා ගැන වගේ වගක් නැතිලු. තෑග්ගක් දුන්නත් නිකම්ම ඒක අරගන්නවා මිසක ඒකෙ හොඳ නරකක් ගැන ආදරෙන් එක වචනයක් කතා කරන්නෙ නැහැලු. පුදුමේ කියන්නෙ නිකමටවත් ඔහු කාර්යාලේ දුරකතනයකින් කෝල් එකක් ගත්තොත් ඇයට ඔහුගේ කටහඬ පවා අඳුනගන්න බැරිවත් තියෙනවලු. පිටින් බලන කෙනෙකුට ඕවා සාමාන්‍ය දේවල් වුණාට මොකද ඕවා නිසා අන්තිමට ඔහුගේ පවුල් ජීවිතේත් නැතිවෙන තැනටම වැඩ සිද්ධ වුණා. අවසානෙදි බැරිම තැන මම ඔහුගේ බිරිඳව ගෙන්නලා කරුණු කාරණා අවබෝධ කරලා දුන්නායින් යාන්තමට දික්කසාදෙකට නොගිහින් නවත්තගත්තා. ඒ වෙලාවෙ ඔහුගේ බිරිඳ මට කිව්වේ "අනේ සර් පිරිමිත් ගෑනු අපි වගේම ඔය දේවල් මහ ලොකුවට බලාපොරොත්තු වෙනවා කියන එක ගැන මම එච්චර දුරට හිතුවේ නැහැ" කියලා.

අන්න ඒ නිසා මම 'ධරණී' කියවන අපේ කාන්තාවන්ට සහ බිරින්දෑවරුන්ට මෙහෙම දෙයක් යෝජනා කරන්න කැමතියි. ගෙදරදෙර වැඩවලට, දරුවන්ට කාලය කැප කරනවා වගේ පුළුවන් හැමවෙලාවකම සැමියා වෙනුවෙනුත් වෙලාව වෙන්කරගන්න. ඔහුගේ මහන්සිය, කැපවීම අගය කරලා ඒකට වචනෙකින් හරි වටිනාකමක් දෙන්න. මොකද මං කලින් කිව්වා වගේ පිරිමි කියන්නෙම ගොඩක් වෙලාවට හිත යටින් ඒ දේවල් බලාපොරොත්තු වෙන පිරිසක් කියලයි මගේ අදහස.

■ **ලිහිණි මධුෂිකා**


# ඒ වසර්යි

**බියංකා නානායක්කාර ලියයි**

130 කොටස

## මොනවද මනුස්සයෝ කරන්නේ. මෙහෙ මගෙ හිත ගිනි අරන්

## මේ ගෙදර සිද්ධවෙන දේවල්වල හැටියට පිට කෙනෙක් වැඩට තියාගන්න මං කැමති නෑ ලොකු දූ



ඇමති නිවසින් පිටවෙද්දී නිවා වම්පස රිය අසුනට දැමූ දුරකතනය තේනුක තෙන්නකෝන් යළි අතට ගත්තේ කැලණි විශ්වවිද්‍යාලය කිට්ටුවට එද්දීය. ඔහු අංජනාගේ දුරකතනයට ඇමතුම ගනිද්දී ඇය සිටියේ පොතක් කියවමිනි. තේනුක ගියේ තමන්ගේ අය ළඟට නිසා අංජනා ඔහු කතා කරන තුරු දුරකතන ඇමතුම ගන්නටවත් උත්සාහ කළේ නැත. නාදවන දුරකතනයේ තිරයේ ඔහුගේ නම දකිත්ම ඈ සිතේ ඇතිවූයේ උද්දාමයකි. කියවමින් සිටි පොත පපුව උඩින් තබාගත් ඇය, ඇමතුමට කතා කළාය.

**"නෝනා මොකද කරන්නේ..?"**

ඒ පොඩි කාලයට සිදුවූ දේවල් සමඟ ඔහුට හැඟුණේ ඇයව බොහෝ කලකින් නොදුටුවා සේය. ඇගේ ඇනෙක්සිය ඇති ප්‍රැන්සිස් ලේන් එකට කාරය හැරවූ තේනුකට දුරකතනය දෙස බලන්නට සිදුවූයේ කරමින් සිටි කතාවට යටින් එකදිගට තව ඇමතුමක් නාද වෙන්නට ගත් නිසාය. ඒ කතා කරන්නට උත්සාහ ගන්නේ සෙනුකාය. මේ සා විකාරයක් සිදුවූයේ ඇය නොකියා උපන්දින සාදයක් සැලසුම් කළ හේතුවෙන් නිසා තේනුක ඇයට කතා කිරීම පමා කළාය.

**"ඔයා එනකම් පොතක් කියෙව්වා..."**

අංජනා කීවේ ඇත්තමය. පොතක් කියවද්දී එය ආසාවෙන් කියවන්නේ නම් අන් කිසිවක් මතකෙට එන්නේ නැත. අංජනාට උවමනා වූයේ එවන් පැය කීපයක් ගෙවා ගන්නය.

**"පොතක් කියවද්දී ඕන දෙයක් අමතක කරන්න පුළුවන්..."**

ඇය ඇඳේ හාන්සි වී සිටි ඉරියව්ව වෙනස් කරද්දි පපුව මත තිබූ පොත පෙරළී ඇඳේ මෙට්ටය මතට වැටුණි.

**"මේ මාවත්..?"**

පුදුම වූ හඬින් ඔහු ඇසුවේය ඇගේ ඇනෙක්සිය වූ නිවෙස් ගේට්ටුව ළඟ කාරය නවතමිනි.

**"ඔව් ඉතින්... දැන් මං ටික වෙලාවකට ඔයාව අමතක කළානේ..."**

අංජනා ඇත්තම කීවාය. නැවතත් සෙනුකාගෙන් ඇමතුම ආවේය.

**"එහෙනම් හදිස්සියේ හරි මං ඔයා ළඟින් නැතිවුණොත් පොත් ටිකක් එක්ක හිතේ ගනුදෙනුව බේරගන්න පුළුවන්..."**

ඔහු කීවේ සිනාසෙමිනි. ඒ කතාවට ඇගේ හිත පත්තු වුණේය.

**"ඔය වගේ කතා කියන්න නෙවේ හිතන්නවත් එපා. එහෙම වුණොත් මේ අංජනා පොත් කියවන්න ඉන්නෙත් නෑ..."**

අංජනා ඒ ටික කියද්දී ඇස්වලට කඳුළුත් එකතුවුණාය. ඇත්තටම අංජනා ඔහු නැති ජීවිතයක් ගැන හිතන්නේවත් නැත.

ඇය තුළ වූ වෙනස ඔහුට දැනුණොත් ඒ කතාව වෙනස් කරන්නට තේනුකටම ඕනෑ වුණේය.

**"ඔය ඇඳෙන් නැගිටලා ඇඳුමත් මාරු කරගෙන පොඩ්ඩක් ගේට්ටුව ළඟට එනවද..? මං ඇවිත් ඉන්නේ... කෑමට එළියට යන්..."**

ඔහුගේ කතාව ඇත්තක්ම දැයි සැකහැර දැන ගන්නට ඇය ඇඳෙන් නැගිට බැල්කනියට දිව විත් ගේට්ටුව දෙස බැලුවේ පොඩි දැරියක වාගේය. තේනුක තෙන්නකෝන්ගේ රතු පැහැ පුංචි කාරය ගේට්ටුව ළඟ නැවතී තිබුණි. ඇයට අමුතුවෙන් ලෑස්ති වෙන්න කියා වෙහෙසෙන්නට ඕනෑ වූයේ නැත. බෑගයෙන් ටී ෂර්ටයක් සහ සායක් අතට ගත් අංජනා ඇල්ලෙපොල ඇඳ සිටි ගවුම හිසෙන් පන්නා දැමුවාය. ඒ වනවිට අවස්ථා පහක්ම තේනුක තෙන්නකෝන්ට කතා කරන්නට උත්සාහ කරමින් සෙනුකා වෙහෙස වී සිටියාය. ඇය සිතුවේම ඔහු දුරකතනය නොගන්නේ තමන් හා ඇති කරගත් අමනාපයකට කියාය. ඒ නිසා හිතේ වූයේ විස්සෝපයකි. චතුමිණී කී ලෙස මෙයාකාර මොහොතක් නිවසේ සංවිධානය නොකර අද දවස කිසිවෙකුටත් නොකියා ඔහු හා එළියට ගොස් මේ මොහොත බෙදාගත්තා නම් කියා සෙනුකාට සිතෙන්නේ දැන්ය. සියල්ලෝම රැවටිලිකාරයෝ කියා ඇයට සිතුණේ අප්පච්චී කළ වැඩයද මතක් වීය. ලංකාවෙන් යන්නට මොහොතකට හෝ පෙර සොහොයුරා හමුවී ඔහුගේ හිතේ ඇති වැරදි ආකල්පය නැති කරන්නට ඇය සිතාගත්තාය. තේනුකට ඒ තරම් වතාවක් කතා කළේද ඊට අවස්ථාවක් සලසා ගන්නටයි. තෙන්නකෝන් බණ්ඩාර හා විසෙන්තිආරච්චිගේ උස් හඬවල් සෙනුකාටද ප්‍රිය වූයේ නැත. සමහරවිට ඔවුන් මධුපානය සමඟ කතාවේ යෙදෙනවා ඇතැයි ඇය අනුමාන කළේ බොහෝ වේලාවකින් විසිත්ත කාමරයට නොගිය නිසාය. චතුමිණී හා මේනක වාසුලා හා විසෙන්තිආරච්චිගෙ බිරිඳ සමඟ කතා කරමින් හිඳින බව කීවේ මොහොතකට පෙර විසිත්ත කාමරයට ගොස් ආ සෙනෙහෙලතා මැණිකේය. ඇයට තෙන්නකෝන් බණ්ඩාර ආයෙත් කතාකරනු ඇසෙයි. සෙනෙහෙලතා මැණිකේ ඔසරිය හදමින් විසිත්ත කාමරයට යන දෙස බලා සිටි සෙනුකාගේ හිතේ ඇතිවූයේ දුකකි. අම්මාට කොතෙක් සැපට සිටින්නට පුළුවන් වුවත් දුකේ ගැලී සිටින්නේ ඇය විසින්මය. මේ දවස් කීපයට කීවතාවක් නම් ගෙදර සහ කුස්සියේ වැඩට සේවිකාවක් ගන්නට කියා ඇයට කිව්වාද කියා සෙනුකාට මතක නැති තරම්ය.

**"මේ ගෙදර සිද්ධවෙන දේවල්වල හැටියට පිට කෙනෙක් වැඩට තියාගන්න මං කැමති නෑ ලොකු දූ. ඔය ගොඩක් ගෙවල්වල දේවල් පිටට යන්නේ ඒ අයගෙන් තමයි..."**

සෙනෙහෙලතා මැණිකේ කියන්නේ ඇත්තක් කියා සෙනුකා දනියි ඒත් සෞඛ්‍ය හේතුන් මත හෝ දැන් ඇය මේ වැඩපළවලින් ඇය විරාමයක් ලබාගත යුතුය.

සෙනෙහෙලතා මැණිකේ ආයෙත් මුළුතැන්ගෙය දෙසට එනු පෙනෙයි. අන්තිම වරටත් ඇය සමඟ තවත් වතාවක් කතා කරන්නට සිතුණේ සාලයේ වූ තසිම් කීපයක් අතින් කටින් උස්සාන එන අන්දම දුටු නිසාය. ඒ නිසා ඇය ඊට වචන එක් කරද්දී එතෙක් නිහඬව තිබූ දුරකතනය නද දුන්නේය. ඇමතුම තේනුකගෙනි. ඇගේ හිතේ පරව තිබූ මල් යළි පිඹිදෙනු දැනුණි. ඒ නිසා සෙනෙහෙලතා මැණිකේ කෙරෙන් මුදවාගත් නෙතු ඇය දුරකතනයට යොමු කළාය.

**"මොනවද මනුස්සයෝ කරන්නේ. මෙහෙ මගෙ හිත ගිනි අරන්."**

ඔහුගේ කටහඬ ඇසුණ සැනින් සෙනුකා කියාගෙන ගියේ ඇත්තටම හිතේ වූ හැඟීමය.

**"ඔය ඇමති බංගලාවේ ඕනි තරම් වතුර තියෙනවා. ගිනි අරන් නම් වතුරෙන් නිවාගන්න. අනික ඉතින් ගිනි තියන වැඩ කරනකොට ගිනි ගන්නවා නේන්නම්..."**

තේනුක තෙන්නකෝන් සහෝදරිය හා කතා කළේ අමනාපයක් නැතිව වුණත් ඒ කතාව සෙනුකාගේ හිත රිදෙව්වේය.

**"මං ඔයාට නරකක් කරන්න හිතාගෙන නෙවේ ඔයාව ගෙදර ගෙන්නුවේ මල්ලි. ඒත් මට දැන් තමයි තේරෙන්නේ මාත් අහුවුණා කියලා..."**

**"ඒක තේරුණා නම් ඇති... ඔක්කොම මායම්කාරයෝ ඉන්නේ. ඔයාවත්, මමවත් දන්නෙ නැතුව අනිත් අය ප්ලෑන් කරලා. ඇයි මනුස්සයෙක් අකමැති දේවල් කරන්නේ..? මං මට ඕනි කෙනා තෝරගෙන ඉවරයි අක්කා. ඒක අප්පච්චිට තේරෙන්නෙත් නෑ චතුමිණීට තේරෙන්නෙත් නෑ. ඔය දෙන්නම දන්නවා අංජනා ගැන..."**

තේනුකගේ කතාවට සෙනුකාට පුදුම සිතුණි. තේනුකට ආදරවන්තියක් ඉන්නා බව දැන දැන චතුමිණී ඔහුගේ ආදරය දිනාගන්න හදන්නේ ඇයිදැයි ඇයටද සිතා ගන්නට නොහැකි විය.

**"මේ ඔයා ඉන්නෙ කොහෙද කියන්නකෝ. මං මේ අම්මා මෙච්චර මහන්සිවෙලා රසට හදපු කෑමත් අරන් එන්නම්..."**

සෙනුකාට මේ සමාගමෙන් මිදෙන්නටත් එක්ක එළියට බසින්නට සිතුණේය.

**"දැන් ඉන්නෙ අංජනා ඉන්න ඇනෙක්ස් එකේ ගේට්ටුව ගාව. එයා ලෑස්තිවෙලා එනකම් ඉන්නවා කෑමට යන්න..."**

තේනුකගේ ආදරේ සෙනුකාගේ පපුවටම දැනිණි. කට්ටිය කඩන්නට හදන්නේ එවන් ආදර හිත් දෙකකි.

**"මල්ලි ඔයා ගෙදර යන්න මං ගෙදරට කෑමත් අරන් එන්නම්. අම්මා පව්. ඔයා හින්දමයි මහන්සිවෙලා ඉව්වේ. ඔය ළමයත් එක්කම යන්න. පොඩි වෙලාවක් දෙන්නකෝ මං ෂේප් එකේ එන්නම්."**

සෙනුකා දුරකතන ඇමතුම අවසන් කර ටෙලිෆෝනය සාක්කුවට දගත්තේ අම්මා ආයෙත් කුස්සියෙන් පිටවන්නයට පෙර බත් පාර්සල් දෙක තුනක් බන්දවාගන්නයි. ඒත් සෙනුකාට අඩියක්වත් තියන්නට බැරිවිය.

**"කොහෙද ෂේප් එකේ යන්න හදන්නේ? තේනුක අයියා හම්බවෙන්න නේද..? බතුත් ගේන්නම් කියනවා ඇහුණා. මාත් එනවා අක්කා."**

චතුමිණීගේ කතාව සෙනුකා තෙන්නකෝන්ගේ හිතට කේන්තියක් ඇති කළේය.

ලබන සතියට

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

පුවත්පත නිවසටම ගෙන්වාගන්න අමතන්න 076 1367 623

## මූල්‍ය බැංකු ඇබෑර්තු

★ දිවයිනම ආවරණය වන පරිදි නම බැංකු කිහිපයක පුරප්පාඩු අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 40,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)

0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0742 916 140 | 0774 024 155

## උගස් තැබූ රත්තරං

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 180,000/-
076 101 88 53

SL PROMO

## දැන්වීම් සඳහා අමතන්න
# 0112672 601
# 0112 672 603

## ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට
- රට රැකියා ප්‍රමාද වීම් වලට අදම අමතන්න

ක්ෂණික ඇමතුම් -0777 444908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස - 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

## උගස් රත්තරන්

සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
පවුම - 190,000/-
077 457 3003

## උගස් රන් භාණ්ඩ

උගසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන් පවුම 195,000
077 410 78 45

SL PROMO



## ඔබ දෛවයට පිටුපායිද.. ? දෛවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

## ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද? ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?


- සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
- සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
- 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
- රැකියා ලබා ගැනීමට
- හැර ගිය අය ගෙන්වීම

පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: 071-0 314 878

මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී

උපන් දිනය / උපන් වේලාව සමඟ අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්

පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)





සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

පාඩම් අංක 77

# උගුඩු පුතාලට එහෙම වුණත් අපේ පුතාලට එහෙම වෙන්නේ නෑ



**"ඇටිකෙහෙල් කනවා තියා ඒ දිහා බලන්නවත් එපා පුතේ!"**

උගුඩු පවුලක පැංචෙක් යමක්කමක් තේරෙන ගාණට ආපුවාම උගුඩු අම්මා දෙන පළවැනි අවවාදය තමයි ඔය ඉහතින් දැක්වෙන්නේ.

ඇටිකෙහෙලේ අගුණේ හොඳටෝම දන්නේ උගුඩුවනේ. ඉතින් කෑවොත් ඒ තරම් බඩේ රුජාවක් ගේන කෑමක් තවත් නැතිය කියලා උගුඩු අම්මලා පැටවුන්ට උගන්වනවලු. ඕන් කාලයක් යද්දි කැලෑව පැත්තෙන් ඇටිකෙහෙල් ඉදිලා පුසුඹ ගහන්න ගන්නවලු. ඒ පුසුඹ ඉවසගන්නම බැරි තැන උගුඩු පැටියා උපදේසේ පැත්තක දාලා සුවඳ පාරේ ඇටිකෙහෙල හොයාගෙන යනවලු.

**"සුවඳ බැලුවට අගුණක් නෑනේ කන්නනේ එපා කිව්වේ."** උගුඩු අම්මා දීපු අවවාදේ මතක්වෙච්චි උගුඩු පැටියා ඔහොම හිතලා ඇටිකෙහෙලට හොඹුව තියලා ඉව කරලා බලනවලු. **"අපේ අප්පේ අපූරු සුවඳ.. කෑල්ලක් කෑවට වරදක් නෑනේ..."** කියලා හිතන ඔය හාදයා ඇටිකෙහෙල් පුංචිත්තක් දිව ගාලා බලනවලු. දිව ගාපු හැටියේ ඒ රහට වහවැටෙන උගුඩුවා මුළු කෙහෙල් කැනම ගිල දලාලු පස්ස බලන්නේ. හැබැයි ඉතින් උගුඩු අම්මා දීපු අවවාදෙ තක්කෙටම හරි කියලා පහුවැනිදා උදේ දෙට්ට පිලට යන්න ගියාම උන්දැට වැටගෙන්න ගන්නවලු. ඇටිකෙහෙල් ඇට උගුඩුවගේ පස්සා පැත්තේ හිර වෙනවය කියලනේ කියන්නේ. ඔහොම වුණාම උගුඩුවගේ ඇස් පවා උඩ යනවලු. කවුරුහරි බය බිරාන්ත වෙලා ඉන්දැද්දි ඇටිකෙහෙල් කාපු උගුඩුවා වගේ කියන්නේ ඒකයි.

උගුඩුවට ඇටිකෙහෙල් අගුණ වුණාට මොකෝ අපිට නම් ඔය එක කෙහෙලක්වත් අගුණ නැහැ.

**'රසේ පාකෙං මයුරං සුපක්කා
කදලි ඵලං
හිතං වාතේච පින්තේච බලයං
සංගානිකං පරං'**

ආයුර්වේදයේ කෙසෙල් ගැන කියැවෙන්නේ ඔහොමයි. රසවත් කෙසෙල් වාත පිත දෙකට වගේම කෑම ජීර්ණයට හොඳයි කියන එකයි ඔය කවියේ තේරුම. ඇත්ත. කෙසෙල්වල විටමින් A, B6, C, පොටෑසියම් වගේ පෝෂක අටෝරාශියක් තියෙනවා. අපේ ලේ ධාතුව වඩවන්න වගේම ස්නායු පද්ධතියටත් කෙසෙල් ගුණලු.

ඔච්චර වටින කෙසෙල් මුලින්ම හොයාගත්තේ ඉන්දුනීසියාවෙන්ලු. ඒක ගැන කියැවෙන ඉන්දුනීසියානු ජනප්‍රවාදයක් තියෙනවා. ඔන්න පුංචි දූපතක දෙළිකොලූ කියලා පුංචි ගෑනු ළමයෙක් හිටියලු. ඔහොම ඉන්දැද්දි දවසක් මේ ගෑනු ළමයා මුහුදු රැල්ලකට අහුවෙලා වෙනත් දූපතකට ගහන් ගියාලු. ඒ දූපතේ හිටපු දයිතා කියන කාන්තාවට දෙලිකොලූව හම්බුණා. අනේ දයිතා කොයිතරම් මහන්සි වුණත් දෙළිකොලූව බේරගන්න එයාට බැරිවෙලා. පස්සේ දයිතා ඒ පුංචි ගෑනු ළමයව ලස්සන තැනක වළදලා. ඔහොම කාලයක් යද්දි දයිතාගේ දූපතට දුර්භික්ෂයක් ඇවිල්ලා දයිතාට කෑම නැතිව ගිහින්. පස්සේ ඒක දැකපු දෙළිකොලූ එයා වළලපු තැනින් කෙසෙල් ගහක් වෙලා මතුවෙලා දයිතට කෙසෙල් ගෙඩි ලබාදුන්නලු. ඉන්දුනීසියාවේ කෙසෙල් හැදුනේ ඔහොමලු.

මුලින්ම කෙසෙල් වැවුණේ එහෙයි කිව්වට බලංගොඩ කැණීම්වලදි බලංගොඩ මානවයෝ කාපු කෙසෙල් ඇට හම්බවෙලා තියෙනවා. ඒ කියන්නේ මීට අවුරුදු 48,000කට එහා අපේ ඈයෝ කාපු කෙහෙල්. කවුරු කොහොම හොයාගත්තත් අද වෙනකොට ලෝකේ ජනප්‍රියම පලතුර කෙසෙල්.

අපේ රටේ උදවියගේ කෙසෙල්වලට තියෙන මනාපේ ගැන ආය අමුතු අටුවා ටීකා අවශ්‍ය නැහැනේ. ඒ මනාපෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් අලුත් වැඩක් ගැනයි දැන් කියන්න තනන්නේ.

ඒ කෙසෙල් පිටි හදන හැටි.

කෙසෙල් පිටි කියන්නේ ලංකාවට අලුත් වැඩක් වුණාට පිටරටවල ඕසෙට පාවිච්චි කරන දෙයක්. කෙසෙල් පිටිවලට බබාලගේ බර වැඩිවෙනවා. ඒ නිසා සමහරු බබාලට දෙන කෑමක් විදියටත් මේවා පාවිච්චි කරනවා. ඒ විතරක් නෙමේ කෙසෙල් පිටිවලින් කේක්, බිස්කට්, පාන්, කැඳ, අග්ගලා, බනිස්, රොටී ඔය ඕනම දෙයක් හදන්න පුළුවන්.

මේක අලුතින් හඳුන්වා දෙන නිෂ්පාදනයක් නිසා හොඳ ඉල්ලුමක් හදාගන්න පුළුවන්. හැබැයි ගොඩක් අය නොදන්න දෙයක් නිසා කෙසෙල් පිටිවල ප්‍රයෝජන ගැන පාරිභෝගිකයන්ව දැනුවත් කරන එක වැදගත්.














කෙසෙල් පිටි හදාගන්න හැටි දැන් බලමු. මේකට ආනමාළු, සීනි, ඇඹුල්, කෝලිකුට්ටු වගේ ඕනම කෙසෙල් ජාතියක් ගන්න පුළුවන්. කෙසෙල් ගන්නකොට කහ පාට වෙන්න ඔන්න මෙන්න තියෙන හොඳවයින් කෙසෙල් තෝරගන්න.

**පියවර 1**

මුලින්ම කෙසෙල් ලෙලි ඇරලා හෝදාගන්න.

**පියවර 2**

දැන් කෙසෙල් ටික කෑලිවලට කපලා විජලන යන්ත්‍රයක තියලා වේලලා බ්ලෙන්ඩ් කරන්න. විජලන යන්ත්‍රයක් නැතිනම් ඇලුමිනියම් තැටියක කෙසෙල් ටික තියලා දවස් දෙකක් විතර අව්වේ වේලගන්නත් පුළුවන්.

පිටිවලට යොදාගන්න කෙහෙල් වර්ගය කිලෝ එකක් හදන්න කෙහෙල් කොච්චර යනවද වගේ කාරණා ගැන බලලා තමයි කෙහෙල් පිටි මිල කරන්න ඕනේ. මේ කෙසෙල් පිටි එක මාසයක් විතර කල්තියාගන්න පුළුවන්. තවත් විස්තරවලට 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.